

# මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# 2017

# වාර්ෂික වාර්තාව

## සහ ගිණුම් වාර්තාව

වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව - සිංහල

வருடாந்த அறிக்கையுடன் கணக்கறிக்கை - சிங்களம்

**ANNUAL REPORT & STATEMENT OF ACCOUNTS - SINHALA**

# 2017

## අපගේ දැක්ම

වඩාත්ම ගෝලීයව පිළිගත් දකුණු ආසියාවෙහි දැනුම් ව්‍යවසාය වීම

## අපගේ මෙහෙවර

පහත දේවල් තුළින් දකුණු ආසියාව තුළ තාක්ෂණික සහ අදාළ ශික්ෂණයන් සඳහා ප්‍රමුඛ දැනුම් ව්‍යවසාය බවට පත් වීම:

- ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා විමසුම් මනස පෝෂණය කරන සහ දැනුම සහ කුසලතා සංවර්ධනය කරන තාක්ෂණික සහ ආශ්‍රිත ශික්ෂණයන්හි ප්‍රතිසංස්කරණාත්මක අධ්‍යාපනය සැපයීමෙන්;
- දැනුම පිළිබඳ සීමා මායිම් පුළුල් කිරීමට සහ ජාතික තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීමට ජාතිකව වැදගත් සහ ඉහළ බලපෑම් සහිත පර්යේෂණ කර ගෙන යාමෙන්;
- අන්තර්ජාතිකව ස්ථානගත වූ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලයක් ලෙස රජයට, කර්මාන්තයට සහ සමාජයට විශේෂඥ සේවා සැපයීමෙන්; සහ
- ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, තාක්ෂණික, සමාජයීය සහ ආර්ථික සංවර්ධනයට දායක වීමෙන්.



මොරටුව විශ්වවිද්‍යාලය, අද වන විට ශ්‍රී ලංකාවේ හොඳම විශ්වවිද්‍යාලවලින් එකක් ලෙස කීර්තිය ලබා ගෙන ඇත. අධ්‍යාපනය සම්බන්ධව ගත් කල, කීර්තිමත් ලෝක පූජිත විශ්වවිද්‍යාලයක ඕනෑම පශ්චාත් උපාධි වැඩසටහනක් සඳහා පසුවෙන් ඇතුළත් විය හැකි සහ අධ්‍යයන හා පරිචය යන දෙකින්ම අන්තර්ජාතිකව කීර්තිමත් උසස් විශ්වවිද්‍යාලයකින් බිහිවූ උපාධිධාරීන් මෙන් දක්ෂ ලෙස කටයුතු කළ හැකි - තාක්ෂණ ක්ෂේත්‍රවල “ඉතා උසස් උපාධිධාරීන් බිහි කිරීමට” විශ්වවිද්‍යාලය මහත් වෙහෙසක් දරයි. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ඉලක්කය වන්නේ අධ්‍යාපනික අතින් ඉතා සාර්ථක, ආත්ම විශ්වාසයෙන් යුත්, නම්‍යශීලී, උපාධිය ලැබීමෙන් පසු ඉතා ඉක්මනින් රැකියාවක නිරත විය හැකි, ජාත්‍යන්තර වශයෙන් ගුණාත්මක තත්වයේ සිටින උපාධිධාරීන් බිහි කිරීම සහ එමෙන්ම ඔවුන් උපාධි ලබන විට අපේ ශිෂ්‍යයන් හුදෙක් “රැකියා සොයන්නන්” නොව “රැකියා නිර්මාපකයන්” බවට පත්වීමට පුහුණු කිරීමයි. අපගේ බොහොමයක් නව උපාධිධාරීන්ගේ වාර්ෂික වැටුපටත් වඩා අඩු මුදලක් වන **එක් ශිෂ්‍යයෙක් සඳහා ඇමෙරිකානු ඩොලර් 9000** ක පමණ පිරිවැයකින් (පුනරාවර්තන) ඉංජිනේරු ශිල්පය, වාස්තු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණය, නිර්මාණවේදය, නගර හා ග්‍රාම නිර්මාණකරණය, පහසුකම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ ප්‍රවාහනය හා සැපයුම් කළමනාකරණය සහ ව්‍යාපාර ආදී අංශවල රැකියාවල නිරත විය හැකි, ගෝලීය වශයෙන් ඉතා උසස් ගුණාත්මක උපාධිධාරීන් මොරටුව විශ්වවිද්‍යාලය බිහි කරන බව උද්දීපනය කොට දැක්විය යුතුය.

විශ්වවිද්‍යාලය ක්‍රමෝපාය සැලසුම්කරණය සහ බොහෝ මූලාරම්භයන් ක්‍රියාවට නැංවීම මගින් ශ්‍රී ලංකාව “දැනුම් මධ්‍යස්ථානයක්” බවට පත් කිරීමට දායක වන අතරතුර අප රටේ ආර්ථික සංවර්ධනයේදී ක්‍රියාකාරී සහභාගිවන්නෙකු වීම පිණිස ඉලක්ක ගණනාවක් පිහිටුවා ඇත.

2017 වසර අවසන් වන විට, මොරටුව විශ්වවිද්‍යාලය තුළ 7906ක උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටි අතර 2017 නොවැම්බර් මාසයේදී 2016 උ.පෙ. ශිෂ්‍ය කණ්ඩායමෙන් ශිෂ්‍යයන් 1710ක කණ්ඩායමක් බඳවා ගන්නා ලදී. එය යම් දැඩි ඉඩකඩ සීමා නොසලකා සිදු කළේ මොරටුව විශ්වවිද්‍යාලය නව බඳවා ගැනීම සඳහා අධ්‍යයන වැඩසටහන් ඇරඹීම සම්බන්ධව අනෙකුත් බොහෝ විශ්වවිද්‍යාලවලට වඩා ඉදිරියෙන් සිටිමින් රැඳී සිටීමේ කාලය අඩු කර ගනිමිනි.

අපගේ උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යයන් සහ දෙමාපියන්ගේ වැඩි වන ඉල්ලුම ළඟා කර ගැනීමට පසුගිය වසර දහයක කාලය තුළ වාර්ෂිකව බඳවා ගන්නා ශිෂ්‍යයන්, සමස්තයක් ලෙස 51% කට වඩා සහ තොරතුරු තාක්ෂණ පීඨයේ බඳවා ගැනීම 200% කින් වැඩි කරමින් සිටින බව සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණකි.

පසුගිය වසර දහයක කාලය තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගිය වාර්ෂික බඳවා ගැනීම් සහ සීමිත පහසුකම් සමඟ, මොරටුව විශ්වවිද්‍යාලය එහි සියලු උපාධිධාරීන්ගේ අදාළත්වය හා ගුණාත්මකභාවය අඛණ්ඩව පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට සමත් වී ඇත.

2017 වසරේ දී, අවසන් විභාගයට පෙනී සිටි 1602 ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අතුරින් සිසුන් 1478ක් (92.25%) සිය පළමු උපාධිය හිමිකර ගැනීම සඳහා දක්වන ලද අවම කාල පරිච්ඡේදය තුළ උපාධිය හිමි කර ගත්හ. 2017 වසරේ පොදු උපාධි ප්‍රදානෝත්සවයේ දී පිරිනමන ලද මුළු උපාධි සංඛ්‍යාව පශ්චාත් උපාධි ඇතුළුව, 2130ක් වූ අතර එයින් උපාධි 1595ක් ප්‍රථම උපාධි වූ අතර 535ක් පශ්චාත් උපාධි විය. පසුගිය වසරට සාපේක්ෂව මෙය ප්‍රථම උපාධිධාරීන්ගේ 22% ක සහ පශ්චාත් උපාධිධාරීන්ගේ 71% ක වැඩි වීමකි.

2017 වසරේ සිදු කළ, උපාධිධාරීන්ගේ සේවානියුක්ති රටාව පිළිබඳ නිරීක්ෂණ සමීක්ෂණයට අනුව, මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් සම්බන්ධව කර්මාන්තය හා එහි සේවායෝජකයගේ විශාල ඉල්ලුමක් ඇති බව පෙන්නුම් කරමින්, උපාධි ප්‍රදානෝත්සව අවස්ථාව වන විට සියලු උපාධිධාරීන්ගෙන් 92.6%ක් රැකියාවල නියුක්ත වූ බව වාර්තා විය.

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ විද්‍යා ආයතනය (ITUM), දියගම පරිශ්‍රය තුළදී, 2017 අගෝස්තු මස 10වන දින, සම්මානිත පුද්ගලයන්, ශුභාශිංසනය කරන්නන්, කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් රැසකගේ ගෞරවනීය සහභාගිත්වය ඇතිව, අග්‍රාමාත්‍යතුමා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලද අතර මෙම වැඩිදියුණුව සමගින් මොරටුව විශ්වවිද්‍යාලයට සිය ඇතුළත් කර ගැනීම වැඩි කළ හැකි අතර ITUM හටද සිය වාර්ෂික වත්මන් ඇතුළත් කර ගැනීම ශිෂ්‍යයන් 350 සිට 1000 දක්වා නේවාසික පහසුකම් සමගින් වැඩි කළ හැකිය.

එහි කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සිය කාර්යසාධනය හරහා ජාතිකව සහ ලොව පුරා ක්ෂේත්‍ර රාශියකින් ලබා ගෙන ඇති පිළිගැනීම් අනුව 2017 වසරේදී ද මොරටුව විශ්ව විද්‍යාලය එහි විශිෂ්ට කාර්යසාධනය ඉදිරියට ගෙන යන ලද්දේ වසර 2017 තුළදීද ජාත්‍යන්තරකරණය පිළිබඳව විශාල අවධාරණයක් සපයන අතරතුරදීය.

පසුගිය වසර කිහිපය තුළ මොරටුව විශ්වවිද්‍යාලය අත් කරගෙන ඇති ජයග්‍රහණ රජය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගනු ඇතැයි ද විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපායික සැලැස්මේ ඉලක්ක හා අරමුණු ඉටු කර ගැනීමට හා "වඩාත්ම ගෝලීයව පිළිගත් දකුණු ආසියාවෙහි දැනුම් ව්‍යවසාය බවට පත් වීම" සඳහා වූ එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම පිණිස සහාය වනු ඇතැයි ද අවංකවම බලාපොරොත්තු වෙමි.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
උපකුලපති
මොරටුව විශ්වවිද්‍යාලය

# අන්තර්ගතය


| | | පිටුව |
|---|---|---|
| | සංස්ථාපිත ඉලක්ක | i |
| | පාලක සභාව | ii - iv |
| 1 කොටස | විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම් පිළිබඳ සමාලෝචනය | 01- 22 |
| 2 කොටස | සම්පත් සහ ශිෂ්‍යයන් | |
| | සාරාංශය (සම්පත් සහ ශිෂ්‍යයන්) | 23 |
| | විස්තර (සම්පත් සහ ශිෂ්‍යයන්) | 24 - 25 |
| 3 කොටස | දේශීය ශිෂ්‍යයන් | |
| | සාරාංශය (දේශීය ශිෂ්‍යයන්) | 26 - 27 |
| | විස්තර (දේශීය ශිෂ්‍යයන්) | 28 - 32 |
| 4 කොටස | විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 33 - 34 |
| 5 කොටස | අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 35 |
| 6 කොටස | පරිපාලන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 36 |
| 7 කොටස | අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර | 36- 37 |
| 8 කොටස | පර්යේෂණ ව්‍යාපෘති / පේටන්ට් බලපත්‍ර | |
| | සාරාංශය (පර්යේෂණ ව්‍යාපෘති / පේටන්ට් බලපත්‍ර) | 38 |
| | විස්තර (පර්යේෂණ ව්‍යාපෘති/ පේටන්ට් බලපත්‍ර) | 38 -39 |
| 9 කොටස | පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන | |
| | සාරාංශය (පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන) | 39 |
| | විස්තර (පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන) | 40 |
| 10 කොටස | වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු | 41 |
| 11 කොටස | ලැබී ඇති සම්මාන පිළිබඳ විස්තර | 42 |
| 12 කොටස | ආරම්භ කළ නව පාඨමාලා පිළිබඳ විස්තර | 42 |
| 13 කොටස | පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | 43 |
| 14 කොටස | ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර | 43 |
| 15 කොටස | ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත) | 44 |
| 16 කොටස | ව්‍යාපෘති වියදම් පිළිබඳ විස්තර (දේශීය/ විදේශීය අරමුදල් සම්පාදිත) | 45 - 46 |
| 17 කොටස | මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (වියදම්) | 47 |
| 18 කොටස | මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (උත්පාදිත ආදායම) | 47 |
| 19 කොටස | මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය | 47 |
| 20 කොටස | යටිතල පහසුකම් පිළිබඳ විස්තර | 48 |
| 21 කොටස | මූල්‍ය ගිණුම් 2017 | |
| | 21.1 31.12.2017 දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 49 |
| | 21.2 31.12.2017 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධන පිළිබඳ ප්‍රකාශය | 50 |
| | 21.3 31.12.2017 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ වත්කම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය | 51 |
| | 21.4 31.12.2017 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 52 |
| | 21.5 මූල්‍ය ප්‍රකාශවලට සටහන් 2017 | 53- 61 |
| | 21.6 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන් | 62- 65 |
| | 21.7 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට සටහන් | 66 - 68 |
| | 21.8 විගණකාධිපතිගේ වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ ප්‍රකාශය | 69 - 94 |
| | 21.9 ව්‍යවස්ථාපිත මණ්ඩලවල මූල්‍ය කාර්ය සාධනය 2017 | 95 |

## ආයතනික ඉලක්ක

- උසස් ඉගෙනුමෙහි විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස අන්තර්ජාතික පිළිගැනීම මුදුන් පමුණුවා ගැනීම

- ගෝලීය පිළිගැනීම සමග ජාතික සහ අන්තර්ජාතික අදාළකත්වය සහිතව පර්යේෂණ, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය තුළ විශිෂ්ටත්වය මුදුන් පමුණුවා ගැනීම

- ජාතික අවශ්‍යතාවලට සහ කර්මාන්තයේ සහ සමාජයේ අපේක්ෂාවලට ප්‍රතිචාර වශයෙන් අධ්‍යාපනය සපයන ප්‍රමුඛ විශ්වවිද්‍යාලයක් බවට පත් වීම

- එහි ක්‍රියාකාරකම් තුළ විශිෂ්ටත්වය මුදුන් පමුණුවා ගැනීමට විශ්වවිද්‍යාලය තුළ බුද්ධිමය සහ භෞතික පරිසරය වැඩි දියුණු කිරීම

- දිදුලන විශ්වවිද්‍යාලයක තත්ත්වය ළඟා කර ගැනීමට මනාව උගත්, කුසලතා පූර්ණ සහ තෘප්තිමත් කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය ප්‍රජාවක් බිහි කිරීම

- උසස් තාක්ෂණය සහ උපදේශන සේවා පිළිබඳ ප්‍රමුඛ විශේෂඥ සේවා සැපයුම්කරුවකු බවට පත් වීම

- ශ්‍රී ලංකාවේ සියලු අදාළ ශික්ෂණයන් සහ උසස්/වෘත්තීය අධ්‍යාපනය තුළ ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ජාතික සංවර්ධනයේ දී රජයට උපදේශකයෙකු වීම

- තත්ත්ව පාලනය සහ කාර්යක්ෂම සංස්ථාපිත පාලනය විශ්වවිද්‍යාල සංස්කෘතිය බවට පත් කිරීම

**නිල බලයෙන් සාමාජිකයන්:**

| | |
|---|---|
| උපකුලපති (සභාපති) | මහාචාර්ය.ඒ.කේ.ඩබ්ලිව් ජයවර්ධන (27.11.2017 දක්වා)<br>මහාචාර්ය කේ.කේ.සී.කේ පෙරේරා (28.11.2017 සිට) |
| නියෝජ්‍ය උපකුලපති | මහාචාර්ය ආර්.ඒ අතලගේ |
| පීඨාධිපති, වාස්තු විද්‍යා පීඨය | මහාචාර්ය එම්.එල් ද සිල්වා |
| පීඨාධිපති, ව්‍යාපාර පීඨය | මහාචාර්ය එන්.ඩී ගුණවර්ධන |
| පීඨාධිපති, ඉංජිනේරු පීඨය | මහාචාර්ය කේ.කේ.සී.කේ පෙරේරා (28.02.2018 - 26.11.2017)<br>මහාචාර්ය එන්.කේ වික්‍රමාරච්චි (27.11.2017 සිට) |
| පීඨාධිපති, තොරතුරු තාක්ෂණ පීඨය | පී.එම් කරුණාරත්න මයා |
| පීඨාධිපති, උපාධි අධ්‍යයන පීඨය | මහාචාර්ය එස්.ඒ.ඩී ඩයස් මිය |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කළ සමාජිකයන්:**

ආචාර්ය තිලක් සියඹලාපිටිය (20.04.2015 සිට)

අන්තර්ජාතික බලශක්ති උපදේශක සහ SLEMA ජර්නලයේ සංස්කාරක, ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයේ හිටපු සභාපති, ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ ආයතනයේ ආයතනික සාමාජික සහ බලශක්ති කාර්යක්ෂමතාව හා විදුලිබල උත්පාදන සැලසුම්කරණය පිළිබඳව විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ සහ ලංකා විදුලි බල මණ්ඩලයේ සේවය කර ඇත.

ඉංජිනේරු සංජීව සේනානායක (20.04.2015 සිට)

සම්පත් බැංකුව පීඑල්සී, ආසියානු හෝටල් හා ප්‍රොපර්ටීස් පීඑල්සී සහ සීමාසහිත හේමාස් ෆාමසූටිකල්ස් සමාගමේ අධ්‍යක්ෂ, සන්ටෙල්, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව අධ්‍යක්ෂවරයෙක් ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් විකල්ප අධ්‍යක්ෂවරයෙක් ලෙස ද සේවය කර ඇති අතර ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේ ශ්‍රී ලංකාව හා මාලදිවයින සඳහා වූ හිටපු නේවාසික නියෝජිත ලෙස සේවය කර ඇත.

ඉංජිනේරු වජිර කුලතිලක (20.04.2015 සිට)

සීමාසහිත NDB කැපිටල් හෝල්ඩින්ග්ස් (NCAP) ප්‍රධාන විධායක නිලධාරී, සවුත් ඒෂියන් ෆෙඩරේෂන් ඔෆ් එක්ස්චේන්ග් (SAFE) සභාපති, එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ සාමාජික (FCMA), CFA චාටර් හෝල්ඩර් සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID), සම්පත් බැංකුව සහ CKN අරමුදල් කළමනාකරණය ඇතුළු ප්‍රධාන උපායමාර්ගික ධූරවල සේවය කර ඇත.

ඇෂ්ලි ඩි වොස් මයා (20.04.2015 සිට)

ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනයේ සහ බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාඥයින්ගේ රාජකීය ආයතනයේ අධිසාමාජික, වාස්තු විද්‍යාඥයෙක්, භූදර්ශන වාස්තු විද්‍යාඥයෙක් සහ සංරක්ෂණය හා උරුම කළමනාකරණය පිළිබඳ පුහුණු වාස්තු විද්‍යාඥයෙකි, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපදේශක මණ්ඩලයේ සාමාජික සහ ශ්‍රී ලංකාවේ වනජීවී හා ස්වභාවධර්මය ආරක්ෂා කිරීමේ සංගමයේ සහ ICOMOS (ශ්‍රී ලංකා) හිටපු සභාපති.

සුරේෂ් ෂා මයා (20.04.2015 සිට)

සිලෝන් බෙවරේජ් හෝල්ඩින්ග්ස් පීඑල්සී සහ ලයන් බෲවරි (සිලෝන්) පීඑල්සී සමාගම්වල අධ්‍යක්ෂ හා ප්‍රධාන විධායක නිලධාරී, කාසන් කම්බර් බැච් පීඑල්සී හා බුකිට් ඩාරාහ් පීඑල්සී සමාගම්වල අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ හිටපු සභාපති, සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධිසාමාජිකයෙකි.

මනෝහර ද සිල්වා මයා (12.05.2015 සිට)

ජනාධිපති නීතිඥ, නීති කොමිසමෙහි සහ නීති ආධාර කොමිසමෙහි සාමාජික. නීති අධ්‍යාපන කවුන්සිලයේ හිටපු සාමාජික, මොරටුව විශ්වවිද්‍යාලයෙහි නීතිය පිළිබඳ එක් වරක බාහිර කථිකාචාර්ය.

ගීතාංජලී රූපිකා රණවක මිය (27.08.2015 සිට)

2012 වසරේ සිට ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව හා රේගු දෙපාර්තමේන්තුව පිළිබඳ සංශෝධන යෝජනා කිරීම සඳහා වූ කමිටුවේ සාමාජික, සහ වෙනත් රාජ්‍ය ආයතන කීපයකම කමිටු සාමාජික, සහ පසුගිය වසර 4 ඇතුළත WIPO සහාය ඇතිව NIPO හි ව්‍යාපෘති කීපයක්ම ක්‍රියාත්මක කරන ලදී.

ආචාර්ය වින්යා ශාන්තිදාස් ආරියරත්න (22.05.2017 සිට)

සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරයේ සභාපති, ප්‍රජා වෛද්‍යවේදය පිළිබඳව මණ්ඩල සහතිකය ලත් විශේෂඥ වෛද්‍ය, ශ්‍රී ලංකා ප්‍රජා කායික වෛද්‍යවරුන්ගේ සංගමයෙහි (CCPSL) හිටපු සභාපතිවරයකු, එක්සත් රාජධානියේ ලිවර්පූල් ස්කූල් ඔෆ් ට්‍රොපිකල් මෙඩිසින් හි බාහිර සාමාජිකයකු, එක්සත් රාජධානියේ ලීඩ්ස් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ නෆීල්ඩ් ඉන්ස්ටිට්‍යුට් හි ශිෂ්‍යත්ව ලත් සාමාජිකයකු වේ

එස් ස්වර්ණජෝති මයා (23.08.2016 සිට)

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ.

මහාචාර්ය කෙමල් ඩීන් (22.05.2017 සිට)

කැලනිය විශ්වවිද්‍යාලයේ, ශල්‍යවේදය පිළිබඳ මහාචාර්ය, ලන්ඩන්යේ ශල්‍ය වෛද්‍යවරුන්ගේ රාජකීය ආයතනයේ සාමාජික, කොලෝන් ඇන්ඩ් රෙක්ටල් සර්ජරි පිළිබඳ ඇමරිකානු සංගමයෙහි සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා ඇකඩමියෙහි සාමාජිකයකු, ඉන්දියාවේ කොලෝන් ඇන්ඩ් රෙක්ටල් සර්ජරි සංගමයෙහි සාමාජික, පාකිස්තානයේ සායනික පිළිකාවේදය පිළිබඳ සංගමයේ සාමාජිකයකු, ඉන්දියාවේ මුම්බායි හි ටාටා මෙමෝරියල් කැන්සර් ඉන්ස්ටිට්‍යුට්, ඉස්ලාම් අන්තර්ජාතික වෛද්‍ය විශ්වවිද්‍යාලය, ඉන්දියාවේ වෙල්ලෝර් හි ක්‍රිස්තියානි වෛද්‍ය විද්‍යාලය සහ මැලේසියාවේ, සෙරම්බන් හි අන්තර්ජාතික වෛද්‍ය විශ්වවිද්‍යාලයේ බාහිර මහාචාර්ය

| | |
|---|---|
| **සනාතන සභාව විසින් පත් කළ සාමාජිකයන්:** | මහාචාර්ය MS මානවඩු<br>මහාචාර්ය PGR ධර්මරත්න |
| **ලේඛකාධිකාරි (ලේකම්):** | ඒ.එල් ජවුෆර් සදික් මයා – (09.03.2017 දක්වා – සප්ත වාර්ෂික නිවාඩු)<br>ඩී.එල්.ඩී ජයන්ත මයා – (10.03.2017 – 20.11.2017) |
| **මූල්‍යාධිකාරි (ආරාධනය මත):** | කේ.ඩී පුෂ්පකීර්ති මයා |

1960 දී කටුබැද්දේ පිහිටුවන ලද ප්‍රායෝගික තාක්ෂණ ආයතනයට සහ 1966 දී පිහිටුවන ලද ලංකා තාක්ෂණ විද්‍යාලයට පසුව පිහිටුවන ලද මොරටුව විශ්වවිද්‍යාලය (UOM) 1972 පෙබරවාරි මස 15වන දින කටුබැද්ද මණ්ඩපයේ දී කටයුතු ආරම්භ කරන ලදී. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කටුබැද්ද මණ්ඩපය එහි වර්තමාන සංස්ථාගත නම වන "මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව" යන්න සහිතව ස්වාධීන විශ්වවිද්‍යාලයක තත්ත්වය හිමි කර ගන්නා ලදී. 2017 වසර අවසාන වන විට, මොරටුව විශ්වවිද්‍යාලය වාස්තුවිද්‍යා, ඉංජිනේරු,තොරතුරු තාක්ෂණ ,උපාධි අධ්‍යයන සහ ව්‍යාපාර යන පීඨ පහකින් යුක්ත විය. ව්‍යාපාර පීඨය 2017 ජනවාරි මස ස්ථාපිත කරන ලදී. 2017 වසර අවසානයේදී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් තෝරා ගත් සිසුන් සඳහා ප්‍රථම උපාධි පාඨමාලා දොළහක් (12) පිරිනමන අධ්‍යයන අධ්‍යයනාංශ විසි දෙකක් (22) (1 වගුව බලන්න) විශ්වවිද්‍යාලය සතුවිය. පිරිවැය අයකර ගැනීමේ පදනමක මත මෙම අධ්‍යයනාංශ 22 පශ්චාත් උපාධි පාඨමාලා පනස් දෙකකට (52) අධික සංඛ්‍යාවක් පවත්වා ගෙන යයි. ඉන් 2017 වසරේදී වැඩසටහන් 46 ක් පවත්වා ඇති අතර නව පශ්චාත් උපාධි වැඩසටහන් කිහිපයක් ඇතුළුව වැඩසටහන් 29 ක් සඳහා නව ඇතුළත් කර ගැනීම් ලබා ගෙන ඇත. වර්තමානයේ මොරටුව විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ හොඳම විශ්වවිද්‍යාල අතරින් එකක් ලෙස කීර්තිය දිනා ඇත. මොරටුව විශ්වවිද්‍යාලය, අද වන විට ශ්‍රී ලංකාවේ **හොඳම විශ්වවිද්‍යාලවලින් එකක්** ලෙස කීර්තිය ලබා ගෙන ඇත. අධ්‍යාපනය සම්බන්ධව ගත් කල, කීර්තිමත් ලෝක පූජිත විශ්වවිද්‍යාලයක ඕනෑම පශ්චාත් උපාධි වැඩසටහනක් සඳහා පසුවෙන් ඇතුළත් විය හැකි සහ අධ්‍යයන හා පරිචය යන දෙකින්ම අන්තර්ජාතිකව කීර්තිමත් උසස් විශ්වවිද්‍යාලයකින් බිහිවූ උපාධිධාරීන් මෙන් දක්ෂ ලෙස කටයුතු කළ හැකි - තාක්ෂණ ක්ෂේත්‍රවල "ඉතා උසස් උපාධිධාරීන් බිහි කිරීමට" විශ්වවිද්‍යාලය මහත් වෙහෙසක් දරයි. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ඉලක්කය වන්නේ අධ්‍යාපනික අතින් ඉතා සාර්ථක, ආත්ම විශ්වාසයෙන් යුත්, නම්‍යශීලී, උපාධිය ලැබීමෙන් පසු ඉතා ඉක්මනින් රැකියාවක නිරත විය හැකි, ජාත්‍යන්තර වශයෙන් ගුණාත්මක තත්වයේ සිටින උපාධිධාරීන් බිහි කිරීම සහ එමෙන්ම ඔවුන් උපාධි ලබන විට අපේ ශිෂ්‍යයන් හුදෙක් "රැකියා සොයන්නන්" නොව "රැකියා නිර්මාපකයන්" බවට පත්වීමට පුහුණු කිරීමයි. අපගේ බොහොමයක් නව උපාධිධාරීන්ගේ වාර්ෂික වැටුපටත් වඩා අඩු මුදලක් වන **එක් ශිෂ්‍යයෙක් සඳහ ඇමෙරිකානු ඩොලර් 9000 ක පමණ පිරිවැයකින්** (පුනරාවර්තන) ඉංජිනේරු ශිල්පය, වාස්තු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණය, සැලසුම්කරණය, නගර හා ග්‍රාම නිර්මාණකරණය, පහසුකම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ ප්‍රවාහනය හා පහසුකම් කළමනාකරණය ආදී අංශවල රැකියාවල නිරත විය හැකි, ගෝලීය වශයෙන් ඉතා උසස් ගුණාත්මක උපාධිධාරීන් මොරටුව විශ්වවිද්‍යාලය බිහි කරන බව උද්දීපනය කොට දැක්විය යුතුය.

1 වගුව- මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයනාංශ

| වාස්තු විද්‍යා පීඨය |
|---|
| වාස්තු විද්‍යා අධ්‍යයනාංශය |
| නගර හා ග්‍රාම නිර්මාණ අධ්‍යයනාංශය |
| ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය |
| සමෝධානිත නිර්මාණ අධ්‍යයනාංශය |
| ව්‍යාපාර පීඨය |
| තීරණ විද්‍යා අධ්‍යයනාංශය |
| කර්මාන්ත කළමනාකරණ අධ්‍යයනාංශය |
| තාක්ෂණ කළමනාකරණ අධ්‍යයනාංශය |
| ඉංජිනේරු පීඨය |
| රසායන විද්‍යා හා ක්‍රියාවලි ඉංජිනේරු අධ්‍යයනාංශය |
| සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය |
| පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශය |
| භූ සම්පත් ඉංජිනේරු අධ්‍යයනාංශය |
| විදුලි ඉංජිනේරු අධ්‍යයනාංශය |
| විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය |
| භාෂා අධ්‍යයනාංශය |
| ද්‍රව්‍ය විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශය |
| කාර්මික ඉංජිනේරු අධ්‍යයනාංශය |
| ගණිත අධ්‍යයනාංශය |
| පේෂකර්ම සහ රෙදිපිළි තාක්ෂණ අධ්‍යයනාංශය |
| ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණ අධ්‍යයනාංශය |
| තොරතුරු තාක්ෂණ පීඨය |
| තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය |
| පරිගණකමය ගණිත අධ්‍යයනාංශය |
| අන්තර් ක්ෂේත්‍ර අධ්‍යයන අධ්‍යයනාංශය |
| උපාධි අධ්‍යයන පීඨය |

විශ්වවිද්‍යාලය ක්‍රමෝපාය සැලසුම්කරණය සහ බොහෝ මූලාරම්භයන් ක්‍රියාවට නැංවීම මගින් ශ්‍රී ලංකාව "දැනුම් මධ්‍යස්ථානයක්" බවට පත් කිරීමට දායක වන අතරතුර අප රටේ ආර්ථික සංවර්ධනයේදී ක්‍රියාකාරී සහභාගිවන්නෙකු වීම පිණිස ඉලක්ක කීපයක් පිහිටුවා ඇත.

මෙම පසුබිම සමඟ, මෙම සමාලෝචනය පළමුව මොරටුව විශ්වවිද්‍යාලයෙහි උසස් අධ්‍යාපනය සඳහා වැඩි වූ ප්‍රවේශය සහ 2017 වසර තුළ විශ්වවිද්‍යාලයේ ජයග්‍රහණ සහ පිළිගැනීම් දෙස බලයි. ඉන් අනතුරුව එය ක්‍රමෝපාය සැලසුම්කරණ අංශ, ප්‍රාග්ධන ආයෝජන, නවෝත්පාදනීය සහ ව්‍යවසායක උපාධිධාරීන් බිහි කිරීම, විශ්වවිද්‍යාල-කර්මාන්ත අන්තර්ක්‍රියා, තත්ත්ව ආරක්ෂණය සහ පර්යේෂණ පැතිකඩ සහ ජාත්‍යන්තරකරණය වැඩිදියුණු කිරීමේ අපේ ප්‍රයත්න දෙස බලයි. විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපාය සංවර්ධනයට බාධාවක් වන සංරෝධක පිළිබඳ කෙටි ප්‍රකාශයක් සමඟ සමාලෝචනය අවසන් වනු ඇත.

## 1.1 විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශ වීම ඉහල නැංවීම

2000 වසරේ දී, මොරටුව විශ්වවිද්‍යාලය පෙරදී ඉංජිනේරු පීඨයේ කොටසක් වූ ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (NDT) වැඩසටහන විශ්වවිද්‍යාලයෙන් වෙන්ව පිරිනැමීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනය (ITUM) පිහිටුවන ලදී එම කාලයේ දී විශ්වවිද්‍යාලය තුළ ඉංජිනේරු සහ වාස්තු විද්‍යා ලෙස පීඨ දෙකක් තිබූ අතර උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 2300 ක් විය. ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) සඳහා ශිෂ්‍යයන් 1050 ක් සහභාගී වූහ. ඉංජිනේරු පීඨය මගින් විෂය ක්ෂේත්‍ර නවයක් සම්බන්ධව එක් ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් පිරිනැමූ අතර වාස්තු විද්‍යා පීඨය මගින් නිර්මිත පරිසරය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලෙස උපාධි දෙක පිරිනැමීය.

2017 වසර අවසානය වන විට, මොරටුව විශ්වවිද්‍යාලය තුළ 7906 ක් වූ ශිෂ්‍ය ප්‍රජාවක් සිටි අතර එම පරිශ්‍රයෙහිම ITUM සහ NDTහි ශිෂ්‍ය ප්‍රජාව 1050 ක් විය. ඉංජිනේරු පීඨය මගින් ඉංජිනේරු විද්‍යාවේදී උපාධිය (විශේෂ ශික්ෂණ දහයක්), ප්‍රවාහන හා කාර්ය සම්පාදන කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ මෝස්තර නිර්මාණය හා නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලෙස උපාධි වර්ග තුන පිරිනැමීය.

වාස්තු විද්‍යා පීඨය මගින් වාස්තු විද්‍යා පිළිබඳ විද්‍යාවේදී, සැලසුම්කරණය පිළිබඳ විද්‍යාවේදී, ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී, පහසුකම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී, නගර හා ග්‍රාම සැලසුම්කරණය පිළිබඳ විද්‍යාවේදී සහ භූ දර්ශන වාස්තු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී යන විද්‍යාවේදී උපාධි වැඩසටහන් හය පිරිනැමීය. තොරතුරු තාක්ෂණ පීඨය මගින් තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය යන උපාධි වැඩසටහන් දෙක පිරිනැමීය. 2017 වර්ෂයේ සිට ව්‍යාපාර පීඨය මගින් ව්‍යාපාර විශ්ලේෂණය, ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය සහ මූල්‍ය විශ්ලේෂණය යන විශේෂිත ක්ෂේත්‍ර තුන සමග ව්‍යාපාරවේදී උපාධි වැඩසටහන පිරිනමයි. මෙම සියලු වැඩසටහන් වසර 4ක ගෞරව උපාධි වැඩසටහන්ය. මෙයට අමතරව, තොරතුරු තාක්ෂණ පීඨය මගින් හවුල්කාර ආයතනවල සහාය ද ඇතිව බාහිරව සපයන්නා වූ වැඩසටහනක් ලෙස තොරතුරු තාක්ෂණවේදී උපාධි වැඩසටහන (BIT) පිරිනැමීය.

**1 රූප සටහන – පසුගිය වසර දහය තුළ පීඨවලට වාර්ෂික ශිෂ්‍ය බඳවා ගැනීම්**




නව බඳවා ගැනීම සඳහා අධ්‍යයන වැඩසටහන් ඇරඹීම සම්බන්ධව අනෙකුත් බොහෝ විශ්වවිද්‍යාලවලට වඩා ඉදිරියෙන් සිටිමින් දැඩි ඉඩකඩ සීමා නොසලකා ඇතැම් පොරොත්තු කාල අල්ලා ගනිමින් මොරටුව විශ්වවිද්‍යාලය මගින් 2017 ඔක්තෝබර් මාසයේදී 2016 උ.පෙ. ශිෂ්‍ය කණ්ඩායමෙන් ශිෂ්‍යයන් 1710 ක කණ්ඩායමක් බඳවා ගන්නා ලදී. මෙම ප්‍රමාද වූ බඳවා ගැනීම ජාතික විශ්වවිද්‍යාල පද්ධතියට තර්ජනයක් වන

අතර ප්‍රමාදයන් පිරිමසා ගැනීමට 2017 උසස් පෙළ ඇතුළත් කර ගැනීම 2018 අගෝස්තු/සැප්තැම්බර් වකවානුවේ සිදු කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව හා එක්ව කටයුතු සූදානම් කරමින් සිටී.

අපගේ උපාධි වැඩසටහන් සඳහා ශිෂ්‍යයන් සහ දෙමාපියන්ගේ වැඩි වන ඉල්ලුම සපුරා ගැනීමට විශ්වවිද්‍යාලය මගින් පසුගිය වසර දහයක කාලය තුළ වාර්ෂිකව බඳවා ගන්නා ශිෂ්‍යයන්, සමස්තයක් ලෙස 51% කට වඩා වැඩි ප්‍රමාණයකින් සහ තොරතුරු තාක්ෂණ පීඨයේ බඳවා ගැනීම 200% කින් වැඩි කරමින් සිටින බව අවධාරණය කළ යුතුය. ඇතුළත් කර ගැනීම් දහය පුරා උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සැලකිල්ලට ගනිමින් පීඨ තුනට ශිෂ්‍ය ඇතුළත් කර ගැනීම් රටා 1 රූප සටහන මගින් පෙන්නුම් කරයි. Z ලකුණ පිළිබඳ ගැටලුව හේතු කොට ගෙන ශිෂ්‍යයන්ට සිදු වූ අසාධාරණය සමථයකට පත් කිරීමක් ලෙස දුන් අධිකරණ තීන්දුව හේතුවෙන් විශ්වවිද්‍යාලයට ඉමහත් දුෂ්කරතා මැද අතිරේක ශිෂ්‍යයන්ට පහසුකම් සැලසීමට සිදුවූ 2011/2012 අධ්‍යයන වර්ෂය විශේෂ වර්ෂයක් විය.

මොරටුව විශ්වවිද්‍යාලය විවෘත හා දුරස්ථ අධ්‍යයන ක්‍රමයේ (ODL) සිය පළමු බාහිර උපාධි පාඨමාලාව වන තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධි පාඨමාලාව (BIT) 2006 වසරේ දී ආරම්භ කරන ලදී. මොරටුව විශ්වවිද්‍යාලය සඳහා වූ ප්‍රධාන සැලැස්ම මගින් මෙම විවෘත හා දුරස්ථ අධ්‍යයන ක්‍රමය උසස් පෙළ සුදුසුකම් ලත්, විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවල සිසුන් විශාල සංඛ්‍යාවකට විශ්වවිද්‍යාලය මගින් පිරි නමන උසස් ගුණාත්මක අධ්‍යාපනයට ප්‍රවේශ වීමට ඇති හැකියාව කැපී පෙනෙන ලෙස ඉහළ දමන්නා වූ ක්‍රමයක් ලෙස හඳුනා ගනී. විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ (CODL) කටයුතු හා පාලනය පිළිබඳ ගුණාත්මක දියුණුවක් අපේක්ෂාවෙන් 2012 වසරේ සැප්තැම්බර්වල විසි එක්වන ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපන ව්‍යාපෘතිය (HETC) යටතේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලද රු. මිලියන 20ක ප්‍රදානයත් සමඟ විවෘත හා දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ ක්‍රියාකාරකම් පුළුල් කරමින් ඇත. මෙම ප්‍රදානය යටතේ ලද අරමුදල් වැඩි වශයෙන් 2014 - 2017 වසරවලදී වැය කරන ලදී. මෙම තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධි (BIT) වැඩසටහන ප්‍රධාන වශයෙන් පිළිගත් හවුල්කාර සංවිධාන හරහා ලබා දෙන අතර එය ගුණත්වය සහතික කර ශිෂ්‍ය සංඛ්‍යා පාලනය කරන නිසා මෙම මොඩලය වෙනත් බොහෝ විශ්වවිද්‍යාල මගින් පිරිනමන බාහිර උපාධිවලට වඩා වෙනස් වේ. 2017 වසරේදී මෙම වැඩසටහන සඳහා බඳවා ගැනීම 415ක් වූ අතර 2017 වසර අවසානය වන විට මෙම වැඩසටහන හදාරන ලියාපදිංචි ශිෂ්‍යයක් 600ක් විය.

### 1.2 ජයග්‍රහණ සහ සම්මාන

පසුගිය වසර දහයක කාලය තුළ සැලකිය යුතු ලෙස ඉහළ ගිය වාර්ෂික බඳවා ගැනීම් නොසලකා සහ සීමිත පහසුකම් සමගින් මොරටුව විශ්වවිද්‍යාලය මගින් එහි සියලු උපාධිධාරීන්ගේ අදාළත්වය හා ගුණාත්මකභාවය අඛණ්ඩව පවත්වා ගැනීමට සහ වැඩිදියුණු කිරීමට සමත්වී ඇත. 2017 වසරේ සිදු කළ උපාධිධාරීන්ගේ සේවානියුක්ති රටාව පිළිබඳ නිරීක්ෂණ සමීක්ෂණයට අනුව මොරටුව විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන් සම්බන්ධව කර්මාන්තය හා එහි සේවායෝජකයන් අතර විශාල ඉල්ලුමක් ඇති බව පෙන්නුම් කරමින්, උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ දී සියලු උපාධිධාරීන්ගෙන් 92.6%ක් ද ඉංජිනේරු උපාධිධාරීන්ගෙන් 96.6%ක් ද, ප්‍රමාණ සමීක්ෂණ උපාධිධාරීන්ගෙන් 97.5%ක් ද, නගර හා ග්‍රාම සැලසුම් උපාධිධාරීන්ගෙන් 96.2%ක් ද රැකියාවල නියුක්ත වූ බව වාර්තා විය. 2 රූප සටහන මොරටුව විශ්වවිද්‍යාලය මගින් පවත් වනු ලැබූ එක් එක් ප්‍රථම උපාධි වැඩසටහන්වල සේවානියුක්ති භාවය පිළිබඳ අනුපාත පෙන්නුම් කරයි.

**2 රූප සටහන – විවිධ පාඨමාලාවල සේවානියුක්ති භාවය 2017**



2017 වසරේ දී අවසන් විභාගයට පෙනී සිටි, 1602ක් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අතුරින් සිසුන් 1478ක් (92.25% ක්) ප්‍රථම උපාධිය හිමි කර ගැනීම සඳහා වන අවම කාල පරිච්ඡේදය තුළ උපාධිය හිමි කර ගත්හ. 2017 වසරේ පොදු උපාධි ප්‍රදානෝත්සවයේ දී පිරිනමන ලද පශ්චාත් උපාධි ඇතුළුව, මුළු උපාධි සංඛ්‍යාව 2130ක් වූ අතර එයින් උපාධි 1595ක් ප්‍රථම උපාධි සහ 535ක් පශ්චාත් උපාධි විය. මෙය පෙර වසර සමග සසඳන කල ප්‍රථම උපාධිවල 22%ක සහ පශ්චාත් උපාධිවල 71%ක වැඩි වීමකි.

ව්‍යාපාර පීඨයේ පළමු ඇතුලත් කිරීම සඳහා වූ සමාරම්භක උත්සවය 2017 සැප්තැම්බර් මාසයේදී පැවැත්විණි. කළමණාකරණ පිලිබඳ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහ උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, ව්‍යාපාර පීඨයේ පීඨාධිපති, වෙනත් පීඨවල පීඨාධිපතිවරුන්, අධ්‍යයන කාර්ය මණ්ඩලය, අනධ්‍යයන කාර්ය මණ්ඩලය, 2017 කණ්ඩායම සහ දෙමාපියන් යන අයද මෙම අවස්ථාවට සහභාගී වූහ. ව්‍යාපාර පීඨය මගින් ව්‍යාපාර විශ්ලේෂණය, ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය සහ මූල්‍ය විශ්ලේෂණය පිලිබඳ ව්‍යාපාර විද්‍යාවේදී උපාධිය පිරිනමයි.

2017 වසරේදී මොරටුව විශ්වවිද්‍යාලය එහි කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් සිය කාර්යසාධනය හරහා ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ක්ෂේත්‍ර රාශියකින් ලබා ගෙන ඇති සම්මාන අනුව එහි විශිෂ්ට කාර්ය සාධනය ඉදිරියට ගෙන යන ලද අතර සමහර කැපී පෙනෙන ඒවා සමහරක් පහත දක්වා ඇත.

**ජාත්‍යන්තර සම්මාන:**

- මහාචාර්ය ආර්.ඒ.ආර්.සී.ගෝපුරට "A Prosthetic Hand with Self-Adaptive Fingers" මාතෘකාව යටතේ වූ ඔහුගේ පත්‍රය සඳහා 2017 ජපානයේ නාගෝයා තාක්ෂණ ආයතනයෙහි පවත්වන ලද පාලන ස්වයංක්‍රීයකරණය හා රොබෝ විද්‍යාව පිළිබඳ IEEE ජාත්‍යන්තර සමුළුවේ (ICCAR 2017) දී යාන්ත්‍රික පාලන හා ස්වයංක්‍රියකරණ සැසියෙහි හොඳම ඉදිරිපත් කිරීමේ සහතිකය පිරිනමනු ලැබීය.



- චීනයේ වුහාන්හි පැවති බහුමාධ්‍ය සහ රූප සැකසුම් පිළිබඳ දෙවන IEEE ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශයේ කණ්ඩායමක් හොඳම පත්‍රිකා සම්මානය දිනා ගනු ලැබීය. මෙම පත්‍රිකාව ධාන්‍ය සහ තේ වර්ග කිරීම සඳහා දෘෂ්‍ය වර්ගීකරණ යන්ත්‍රයක් පිළිබඳය. ක්‍රමය විවිධාකාර වර්ණ හා ප්‍රමාණ සඳහා ධාන්‍ය වර්ග සහ කළු තේ වර්ග කිරීමට නියුරල් නෙට්වර්ක් සිට නායිව් බේස් වෙත වර්ගීකරණ ක්‍රම මාලාවක් යොදා ගනී.




- ප්‍රවාහන හා සැපයුම් කළමනාකරණ අධ්‍යයනාංශයේ ශිෂ්‍යයෙක් IIT මැඩ්රාස් සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය, IIT දිල්ලි සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය සහ IIT දිල්ලි හි UK නිව් කාසල් විශ්වවිද්‍යාලය විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලද "Air Quality Management (ICAQM 2017)" පිළිබඳ දෙවන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයෙහි හොඳම පත්‍ර සම්මාන ප්‍රභේදයෙන් දෙවන ස්ථානය දිනා ගත්තේය.





- 2017 ජූලි 31 සිට අගෝස්තු 6 දක්වා බල්ගේරියාවේ, බලගොව්ග්රැඩ් හිදී විශ්වවිද්‍යාල සිසුන් සඳහා පැවති 24 වන ජාත්‍යන්තර ගණිත තරඟයෙන් විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශයේ ශිෂ්‍යයෙක් Honorable Mention තත්වය දිනා ගනු ලැබීය. එම තරඟයෙන්ම පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශයේ ශිෂ්‍යයෙක් සහ විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශයේ ශිෂ්‍යයෙක් තෙවන ස්ථානය දිනා ගනු ලැබීය.

- 2017 අගෝස්තු 28 සිට 2018 පෙබරවාරි 27 වන දින දක්වා මාස 6 ක කාලයක් සඳහා වොලොන්ගොන් විශ්වවිද්‍යාලයේදී පර්යේෂණ කටයුතු කරගෙන යාම සඳහා ඕස්ට්‍රේලියානු රජය විසින් උත්සහ දැරීමේ අධිශිෂ්‍යත්වය ආචාර්ය උදේනි නවගමුවට පිරිනැමිණ. ඔහුගේ පර්යේෂණය භූ තාක්ෂණික ඉංජිනේරු ක්ෂේත්‍රය පිළිබඳවය.

- මොරටුව විශ්වවිද්‍යාලය 2017 IEEE SMC Brain Computer Interface Hackathon හිදී "$1000 Open BCI Award" දිනා ගන්නා ලදී. මොරටුව විශ්වවිද්‍යාලයේ කණ්ඩායමක් 2017 ඔක්තෝබර් 7 සහ 8 යන දිනවල කැනඩාවේ බන්ෆ් හිදී පැවති ප්‍රමුඛ IEEE SMC International Brain Computer Interface Hackathon දී "$1000 Open BCI Award" දිනා ගත්හ. තරඟය ජාත්‍යන්තර IEEE SMC 2017 සම්මන්ත්‍රණය සමග සම්බන්ධව IEEE System Man සහ Cybernetics Society විසින් සංවිධානය කර ඇති අතර ලොව වටා කණ්ඩායම් 20කට වඩා තරඟයට සහභාගි විය.

- මොරටුව විශ්වවිද්‍යාලයේ විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශයේ ශිෂ්‍යයෙක් 2017 ඔක්තෝබර් 18 සිට 21 දින දක්වා දකුණු කොරියාවේ ජේජු හි පැවති පාලන, ස්වයංක්‍රියකරණ හා පද්ධති පිළිබඳ 17 වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයෙහිදී "Student Best Paper Award" දිනා ගනු ලැබීය. ඔහුගේ පර්යේෂණය නවීන වේගවත් තත්ව විචලා ව්‍යාප්තියක් සහ වැඩි දියුණු කරන ලද චලන මොඩියුලයක් යෝජනා කිරීම මගින් ජීපීඑස් සඳහා ත්‍රිමාන පෝස් හඹා යාමේ ගැටළුව අමතයි.




- විදුලි හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශයේ සහ රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු අධ්‍යයනාංශයේ පශ්චාත් උපාධි ශිෂ්‍යයෙක් සහ උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් තිදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් ඔවුන්ගේ ප්‍රදර්ශිතය "Life Saving Drone" සඳහා ඉන්දියාවේ හයිද්‍රාබාද් ඉංජිනේරු වාඩමන් විද්‍යාලයේ පැවති IEEE Maker Fair 2017 හි පළමු ස්ථානය දිනා ගත්හ. ඉන්දියාව, නේපාලය සහ මැලේසියාව ඇතුළු රටවල් 10 ක කණ්ඩායම් 100 කට වැඩි ප්‍රමාණයක් මේ තරගයට සහභාගි වූහ.





- පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශයේ මහාචාර්ය ගිහාන් ඩයස් 2017 සැප්තැම්බර් 13 පැවති SEARCC/NITC Conference 2017 හිදී ආසියා පැසිෆික් කලාපයේ ජාතික තොරතුරු තාක්ෂණ වෘත්තීය සමිති සංසදයක් වන අග්නිදිග ආසියාවේ ප්‍රාදේශීය පරිගණක සම්මේලනය (SEARCC) මගින් 2017 SEARCC ICT Professional of the Year Award පිරිනමණ ලදී. මහාචාර්ය ඩයස් ශ්‍රී ලංකාවේ පරිගණක සංගමය මගින් සම්මානය සඳහා නම් කරන ලදී.

ජාතික සම්මාන:

- මහාචාර්ය ජීඑල් ධර්මසිරි වික්‍රමසිංහ මහතාට 2017 නොවැම්බර් 6 දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහභාගිත්වයෙන් පැවති උත්සවයකදී විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මානය ප්‍රදානය කරන ලදී.

- විදුලි ඉංජිනේරු අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ලිදුල විදානගම ආරච්චිගේ සමකාලීනයන් විසින් ඇගයූ බැවින් උසස් ඝනයේ විද්‍යාත්මක පර්යේෂණය සඳහා විද්‍යාත්මක ප්‍රකාශනය සඳහා ජනාධිපති සම්මානය ලබා ගත් අතර 2014 දී ප්‍රකාශනය කරන ලදී.

- TWAS – The World Academy of Science විසින් ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනමේ නිර්දේශය යටතේ Young Scientist Award-2017 මහාචාර්ය රංගික උමේෂ් හල්වතුරට පිරිනමන ලදී. මෙම සම්මානයේ ප්‍රධාන අරමුණ අන්තර්ජාතිකව පිළිගත් ජර්නලවල ප්‍රකාශිත විද්‍යාත්මක පර්යේෂණ පත්‍රිකාවල සංඛ්‍යාව හා බලපෑම අනුව මනිනු ලබන විද්‍යාත්මක ප්‍රගතිය සඳහා විශිෂ්ට දායකත්වයක් සපයන සංවර්ධනය වෙමින් පවතින රටවල්වල සිටින එක් එක් විද්‍යාඥයන් හඳුනාගෙන සහාය වීමය.





- සමෝධානිත නිර්මාණ අධ්‍යයනාංශයේ වාස්තු විද්‍යාඥ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සාගර ජයසිංහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනය (SLIA) විසින් වාස්තු විද්‍යා පර්යේෂණ හා ප්‍රකාශන ක්ෂේත්‍රයට ඔහු දැක්වූ දායකත්වය හඳුනා ගනිමින් වාර්ෂික වාස්තු විද්‍යා පර්යේෂණ රන් සම්මාන 2017න් පිදුම් ලැබුවේය.




- මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ආනන්ද ජයවර්ධන මහතා 2017 ජූලි මස 13 වැනි දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේ දී ලෝක අධ්‍යාපන කොන්ග්‍රසය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා නායකත්ව විශිෂ්ඨත්ව සම්මාන 2017දී අධ්‍යාපන නායකත්ව සම්මානයෙන් පිදුම් ලැබීය.

- රටට සහ එහි උන්නතියට විශිෂ්ට සේවයක් කළ විශිෂ්ට පුද්ගලයින්ට ජාතික උපහාරය පිරිනැමීමේ පදවි ප්‍රාප්ති උත්සවය මාර්තු 20 වන දින නෙළුම් පොකුණ රඟහලේදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මොරටුව විශ්වවිද්‍යාලයේ හිටපු උප කුලපති මහාචාර්ය විලී මෙන්ඩිස් මහතා

සහ වාස්තු විද්‍යා පීඨයේ හිටපු පීඨාධිපති මහාචාර්ය නිමල් ද සිල්වා මහතා ගෞරව පදවි ලබන පුද්ගලයින් 89 අතර වේ.




- මොරටුව විශ්වවිද්‍යාලය එල්ස්වියර් පර්යේෂණ සමුළුව විසින් විශිෂ්ටතම පර්යේෂණ ප්‍රතිඵල (2011-2016) සඳහා ශ්‍රී ලංකාවේ ඵලදායීතම විශ්වවිද්‍යාලය ලෙස තෝරා ගෙන තිබේ.




- 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA ශ්‍රී ලංකා) රාජ්‍ය අංශයේ කොටසක් වන ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය (APFASL) විසින් පවත්වන ලද තරගයේ හොඳම වාර්ෂික වාර්තා හා ගිණුම් සඳහා මොරටුව විශ්වවිද්‍යාලය සමාරම්භක සම්මානය දිනා ගත්හ. මුදල් අමාත්‍යාංශයේ සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව වාර්ෂික වාර්තා සහ ගිණුම්වල තොරතුරු ඉදිරිපත් කිරීමෙහි විශිෂ්ටත්වය දිරිගැන්වීම පිණිස අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, පළාත් පාලන ආයතන සහ විදේශ ව්‍යාපෘති සඳහා තරඟය සංවිධානය කර තිබේ. හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සඳහා වූ ඇගයුම් නිර්ණායකය වන්නේ පාර්ශ්වකරුවන්ට වඩාත් හොඳ ඉදිරිපත් කිරීම හා හුවමාරු කිරීම, පොදු පිළිගත් ජාත්‍යන්තර හොඳ පරිචයන් ඇතුලත්ව ව්‍යවස්ථාපිත හා අනෙකුත් නියාමන රාමුවල අවශ්‍යතාවයන්ට අනුකූලවීම, භාණ්ඩාගාර උපදෙස් හා චක්‍රලේඛ සමඟ අනුකූල වීම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති සමග අනුකූල වීම, උපචිත ගණනය කිරීම් කරා ලඟාවීම සඳහා මූල්‍ය ප්‍රතිසංස්කරණවලට අදාළව සිදු කරනු ලබන ප්‍රයත්න, ආයතන වඩා හොඳින් අවබෝධ කර ගැනීමට දැක්ම, මෙහෙවර, අරමුණු සහ ඉලක්ක හෙළිදරව් කිරීම, කාර්යසාධනය සහ සාකච්ඡා පිළිබඳ පරිපූර්ණ සමාලෝචනය සහ සමාලෝචනයට ලක්වන කාල පරිච්ඡේදය තුළ සංවිධානයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක විශ්ලේෂණය කිරීමය.






- ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයට අනුයුක්ත කථිකාචාර්ය හර්ෂිනි මල්ලවාරච්චි මෙනවිය ශ්‍රී ලංකා තරුණ විද්‍යාඥයන්ගේ ඇකඩමිය (SLAYS) සහ ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම (NSF) විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලද SLAYS 3 MINUTE THESIS COMPETITION (SLAYS 3MT®) හිදී රන් පදක්කමක් දිනා ගත්තාය.

- මොරටුව විශ්වවිද්‍යාලයේ විදුලි හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශය ආරම්භ කළ Olivescript, ICT Agency (ICTA) විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රිමියර් ස්ටාර්ටප් සම්මන්ත්‍රණය Startup Battle - Disrupt Asia 2017 හි ජයග්‍රාහකයින් බවට පත්විය. කණ්ඩායම සියල්ලම එකට ඇති සම්පූර්ණ පවුල් සෞඛ්‍ය සහායකයෙකු වන"Clardia" නම් වූ ජෛව වෛද්‍ය උපකරණයක් නිර්මාණය කරන ලදී. මෙම උපකරණයට මිනිසාගේ යටි පතුලෙන් හෘද ස්පන්දනය, රුධිර ඔක්සිජන් මට්ටම, බර සහ පීපීජී සංඥා වැනි පරිශීලකයාගේ ප්‍රධාන සෞඛ්‍යය පරාමිතීන් උකහා ගැනීමට හැකිය. කණ්ඩායම තවද මෙම වසරේ පැවැත්වූ Microsoft Imagine Cup Sri Lanka Finals හි දෙවන අනු ශූරතාව දිනා ගන්නා ලදී.




- “INHALO”නිෂ්පාදිතය සොයාගන්නා ලද පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශයේ ටයිටන් කණ්ඩායම මෙම වසරේ ජූලි මාසයේ Microsoft Imagine Cup Finals හි දී තරඟ කිරීමට තෝරාගෙන ඇත. නිෂ්පාදිතය ඇදුම සහිත ළමුන්ට උපකාර කිරීමට වැඩිදියුණු කර ඇත. නිෂ්පාදිතය ක්‍රියා කරන විට සෞඛ්‍ය සම්පන්න වීම සහ ආශ්වාසකය භාවිතා කිරීමට දරුවන් දිරිමත් කරන ජංගම ක්‍රීඩාවක් සහිතව පැමිණේ. මෙම නිෂ්පාදිතය National Best Quality Software Awards 2017 හිදී වාණිජ හා තෘතිය තාක්ෂණ අංශයෙන් රන් සම්මාන දිනා ගත්තේය.

- සම්මානිත මහාචාර්ය විද්‍යා ජෝති නිමල් ද සිල්වා, ජාතික විනිසුරු මඩුල්ලේ සභාපති සහ සාමාජිකයින් සුසිර උඩලමත්ත මහතා, වාස්තු විද්‍යා පීඨයේ භූමි නිර්මාණ වාස්තු විද්‍යා අධ්‍යයනාංශය, ආචාර්ය විරාජිනී මැදගෙදර කරුණාරත්න සහ ආචාර්ය ගයාත්‍රි රණතුංග, පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනාංශය, ඉංජිනේරු පීඨය යන අයට කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී ඔක්තෝම්බර් මස 04 වන දින ජනාධිපති සම්මාන උළෙලේදී ශ්‍රී ලංකාවේ කලා හා ශිල්ප කලා නිර්මාණ කටයුතු වැඩි දියුණු කිරීම පිලිබඳ විශේෂඥ දැනුමෙහි ඔවුන්ගේ දායකත්වය අගයමින් සම්මාන ප්‍රදානය කරන ලදී. "ශිල්පාභිමානී" ජනාධිපති සම්මාන සහ සාර්ක් කලාපීය කලා හා ශිල්ප කලා උළෙල හා සමගාමීව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ශ්‍රී ලංකා ජාතික ශිල්ප සභාව විසින් මෙය සංවිධානය කරන ලදී.






- අනලස් පර්යේෂණ ප්‍රයත්නයන්හි කීර්තිමත් ප්‍රතිඵලවලින් එකක් වන විදුලි සහ විදුලි සංදේශ අධ්‍යයනාංශයේ UAV පර්යේෂණාගාරයේ “CeyHawk”, UAV (Unmanned Aerial Vehicle) කොළඹ ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන මධ්‍යස්ථානයේ දී සැප්තැම්බර් 26 සිට 28 දක්වා පැවැත්වූ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම (SLIC) විසින් සංවිධානය කරන ලද ජාතික නිපැයුම් ප්‍රදර්ශනය Sahasak Nimavum 2017 හිදී වාණිජ වර්ගීකරණය යටතේ ඉංජිනේරු උප වර්ගීකරණයෙන් රන් පදක්කම දිනා ගැනීමට සමත් විය.




- පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශයේ 13 වන කණ්ඩායමේ ශිෂ්‍යයෙක් 2017 සැප්තැම්බර් 13 දින පැවති ජාතික තොරතුරු තාක්ෂණ සමුළුවේ දී ශ්‍රී ලංකා පරිගණක සංගමය විසින් පිරිනැමූ "Best ICT Student of the Year 2017" නාමය දිනා ගත්තේය. විශිෂ්ට අධ්‍යයන කාර්යඵලය හේතුවෙන් ඔහු GPA එකතුව 4.2 න් 4.02ක් පවත්වා ගනිමින් අඛණ්ඩ වර්ෂ සඳහා කණ්ඩායමේ දක්ෂතම ශිෂ්‍යයා විය. ඔහු තවද Google I/O 2016, CakeLabs IoT Hackathon, IESL YMS HackthonFiontrai 2016, Cima Launchpad 2016, Yarl Geek Challenge, Hackadev 2015, සහ AirAsia Air- volution 2017 ඇතුළු බොහෝ ජාතික හා ජාත්‍යන්තර සම්මාන දිනා ඇත.

- පරිගණක විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශයේ ශිෂ්‍යයෙක් 2017 ඔක්තෝබර් 6 දින පැවැත්වූ NBSQA සම්මාන හිදී "Flowries" සඳහා රිදී සම්මානය දිනා ගත්තේය. ඔහු වඩාත් ම නිර්මාණශීලී මෘදුකාංග / දෘඩාංග සංවර්ධනය කරන්නාට ප්‍රදානය කරනු ලබන පශ්චාත් උපාධි ශිෂ්‍ය ව්‍යාපෘති කාණ්ඩය යටතේ සම්මානය දිනා ගත්තේය. "Flowries" යනු සාම්ප්‍රදායික විනිවිදක සහ ආකෘති පතුරුවලින් ඉදිරිපත් කිරීම් ප්‍රතිස්ථාපනය කිරීමට නවීන ඉදිරිපත් කිරීම් නිර්මාණය කිරීම සහ නව ඉදිරිපත් කිරීමේ ශෛලීන් හඳුන්වා දීම හැකි වේදිකාවක් වේ. පරිශීලකයන් හට "Flowries" සමඟ ප්‍රබල, සජීවීකරණය කළ හැකි සහ අන්තර්ගතයෙන් පොහොසත් ඉදිරිපත් කිරීම් පහසුවෙන් නිර්මාණය කළ හැකිය. එය පරිශීලකයින්ගේ පරිගණක මත කිසිඳු ගොනුවක් ස්ථාපනය නොකර ඕනෑම ස්ථානයකින් ප්‍රවේශ විය හැකි මාර්ගගත වේදිකාවකි.

- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) සමග එක්ව සියම් සිටි සිමෙන්ති සමාගම විසින් සංවිධානය කරන ලද INSEE-IESL Concrete Challenge 2017 දී මොරටුව විශ්වවිද්‍යාලයෙන් කණ්ඩායම් දෙකක් ජයගෙන ඇත. තරඟය අන්තර් විශ්වවිද්‍යාලීය තරඟ වලින් ආරම්භ වී මාස 3 ක කාලයක් පුරා වූ අතර, ගාල්ල INSEE සිමෙන්ති කම්හලේ පැවැත්වීමට නියමිත වූ අවසාන තරඟය සඳහා බොහෝ ශිෂ්‍ය කණ්ඩායම් තරග වැදුණි. මොරටුව විශ්වවිද්‍යාලයෙන් කණ්ඩායම් තුනක් ඇතුළුව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය විශ්වවිද්‍යාල හයකින් කණ්ඩායම් 18 ක් මෙම අවස්ථාව අත්කර ගැනීමට සමත් විය. මොරටුව විශ්වවිද්‍යාල කණ්ඩායම් මහත් උනන්දුවෙන් සහ උද්යෝගයෙන් යුතුව කටයුතු කළ අතර, වසර දෙකකට පසු කුසලානය ගෙන එන මුල්ම අදහස් සිතා හොඳින් ඉදිරිපත් කළහ.

- මොරටුව විශ්වවිද්‍යාලයේ IEEE ශිෂ්‍ය ශාඛාව MoraXtreme ට, IEEE ශිෂ්‍ය ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ දැනුම බෙදාහදා ගැනීම පෝෂණය කිරීම පිළිබඳ ඔවුන්ගේ ක්‍රියාකාරී දායකත්වය සඳහා IEEE ශිෂ්‍ය ක්‍රියාකාරකම් කමිටුව විසින් 2017 Darrel Chong Student Activity Award පිරිණමා ඇත. මෙම සම්මානය පිරිනැමීමේදී, IEEE ශිෂ්‍ය ක්‍රියාකාරකම් විසින් මොරටුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශාඛාවට ඉහලින්ම ප්‍රශංසා කරන ලදී.

- තොරතුරු තාක්ෂණ පීඨයේ තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මොහොමඩ් ෆාසිල් මොහොමඩ් ෆර්ඩෝස් 2017 ඔක්තෝබර් 20 සිට 21 දක්වා ශ්‍රී ලංකා පදනම් ආයතනයෙහි පැවති 5 වන ජාත්‍යන්තර නගර නිර්මාණ සම්මන්ත්‍රණයේදී – ICCPP -2017 "Sustainable Cities: An ICT Model for Inclusive Development" මාතෘකාව වූ ඔහුගේ පත්‍රය සඳහා හොඳම පත්‍රිකා සම්මානය දිනා ගන්නා ලදී.

- තොරතුරු තාක්ෂණ පීඨයේ සිසුන්ගෙන් සමන්විත කණ්ඩායමක් IoT වේදිකාවක් සහිත ජේනුව සහ ක්‍රීඩා උපකරණයක් වන "universal adapter" යනුවෙන් හඳුන්වන නිෂ්පාදන සංකල්පයක් වැඩි දියුණු කර ඇත. මෙම ඇඩප්ටරය උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, සෝනාරය වැනි විවිධාකාර වර්ගවල සංවේදක සඳහා අතුරු මුහුණත් සපයයි. තවදුරටත්, GPS විදහා පෙන්වීම, RGB පාලකය, GPS ප්‍රේරක, IP කැමරාව සහිත වීඩියෝ ප්‍රවාහය, කාල වරිගරය සහ හදිසි ට්වීට් සහ ඊමේල් විශේෂ දැනුම්දීමේ සේවාවන් පද්ධතිය තුළට සවි කර ඇත. එසේම, පාරිභෝගිකයින්ට widgets මිලදී ගැනීමට සහ ඒවා අනුවර්තනය කිරීමට ඉඩ සලසන ඇන්ඩ්රොයිඩ් මෘදුකාංගයකි. කණ්ඩායම IESL හි තරුණ සාමාජිකයින්ගේ අංශය විසින් සංවිධානය කරන ලද Hackathon හි ප්‍රථම ස්ථානය දිනා ගත්තේය. මෙය ඔක්තෝබර් මස 13 සිට ඔක්තෝබර් 15 දක්වා TECHNO SRI LANKA 2017 EXHIBITION සමග සම්බන්ධව කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදි.

- තොරතුරු තාක්ෂණ පීඨයේ සංවර්ධිත ශිෂ්‍ය කණ්ඩායම සන්දර්භය-දැනුවත් සහ පුද්ගලීකරණය කළ සංචාරක නිර්දේශ ක්‍රමය "TravelSL" මොරටුව විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණය පීඨය නියෝජනය කරමින් ඩිජිටල් යෙදුම් නිර්මාණය කිරීමේ විශිෂ්ටත්වය හඳුනා ගැනීමට ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) මගින් ආරම්භක පියවරක් වූ ඊ-ස්වාභිමානී 2017 හි කසලතා සම්මානය අත් කර ගැනීමට හැකි විය. "TravelSL" යනු ශ්‍රී ලංකාවේ සංචාරකයන්ට ඔවුන් පෞද්ගලිකව ප්‍රිය ස්ථාන කරා ගමන් කිරීමට සහාය වන ජංගම යෙදුමක් වේ.

- "Light Field System for Image Based Rendering of Ancient Artifacts" මාතෘකාව වූ අවසාන වසර ව්‍යාපෘතිය, 2016 දී ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයක ක්‍රියාවට නැංවූ හොඳම ඉංජිනේරු අවසාන වසර උපාධි අපේක්ෂක කණ්ඩායම් ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (SLAAS) විසින් ප්‍රදානය කරනු ලබන ගෞරවාන්විත මනම්පේරි ඉංජිනේරු සම්මාන 2017 දිනා ගත්හ.

- සමෝධානිත නිර්මාණ අධ්‍යයනාංශයේ ශිෂ්‍යයන් තිදෙනෙක් Asia Packaging Federation විසින් 'Asian Star Packaging Awards for the year 2017'පහක් දිනා ගත්හ. ඒ අතරතුර එම අධ්‍යයනාංශයම රන් තරු සම්මාන පහක් සහ රිදී තරු සම්මාන පහක් දිනා ගන්නා ලදී. ඒවා එකිනෙක ශිෂ්‍ය ප්‍රභේදයෙන් 'Lanka Star Packaging Award'න්ද ප්‍රදානය කරන ලදී. උත්සවය ශ්‍රී ලංකා ඇසුරුම්කරණ මධ්‍යස්ථානය සමඟ එක්ව ශ්‍රී ලංකා ඇසුරුම්කරණ ආයතනය විසින් සංවිධානය කරන ලදී.

## 1.3 ප්‍රධාන සැලසුම සහ උපාය මාර්ගික කළමනාකරණ සැලසුම

2020 සහ 2030 යන වසර සඳහා වූ මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සැලසුම වාස්තු විද්‍යා පීඨයේ කාර්ය මණ්ඩල කණ්ඩායමක් විසින් සකස් කරන ලදී. විශ්වවිද්‍යාලයේ සියලු වර්තමාන භෞතික සංවර්ධන ක්‍රියාකාරකම් මෙම ප්‍රධාන සැලසුම අනුව සිදු කරනු ලැබේ. විශ්වවිද්‍යාලයේ කඩිනම් පුළුල් වීමත් සමග, 2020 සහ 2030 සඳහා සංශෝධිත ප්‍රධාන සැලසුමක් විශ්වවිද්‍යාලයේ සියලු පීඨ නියෝජනය කරන විශේෂඥයන් කණ්ඩායමක් විසින්, ජාතික සංවර්ධන සැලසුම් සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සංයුක්ත සැලසුම් සමග අනුකූලව මොරටුව විශ්වවිද්‍යාලයේ භෞතික යටිතල පහසුකම්වල කඩිනම් සංවර්ධනය ඇතුළත් කරමින් වැඩි දියුණු කරමින් පවතී.

උපායමාර්ගික කළමනාකරණ සැලසුම (SMP) 2017-2018 පෙර සංයුක්ත සැලැස්ම 2010-2015 සංශෝධනය කිරීමෙන් වැඩි දියුණු කරන ලද අතර 2013 වසරේ පසු භාගයේදී සියලු උනන්දුවක් දක්වන පාර්ශ්ව සමග බොහෝ සෙයින් සාකච්ඡා කිරීමෙන් පසුව 2014 මාර්තුවලදී විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලදී.
උපායමාර්ගික කළමනාකරණ සැලසුම 2014-2018 හි සමාලෝචනය පෙන්නුම් කරන්නේ මොරටුව විශ්වවිද්‍යාලය සිය ඉලක්ක සහ අරමුණු ලඟාකරගෙන කර ඇති බවත් ඒවා ඉටුකර ගැනීම සඳහා මූල්‍යමය බැඳීම් එතරම් වැදගත් නොවන අතර ඉතිරි කොටස සපුරා ගැනීම කෙරෙමින් පවතින බවත්ය.

උපකුලපති, කවුන්සිල සාමාජිකයන්, සෙනෙට් සභාවේ සාමාජිකයන් සහ විශ්වවිද්‍යාලයේ තෝරාගත් අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වය ඇතිව 2017-2021 සඳහා උපායමාර්ගික කළමනාකරණ සැලසුම යාවත්කාලීන කිරීමට දෙදින බුද්ධි කලම්බන වැඩමුළුවක් 2017 ජනවාරි මස පවත්වන ලද අතර තවත් වැඩමුළුවක් උපකුලපති, නියෝජ්‍ය උපකුලපති, ලේඛකාධිකාරී, පීඨාධිපතිවරුන් සහ වැඩ බලන පුස්තකාලයාධිපති සමග අධ්‍යයන සහය කාණ්ඩ වල තෝරාගත් කාර්ය මණ්ඩලයක සහභාගීත්වය ඇතිව පෙබරවාරි මස එක් දින වැඩමුළුවක් ලෙස මෙහෙයවනු ලැබීය.





SMP වැඩමුළුව ජනවාරි 2017

## 1.4 ප්‍රාග්ධන ආයෝජන

මොරටුව විශ්වවිද්‍යාලයට එහි භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සැලකිය යුතු අරමුදල් සැපයීමක් ලැබිණි. මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් පුළුල් කිරීමට සමගාමීව පසුගිය වසර පහක කාලය තුළ සම්පූර්ණ කළ ඉදි කිරීම් ව්‍යාපෘති සහ සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති පිළිබඳ විස්තර වගුව 2 සපයයි.

2017 වසර තුළ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල්වලින් කළ ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 164, ප්‍රාග්ධන වත්කම් පුනරුත්තාපනය කිරීම සඳහා රුපියල් මිලියන 118, මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 2.1, පර්යේෂණ ශක්තිමත් කිරීමට රුපියල් මිලියන 67.7 සහ ස්ථාවර වත්කම් අතපත් කරගැනීමට රුපියල් මිලියන 430ක් ද වශයෙන් විය.

විශ්වවිද්‍යාලය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් දෙන ලද වෙන් කිරීම සම්පූර්ණයෙන්ම උපයෝජනය කළ නමුත් වියදම් කළ රුපියල් මිලියන 75ක් මහා භාණ්ඩාගාරය මගින් නිදහස් කළේ නැත. ඊට අමතරව, මොරටුව විශ්වවිද්‍යාලය මගින් එහි අනෙකුත් මූලාශ්‍රවලින් හා විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදල හා දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල්වලින් එකතු වූ රුපියල් මිලියන 8.9ක උත්පාදිත ආදායම රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 380 අනුව 2017 වසරේ දී නව ප්‍රාග්ධන උපකරණ මිල දී ගැනීම සඳහා ආයෝජනය කරන ලදී.

**2 වගුව – පසුගිය වසර 5 තුළ ප්‍රාග්ධන යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති.**

| ව්‍යාපෘතිය | වටිනාකම (රු. මිලියන) | තත්ත්වය |
|---|---|---|
| දකුණු ආසියා ජල කළමනාකරණය සඳහා මාදන්ජීට් මධ්‍යස්ථානය (බාහිර අරමුදල්කරණය) | 50 | 2012 දී සම්පූර්ණ කරන ලදී |
| ඇඟළුම් සහ රෙදිපිළි අධ්‍යයනාංශය සඳහා ඊසාන දිග (NE) දිගුව | 83 | 2012 දී සම්පූර්ණ කරන ලදී |
| ප්‍රවාහන සහ කාර්ය සම්පාදන කළමනාකරණ ගොඩනැගිල්ල | 148.2 | 2014 දී සම්පූර්ණ කරන ලදී |
| වාස්තුවිද්‍යා පීඨය – පියවර II (නගර සහ ග්‍රාම සැලසුම්කරණය) | 140 | 2015 දී සම්පූර්ණ කරන ලදී |
| ශිෂ්‍ය මධ්‍යස්ථානය සහ ආපනශාලා දිගුව | 57 | 2015 දී සම්පූර්ණ කරන ලදී |
| අධිවේගී මාර්ග පරීක්ෂණ විද්‍යාගාරය පියවර I | 6.7 | 2015 දී සම්පූර්ණ කරන ලදී |
| නේවාසිකාගාර ගොඩනැගිල්ල 1 (පෙරසවි) නේවාසිකාගාර ව්‍යාපෘතිය යටතේ (අමාත්‍යාංශය මගින් සෘජුවම අරමුදල් සපයන ලදී) | 196.4 | 2016 දී සම්පූර්ණ කරන ලදී |
| නේවාසිකාගාර ගොඩනැගිල්ල 2 (පෙරසවි) නේවාසිකාගාර ව්‍යාපෘතිය යටතේ (අමාත්‍යාංශය මගින් සෘජුවම අරමුදල් සපයන ලදී) | 196.4 | 2016 දී සම්පූර්ණ කරන ලදී |
| තොරතුරු තාක්ෂණ පීඨය – පියවර II | 205 | 2016 දී සම්පූර්ණ කරන ලදී |
| වාස්තුවිද්‍යා පීඨය – පියවර III (ඒකාබද්ධ සැලසුම) | 110 | 2017 දී සම්පූර්ණ කරන ලදී |
| වාස්තුවිද්‍යා පීඨය – පියවර IV (වාස්තුවිද්‍යා) | 150 | 2016 දී සම්පූර්ණ කරන ලදී |
| පරිපාලන ගොඩනැගිල්ල සඳහා දිගුව | 282 | 2017 දී සම්පූර්ණ කරන ලදී |
| වාස්තු විද්‍යා පීඨය සඳහා දේශන කාමර ගොඩනැගිල්ල (වානේ) | 164 | 2017 දී සම්පූර්ණ කරන ලදී |
| ඉංජිනේරු පීඨය සඳහා බහුකාර්ය ගොඩනැගිල්ල (වානේ) | 184 | 2017 දී සම්පූර්ණ කරන ලදී |
| කාන්තා නේවාසිකාගාරය (සිසුන් 400ක් සඳහා) | 194 | කෙරෙමින් පවතී |
| නේවාසිකාගාර ගොඩනැගිල්ල 3 (පෙරසවි) නේවාසිකාගාර ව්‍යාපෘතිය යටතේ (අමාත්‍යාංශය මගින් සෘජුවම අරමුදල් සපයන ලදී) | 196.4 | කෙරෙමින් පවතී |
| අධිවේගී මාර්ග පරීක්ෂණ විද්‍යාගාරය පියවර II | 23.7 | කෙරෙමින් පවතී |
| ගොඩනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය සඳහා ගොඩනැගිල්ල | 75 | කෙරෙමින් පවතී |
| ද්‍රව්‍ය විද්‍යා හා ඉංජිනේරු අධ්‍යයනාංශය | 439 | කෙරෙමින් පවතී |
| පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනාංශය | 307 | කෙරෙමින් පවතී |
| යාන්ත්‍රික ඉංජිනේරු අධ්‍යයනාංශය සඳහා යෝජිත ගොඩනැගිල්ල | 247 | කෙරෙමින් පවතී |

මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනය (ITUM) සඳහා දියගම අලුතින් අත්පත් කර ගත් ඉඩමේ ඉදි කිරීමට නියමිත ගොඩනැගිලි සංකීර්ණය සඳහා 2013 අගෝස්තු මාසයේදී මුල් ගල තැබීමෙන් පසුව, අරමුදල්



මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණ ආයතනය

ලබා ගැනීමට සහ ව්‍යාපෘතිය කරගෙන යාමට මහත් පරිශ්‍රමයක් දරන ලද්දේ එය විශ්වවිද්‍යාලයේ සාමකාමී පරිසරය රැක ගැනීමේ සහ ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීමේ මූලික සාධකයක් වූ බැවිනි. මූලාරම්භයේදී මෙම ව්‍යාපෘතිය, චීනයේ Exim බැංකුවෙන් අරමුදල් ලබන චීන කොන්ත්‍රාත්කරුවෙකු වන CATIC මගින් ගොඩනැගීමට නියමිතව තිබිණි. කෙසේ වෙතත්, පසුව එය අත් හැර දමන ලද අතර එම ව්‍යාපෘතිය ජාත්‍යන්තර ඉදි කිරීම් සංසදය (ICC) වෙත, මුළු ව්‍යාපෘති පිරිවැය රු. බිලියන 10.3 කට පිරිනමන ලදී. එයින්, 75%ක් දේශීය බැංකුවලින් ICC වෙතින් සහ 25% ක් මහා භාණ්ඩාගාරයෙන් අරමුදල්කරණ මූලාශ්‍ර වෙතින් සැපයේ. මෙම සංවර්ධනය සමගින් මොරටුව විශ්වවිද්‍යාලයට එහි බඳවා ගැනීම් ඉහළ නැංවිය හැකි අතර ITUM හටද එහි බඳවා ගැනීම් වර්තමානයේ 350 ක් වන ශිෂ්‍ය සංඛ්‍යාවේ සිට 1000 ක් දක්වා ව්‍යාපෘතිය සම්පූර්ණ කළ විට ඉහළ නැංවිය හැකිය. මෙය කැපී පෙනෙන ජයග්‍රහණයක් වශයෙන් සැලකිය හැකිය. 2016 වසර පුරාම ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කරන ලද අතර 2017 අගෝස්තු මස 10 වන දින අග්‍රමාත්‍යතුමා විසින් කීර්තිමත් පුද්ගලයන්, සුභ පතන්නන්, කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන්ගේ විශිෂ්ට එකතුවක සහභාගිත්වයෙන් උත්සවාකාරයෙන් විවෘත කරන ලදී.

මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රථම උප කුලපති උපාලි කුරුප්පු මහතා විසින් මොරටුව විශ්ව විද්‍යාලයේ පරිපාලන ගොඩනැගිල්ලේ විශාල සිව් මහල් පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය විවෘත කරන ලදී. මෙම උත්සවයට විශ්වවිද්‍යාලයේ උප කුලපති, හිටපු විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්, අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය සහභාගී විය.




නව පරිපාලන ගොඩනැගිල්ල විවෘත කිරීම

ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘතියක් වන විසි එක්වන ශත වර්ෂය සඳහා උසස් අධ්‍යාපනය ව්‍යාපෘතියේ (HETC) විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රදාන (UDG), බාහිර උපාධි වැඩසටහන් (EDP) සහ ගුණාත්මක හා නවෝත්පාදන ප්‍රදාන (QIG) යන අංග යටතේ අරමුදල් සපයා ගැනීමටත් මානව සම්පත් සංවර්ධන අංගය යටතේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 8 දෙනෙකුට දේශීය හා විදේශීය විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධි සහ පර්යේෂණ පාදක පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගැනීම සඳහා වූ ශිෂ්‍යත්ව ලබා ගැනීමටත් හැකියාව උදා විය.

එමෙන්ම තොරතුරු සන්නිවේදන තාක්ෂණ කුසලතා දියුණු කිරීම, ඉංග්‍රීසි භාෂා කුසලතාව වර්ධනය කිරීම, මෘදු කුසලතා ශක්තිමත් කිරීම සහ වාර්ගික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම යන ක්‍රියාකාරකම් 4 යටතේ යෝජිත මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාල සංවර්ධන ප්‍රතිපාදන යටතේ රු. මිලියන 40 ක මුදලක්

විශ්වවිද්‍යාලයට ලැබිණි. ව්‍යාපෘතිය 2011 වසරේ ජූලි මස ආරම්භ විය. එමෙන්ම පොත්, ඉගෙනුම් මෘදුකාංග සහ විද්‍යුත් සම්පත් මිලදී ගැනීම සඳහා HETC ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 9.0 ක ප්‍රදානයක් ද විශ්වවිද්‍යාලයට ලැබුණ අතර එම ප්‍රතිපාදන ද සම්පූර්ණයෙන්ම ප්‍රයෝජනයට ගෙන ඇත. QIG ප්‍රදාන යටතේ අධ්‍යයනාංශ හතරක් ප්‍රදාන ලබා ගැනීමේදී සාර්ථක විය - පළමු වටයේදී ඇඟළුම් හා රෙදිපිළි තාක්ෂණ අධ්‍යයනාංශය සහ නගර සහ ග්‍රාම සැලසුම්කරණ අධ්‍යයනාංශය සහ දෙවන වටයේදී විදුලි සන්නිවේදන ඉංජිනේරු අධ්‍යයනාංශය සහ විදුලි ඉංජිනේරු අධ්‍යයනාංශය යන එක එකක් සඳහා රු. මිලියන 25 ක වටිනාකමක් සහිත ප්‍රදානය බැගිනි. වට දෙක සඳහා විශේෂ ත්‍යාග ද ලැබූ යෝජනා අදියර තරඟය තුළ සමස්ත විශ්වවිද්‍යාල පද්ධතිය තුළ උපරිම ලකුණු ලබා ගැනීමෙන් මෙම අධ්‍යයනාංශ මෙම ත්‍යාග දිනා ගත් බව සටහන් කළ යුතුය.



තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල

කාන්තා නේවාසිකාගාරය

2017 වසර තුළ ප්‍රාග්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සමාලෝචනය කිරීම මගින් මොරටුව විශ්වවිද්‍යාලය වර්ෂය සඳහා වෙන් කිරීම් සම්පූර්ණයෙන්ම භාවිතයට ගෙන ඇති බව දක්වයි. ගොඩනැගිලි සහ ඉදිකිරීම්වල පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා අයවැය ගත රුපියල් මිලියන 95න් 123%ක් වැය කර ඇත. ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම සඳහා වෙන් කළ රුපියල් මිලියන 411.5න් 104%කට වඩා වැය කර ඇත. වෙන් කළ රුපියල් මිලියන 800 ක ප්‍රාග්ධන අරමුදල් සැපයීමෙන් 2017 වර්ෂය තුළ රුපියල් මිලියන 780.99 ක අරමුදල් වැය කර ඇත.

### 1.5 නවෝත්පාදක සහ ව්‍යවසායකත්ව හැකියාවන් සහිත උපාධිධාරීන් බිහි කිරීම

වසර තුනක් සඳහා එන්ඩීබී බැංකුවේ මූල්‍ය සහයෝගීතාව ඇතිව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පළමු වරට ඇති කළ කර්මාන්ත සහාය ලද “ව්‍යවසායකත්වය පිළිබඳ එන්ඩීබී බැංකුවේ නිව්දත් මහාචාර්යවරයා/සාමාජික” යන ගෞරව ධුරය මොරටුව විශ්වවිද්‍යාලය විසින් පිහිටුවන ලදී. මේ යටතේ වූ පළමු නිව්දත් මහාචාර්යවරයා 2010 වසරේ ඔක්තෝබර් මාසයේ දී පත් කරන ලද අතර මේ යටතේ ගන්නා ලද ව්‍යවසායක මූලාරම්භයන් ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ තරුණ ව්‍යවසායක (YESL) වැඩසටහන සමගින් විශ්වවිද්‍යාලයේ ව්‍යවසායකත්ව සංස්කෘතිය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කරන ලද අතර ඉංජිනේරු උපාධි විෂය නිර්දේශයට ව්‍යවසායකත්වය පිළිබඳ සුළු විශේෂීකරණයක් හඳුනවා දෙන ලදී.

විශ්වවිද්‍යාලයෙහි තවත් වැදගත් මූලාරම්භයක් වූයේ වසර තුනක කාල පරිච්ඡේදයක් තුළ රු. මිලියන 16කට වඩා වැඩි ගණනක් සමගින් කාර්මාන්ත මූල්‍ය සේවා වෙතින් අරමුදල් සහිතව “නවෝත්පාදනය හා ව්‍යවසායකත්වය” පිළිබඳ සමාන සම්මානිත තනතුරක් පිහිටුවීමය. මෙම අරමුණ සඳහා 2014 නොවැම්බර් මාසයේදී ගිවිසුමක් අත්සන් කරන ලද අතර නවෝත්පාදනය සහ ව්‍යවසායකත්වය පිළිබඳ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙතුගේ පත් කිරීම ඇතිව 2015 සැප්තැම්බර් මාසයේදී නව ව්‍යවසායකත්ව මූලාරම්භය දියත් කරන ලදී.



නව සොයා ගැනීම්, නවෝත්පාදන සහ ව්‍යවසායකත්වය සඳහා පහසුකම් සැලසීමේ යාන්ත්‍රණ ඇති කිරීම සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් හා කාර්ය මණ්ඩලය අතර ව්‍යවසායකත්වය පිළිබඳ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ විශ්වවිද්‍යාලයේ උපායමාර්ග යටතේ 2017 වසර තුළ දී වැදගත් පියවර කීපයක්ම ගනු ලැබීය. විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී 2017 නොවැම්බර් මස 27 වන දින මොරටුව විශ්වවිද්‍යාලයේ උප කුලපති විසින් ආරම්භක පොදු වැඩ අවකාශය පදනම් කරගත් ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජ්‍ය විශ්වවිද්‍යාලය “The Enterprise” විවෘත කරන ලදී. The Enterprise දැනටමත් යෝජිත පෞද්ගලික අංශයේ හවුල්කාරිත්වයන් සමඟ තව දුරටත් එකතු වීමට තව පහසුකම් සමග වර්තමානයේ ආරම්භ කිරීම් 20කට ආසන්න සංඛ්‍යාවකට බඩු තැන්පත් කිරීමට විශ්වවිද්‍යාලයට මං සලසා ඇත. නවෝත්පාදන, ව්‍යවසායකත්ව හා තාක්ෂණික බලපත්‍ර ලබා ගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථානය The Enterprise වනු ඇත. විශ්වවිද්‍යාල ආරම්භ කිරීම් සඳහා විවෘත කාර්යාලීය පරිසරයක් සපයන අතර, එය විශ්වවිද්‍යාලය තුළම

තවදුරටත් සහයෝගිතාව වර්ධනය කිරීම සහ නවෝත්පාදන තවදුරටත් සැපයීමට අරමුණු කර ඇත. පොදු වැඩ අවකාශය ආරම්භයේදී සිසුන් 15 ආරම්භ කිරීම් වලට සහ කර්මාන්ත ආරම්භ කිරීම් 3කට (උපාධිධාරීන් විසින් ආරම්භ කිරීම) හැකියාව ඇත. සෑම තෝරාගත් ශිෂ්‍ය ආරම්භ කිරීමක්ම අභ්‍යන්තර රැස්වීම් ශාලාවට සහ ආහාර ගබඩා කාමරයට පිවිසීම සමග නොමිලේ Wi-Fi සහිත ඉන්කියුබේටර්හි ආසන 2 ත් 3 ත් අතර සංඛ්‍යාවක් ලබා ගැනීමට අවස්ථාව ලබා දෙනු ඇත. තවද, කර්මාන්ත ආරම්භ කිරීම් 3කට වට්ටම් කළ අනුපාතයේදී පිරිනමනු ලබන ආසන 5 සිට 6 දක්වා ලබා ගත හැකි වනු ඇත. පොදු වැඩ අවකාශයට තේරීමේ නිර්ණායක කැපී පෙනෙන ආරම්භකිරීම් තෝරාගැනීම විශේෂයෙන් සහතික කරනු ලැබේ. වර්තමානයේ, මොරටුව විශ්වවිද්‍යාලය ආරම්භක ජීවන චක්‍රයේ විවිධ අවස්ථා වලදී ආසන්න ආරම්භ කිරීම් 70 ක් අවධානයට ලක් කර ඇත. 2017 පෙබරවාරියේ ආරම්භ කරන ලද Mora Ventures මොරටුව විශ්වවිද්‍යාලයේ කෙරෙමින් පවතින ආරම්භක ඉන්කියුබේටරය වේ. වසර 2027 වන විට ශ්‍රී ලංකාවේ ප්‍රථම කහවේනා (ඇමෙරිකානු ඩොලර් බිලියනය ඉක්මවන ආරම්භ කිරීම) ආරම්භ කිරීම තෙක් Mora Ventures ත්‍රෛමාසිකව සිදු කිරීමට බලාපොරොත්තු වේ.



පියුවර් ඩ්‍රෝන්ස් (පුද්) සමාගම මිනිසුන් රහිත ගුවන් යානා (UAV) ප්‍රදේශයේ ස්ථිර පර්යේෂණ සහ සංවර්ධන ප්‍රයත්නය දශකයකට පසු විශ්වවිද්‍යාලයේ ප්‍රථම spin-off සමාගම ලෙස විදුලි හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යයනාංශයේ පිහිටුවා ඇත. එය ශ්‍රී ලංකාවේ පළමු වරට ඉතා ඉහළ විභේදක ගුවන් සිතියම්කරණ තාක්ෂණයක් වර්ධනය කර ඇත. මෙම තාක්ෂණය අධි විභේදන රූප රාමු, නිරවද්‍යතාව RTK (තත්කාල ප්‍රගතිය) GPS සම්බන්ධීරණ සහ මූලික පියාසර කාර්ය සාධනය මත පදනම්ව ගුවන් ගත සිතියම්කරණයේ සෙමී 3ක හූ සම්බන්ධීරණ නිරවද්‍යතාවයක් ලබා දිය හැක. ගුවන් සිතියම් සැකසීමේ මට්ටම ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර ඇති අතර එය බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ගුවන් නිරූපණය නිර්මාණය කිරීමට කොන්ත්‍රාත්තුවක් පිරිනමා ඇත.








අදහස් ගොනු කිරීම, ව්‍යාපාර යෝජනා සංවර්ධනය සහ පීඨය පුරා විවිධ බැනර සහ පෝස්ටර සහිතව දැනුවත් කිරීමේ ව්‍යාපාර, උපාය මාර්ගික හවුල්කරුවන් සමග සහයෝගීතා පිහිටුවීම ආදි ව්‍යවසායකත්වය පිළිබඳ විවිධ පැති අළලා ආරාධිත දේශන මාලාව ඉදිරියට කර ගෙන යන ලදී. ශිෂ්‍යයන් විසින් විවිධ ව්‍යවසායකත්ව තරඟවලට සහභාගී වී සම්මාන දිනා ගත්තේය.




Lion's Den Start Ups Pitch වැඩසටහන ඉදිරියට කර ගෙන ගිය අතර කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම් 30 ක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව නව කුඩා ව්‍යාපාර ආරම්භ කිරීමේ මූලාරම්භයක් වන "Mora Ventures" 2016 වසරේදී දියත් කරන ලදී. 2015 වසරේ නිර්මාණය කළ ව්‍යවසායකත්ව සමාජය මෙම මූලාරම්භයන්ට බොහෝ සෙයින් සහාය විය. 2018 වසර වන විට ඇමරිකානු ඩොලර් මිලියන 1 දක්වා අගයකට අවම වශයෙන් මෙම කුඩා ව්‍යාපාර ආරම්භ කිරීම් 10ක් වත් ගෙන ආ හැකි බවට සංගමයට විශ්වාසය.

2017 වසරේදී පේටන්ට් බලපත්‍ර 3ක් ප්‍රදානය කරන ලදී. මේ සමඟ පේටන්ට් බලපත්‍ර ප්‍රදානය සඳහා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය මගින් මුළු අයදුම්පත්‍ර සංඛ්‍යාව 12ක් සකසනු ලබයි.

ව්‍යවසායකත්ව පරිසරයක් නිර්මාණය කිරීම සඳහා වූ විශ්වවිද්‍යාල ව්‍යායාමයන්හි දී මෙම මූලාරම්භයන් මඟින් දැනටමත් පිහිටුවා ඇති බුද්ධිමය දේපළ උපදේශන කමිටුව (IPAC), විශ්වවිද්‍යාල කර්මාන්ත සම්බන්ධීකරණ ඒකකය (UIIC) සහ අධ්‍යයනාංශ හා පීඨවල පිහිටි බීජෞෂණ වැනි ආයතන ඌණපූරණය කරනු ඇත. ඒවා මගින් අපගේ උපාධිධාරීන් "රැකියා සොයන්නන් වෙනුවට රැකියා නිර්මාපකයන්" බවට පත් කිරීම සඳහා සහ ඉදිරි වාණිජකරණය සඳහා මහ පාදන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නව සොයා ගැනීම් වෙනුවෙන් පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම සඳහා කැපී පෙනෙන දායකත්වයක් දක්වනු ඇත.

## 1.6 විශ්විවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරිත්වය

ඵලදායක විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරීත්වය මොරටුව විශ්වවිද්‍යාලයේ ප්‍රබලතම ගුණාංගවලින් එකකි. පොදු මූලාරම්භයන්ට අර්ධ කාලීන පශ්චාත් උපාධි වැඩසටහන්, කෙටිකාලීන වැඩසටහන්, පුහුණු හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CPD) පාඨමාලා, සමුළු, වැඩමුළු, උපදේශක මණ්ඩල හා පරීක්ෂණ පැවරුම්, කර්මාන්තයේ අරමුදල් ආධාර ලද පර්යේෂණ හා සංවර්ධන විද්‍යාගාර, සම්මානිත ධුර, අධ්‍යයනාංශ කර්මාන්ත උපදේශක මණ්ඩල, පීඨ කර්මාන්ත උපදේශක මණ්ඩල, සහ සංස්ථා සමාජ වගකීම් ක්‍රියාකාරකම් ඇතුළත් වේ. කර්මාන්තවලට සහ ඒ අනුව රටේ ආර්ථික සංවර්ධනයට සහාය වීමට අමතරව කාර්ය මණ්ඩල සාමාජිකයන්ට, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහ ඒ හා සමාන ආයතනවලට ප්‍රතිලාභ ගෙන එන නිසා විශ්වවිද්‍යාලය මගින් මෙම කර්මාන්ත සහ සමාජය සමග අන්තර්ක්‍රියා නොමඳව දිරිමත් කරයි.

කර්මාන්ත මගින් අරමුදල් සැපයූ පර්යේෂණ මධ්‍යස්ථාන සාර්තක විශ්විද්‍යාල කර්මාන්ත සහයෝගීතාව සඳහා තවත් වැදගත් යාන්ත්‍රණයකි. මෙයට දශකයකට පෙර ස්ථාපනය කළ ජංගම සන්නිවේදනය සඳහා වූ ඩයලොග් UOM පර්යේෂණ විද්‍යාගාරය, විදුලි සංදේශ ක්ෂේත්‍රය තුළ කර්මාන්ත පාදක පර්යේෂණ හා නිෂ්පාදන සංවර්ධනය පිළිබඳ ඉතා සාර්ථක ආදර්ශයක් බවට පත් වී ඇත. මෙම විද්‍යාගාරයේ සාර්ථකත්වය ඉලෙක්ට්‍රොනික ආශ්‍රිත නව තාක්ෂණ සඳහා වූ "Zone 24X7 UOM පර්යේෂණ විද්‍යාගාරය", රබර් හා සම් නිෂ්පාදන සහ ක්‍රියාවලි සංවර්ධනය සඳහා වූ "SIL-UOM විද්‍යාගාරය", ජෛව වෛද්‍ය තාක්ෂණය සඳහා වූ "ප්‍රිමියම් ඉන්ටර්නැෂනල්- UOM", ලිපිද්‍රව්‍ය තාක්ෂණය සඳහා වූ සිලෝන් පෙන්සිල් කොපරේෂන් ATLUS- UOM, සහ ද්‍රව්‍ය පර්යේෂණය සඳහා INSEE – UOM, ශිෂ්‍ය කර්මාන්ත පත් කිරීම සහ විදේශ පුහුණුව ඇතුළුව පුහුණුව, පර්යේෂණ, සැලසුම් සහ තාක්ෂණික හැකියා ශක්තිමත් කිරීම, වාර්ෂික විලාසිතා ප්‍රදර්ශනය සඳහා නිෂ්පාදන සංවර්ධනය සහ සහාය සඳහා Jersey ආයතනය ස්ථාපිත කිරීමට හේතු විය. "Epic-UOM නවෝත්පාදන විද්‍යාගාරය" ස්ථාපිත කිරීමට තවත් එවැනි මූලාරම්භයක් 2016 වසරේදී ගන්නා ලදී. 2017 දී විශ්වවිද්‍යාල කර්මාන්තයේ සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා තවත් පියවර කිහිපයක් ගෙන ඇත. එපික් තාක්ෂණ කණ්ඩායමේ සහයෝගය ඇතිව මොරටුව විශ්වවිද්‍යාලයේ එපික් "Epic-UOM Innovation Lab" නම් වූ අංගසම්පූර්ණ නවීනතම පර්යේෂණ හා නවෝත්පාදන මධ්‍යස්ථානයක් ආයතනයක් ඉදිකිරීම එවන්නකි. 2017 දී ගන්නා ලද තවත් පියවරක් වන්නේ කෝඩ්ජෙන් ජාත්‍යන්තර සමාගම විසින් හඳුන්වා දුන් මොරටුව විශ්වවිද්‍යාලයේ "QBITS" නමින් ප්‍රථම කෘත්‍රිම බුද්ධි තොරතුරු නවෝත්පාදන විද්‍යාගාරය ස්ථාපිත කිරීමයි. මෙම විශේෂ ව්‍යාපෘතියට එකඟතාව මොරටුව විශ්වවිද්‍යාලයේ උප කුලපති, නියෝජ්‍ය උප කුලපති, ලේඛකාධිකාරී, පීඨාධිපතිවරුන් සහ විශ්වවිද්‍යාලයේ අදාල අධ්‍යයනාංශ ප්‍රධානීන් සමඟ ප්‍රධාන විධායක නිලධාරි, ජනාධිපති නීතිඥ සහ කෝඩ්ජෙන් ආයතනයේ මෙහෙයුම් සහ පර්යේෂණ ප්‍රධානී ඉදිරියේ මොරටුව විශ්වවිද්‍යාලයේදී අත්සන් කරන ලදී.



EPIC සහයෝගිතාව



මෙම කර්මාන්ත-ශාස්ත්‍රීය සහයෝගීතාව යටතේ ශිෂ්‍යයන්ට පූර්ණ අරමුදල් ලබා ඇති පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව තුනක් මූලිකව පිරිනැමීම සහ ස්ථාපිත රාමුවක් තුල කෘත්‍රිම බුද්ධි පර්යේෂණය පූර්ණ ලෙස අරමුදල් සපයන අතර කෝඩ්ජෙන් ඒකාබද්ධව අධීක්ෂණය කිරීම. මෙම හවුල්කාරිත්වයේ මූලික පරමාර්ථය තොරතුරු තාක්ෂණ කර්මාන්තය සමඟ විශ්වවිද්‍යාලය සම්බන්ධවීම සහ බහු- ශික්ෂණ කර්මාන්තයන්හි දැනුම සහයෝගිතාවය මත කේන්ද්‍ර වී ඇත.QBITS, කෘත්‍රිම බුද්ධිය (AI) නවෝත්පාදන විද්‍යාගාරය 2017 නොවැම්බර් මස මොරටුව විශ්වවිද්‍යාලයේ උපකුලපති විසින් විවෘත කරන ලදී.




QBITS, කෘතිම බුද්ධිය නවෝත්පාදන විද්‍යාගාර ආරම්භ කාරීම

ජාතික සංවර්ධනයට මහත් ලෙස දායක වෙමින් මෙන්ම විශ්වවිද්‍යාලයට ආදායම් උත්පාදනය කරමින් කාර්ය මණ්ඩල සාමාජිකයන් විසින් රජය, ආධාර දෙන නියෝජිතායතන සහ කර්මාන්තය වෙනුවෙන් නවෝත්පාදක පර්යේෂණ හා උපදේශක ව්‍යාපෘති භාර ගැනීම දිගටම කරගෙන යයි. එවැනි විශේෂිත සේවාවන් ලබා ගැනීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලය උනන්දුවක් දක්වන පාර්ශ්වයන් බොහොමයකගේ දැඩි ආකර්ෂණයට භාජනය වී ඇත.

සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් විශ්වවිද්‍යාල කර්මාන්ත අන්තර්ක්‍රියාකාරී කටයුතුවල නියැලෙන අතරම රජයේ ඒකාබද්ධ අරමුදලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හරහා ලබා දෙනු ලබන ප්‍රදාන සඳහා ඔවුන් අධ්‍යයන අංශයෙන් වගවන බව තහවුරු කිරීම පිණිස ඔවුන් විසින් උපාධි අධ්‍යයන කටයුතු සම්බන්ධව සිය නිර්දේශිත අධ්‍යයන වැඩ නියමයන් සහ අධ්‍යයන කටයුතු සම්පූර්ණ කරන බවට වගබලා ගැනීම විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ ප්‍රතිපත්තිය වේ. උපාධිධාරීන්ගේ උසස් පුහුණුවීම් හා සුදුසුකම් ඉහළ නැංවීම වෙනුවෙන් පිරිනමන පාඨමාලා; දැනුම හා තාක්ෂණ සංවර්ධනය කර මාරු කිරීමට පවත්වනු ලබන පුහුණු වැඩසටහන්, CPD පාඨමාලා, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති, සම්මන්ත්‍රණ, වැඩමුළු හා අනෙකුත් අධ්‍යයන පැවරුම්; කර්මාන්තය උදෙසා උපදේශනය හා පරීක්ෂණ පැවරුම්; සහ සංස්ථා සමාජ වගකීම් ක්‍රියාකාරකම් වැනි කර්මාන්තයට සහභ සමාජයට විශ්වවිද්‍යාලය මගින් ලබා දෙන අනෙක් සියලු සේවා අංක 380 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව **පිරිවැය ප්‍රතිසාධනය** කර ගැනීමේ (ස්ව-මුදල් සැපයීමේ) පදනම මත දියත් කරනු ලබන වැඩසටහන් වේ. ඒ අනුව මොරටුව විශ්වවිද්‍යාලය සමාජය හා කර්මාන්තය වෙනුවෙන් ඇති සිය බැඳියාව ඉටු කරනු ලබන්නේ රජයට **කිසිදු පිරිවැයක්** නොමැතිවයි.

එවැනි **පිරිවැය ප්‍රතිසාධන** (ස්ව-මුදල් සැපයීමේ) කටයුතු සහ ව්‍යවසායකත්ව කටයුතු සඳහා වූ සිය කර්මාන්ත මුලපිරීම් කර ගෙන යාමෙන් මෙම ක්‍රියා හරහා මොරටුව විශ්වවිද්‍යාලය 2016 වසර තුළ රුපියල් මිලියන 638.17 උත්පාදනය කරන ලද අතර එය පසුගිය වසරට වඩා 67% වැඩි වීමකි. ලාභ නොලබන පදනම මත අංක 380 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව උත්පාදිත ආදායම උපයෝගී කර ගෙන ඇත.

## 1.7 තත්ත්ව ආරක්ෂණය

මොරටුව විශ්වවිද්‍යාලයේ තත්ව සහතික කිරීම එහි සේවාවල සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳව ශිෂ්‍යයන්ට, කාර්ය මණ්ඩලයට, සේවාදායකයන්ට හා සමස්තයක් ලෙස මුළු ප්‍රජාවටම තහවුරු කිරීම සඳහා ඉගැන්වීමේ යෙදවුම්, අධ්‍යාපන ප්‍රතිඵල, පර්යේෂණ වේදිකා, කාර්යසාධන ඇගයීම්, පරිපාලන පද්ධතියෙන් සමන්විත ශිෂ්‍ය සේවා සහ විෂය බාහිර ක්‍රියාකාරකම්වලින් සමන්විත එහි ප්‍රධාන ක්‍රියාවලිවල ප්‍රමිති, විධිමත්, සංගත සහ පාරදෘශ්‍ය ආකාරයකින් කාර්යක්ෂමව හා විශ්වාසදායක ලෙස ළඟා කර ගන්නා වූ විශ්වවිද්‍යාල කළමනාකරණය තුළට කාවද්දන ලද ක්‍රියාවලියක් වේ. විශ්වවිද්‍යාලයේ QA ප්‍රතිපත්තිය මගින් ආයතනය තුළ අධ්‍යයන, අනධ්‍යයන සහ පරිපාලන යන සියලු කාර්ය මණ්ඩල සාමාජිකයන් සහ එමෙන්ම ශිෂ්‍යයන් විසින් ද පිළිගන්නා QA පදනම් වූ සංස්කෘතියක් සංවර්ධනය කොට කාවැද්දීමට අදහස් කරනු ලැබේ.

තත්ත්ව සහතික ක්‍රමෝපාය (QAS) මගින් විශ්වවිද්‍යාල SMP හි දක්වා ඇති දැක්ම සහ මෙහෙවර සමග සම්ගාමීව යයි. SMP ක්‍රියාත්මක කිරීමේ දී, විශ්වවිද්‍යාල කළමනාකරණය කල්පනාකාරීව පිහිටුවන ලද ඉම් ලකුණු සපුරා ගැනීමට එහි සේවාවල සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා අවශ්‍ය පද්ධති, ක්‍රියාවලි සහ නිරීක්ෂණය කිරීමේ යාන්ත්‍රණ ස්ථාපිත කරයි. එබැවින් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකයේ (IQAU) නායකත්වය යටතේ ඒ එක එකක් ප්‍රමුඛතා කාර්යවලට වෙන් කරන SMP හි නිශ්චිතව දක්වා ඇති ඉලක්ක, ගුණාත්මක අරමුණුවලට සංක්ෂිප්ත කළ ගුණාත්මක ප්‍රතිපත්තිවලට පරිවර්තනය කර ඇත. එක් එක් කාර්යයන් වැඩිදියුණු කිරීම සඳහා වගකීම දරන නිලධාරියා/පාර්ශ්වකරු හඳුනාගෙන ඇති අතර තත්ත්ව සහතික සහ සහතිකකරණ කවුන්සිලයේ (QAAC) මාර්ගෝපදේශවලට අනුකූලව නියම කළ කාලපරිච්ඡේදවලදී බාහිර සහ අභ්‍යන්තර සමාලෝචන ආකාරයෙන් අඛණ්ඩව නිරීක්ෂණය කර ඇත. විශ්වවිද්‍යාල සනාතන සභාව සහ පාලක සභාව මගින් තමන්ගේ මාසික රැස්වීම්වලදී IQAU හි ක්‍රියාකාරකම් සමාලෝචනය කරයි.

අභ්‍යන්තර තත්ව සහතික ඒකකය නව පරිපාලන ගොඩනැගිල්ලේ 2017 නොවැම්බර් මස විශ්වවිද්‍යාල උප කුලපතිතුමා විසින් විවෘත කර ප්‍රකාශයට පත් කරන ලදී.




මොරටුව විශ්වවිද්‍යාලයේ දී සිය මූලික උනන්දුවක් දක්වන පාර්ශ්වවලට, කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට ඉතා ප්‍රයෝජනවත් අත්දැකීමක් ලබා දීමට විශ්වවිද්‍යාලය කටයුතු කරන අතර තත්ත්ව සහතික ක්‍රමෝපාය මඟින් එහි අරුත හෙළිදරව් කරන්නා වූ දැ පිරිනමයි. ජාත්‍යන්තර පරිමාණයේ විශිෂ්ට විශ්වවිද්‍යාලයකින් ලබා ගත හැකි උත්කෘෂ්ට ඉගෙනුම හා අධ්‍යාපනය වන්නේ කුමක්දැයි පිළිබඳ පැහැදිලි සිතුවමක් ද එමඟින් ලබා දෙයි. තත්ත්ව සහතික ක්‍රමෝපාය (QAS) මඟින් පශ්චාත් උපාධි සහ පර්යේෂණ ඇතුළුව ඉගෙනුම් යෙදවුම් හා අධ්‍යාපන ප්‍රතිඵල සිදු වන බාහිර හා අභ්‍යන්තර සන්දර්භය දෙස බලන අතර එමගින් ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම සහ පවත්වා ගැනීම සඳහා වූ පීය මට්ටමේ නව යාන්ත්‍රණ ද එමඟින් විස්තර කරයි. තනි අධ්‍යානාංශ සහ අංශ දක්වා දිවෙන එහි ජාල සමග මේ සම්බන්ධව පීය මට්ටමේ QA කුටි IQAU සමගින් ක්‍රියා කරයි.

එමෙන්ම, විවිධ පසුබිම්වලින් පැමිණෙන කාර්ය මණ්ඩලයට හා ශිෂ්‍යයන්ට ලද හැකි ඉඩප්‍රස්තාවලින් ප්‍රයෝජන ලැබීමටත්, අධ්‍යාපනික වශයෙන් හා පෞද්ගලිකව දියුණු වීමටත්, ගෝලීය අභියෝගතා සමගින් වෘත්තියකට ඇතුළු වීමේ දැනුම සහ කුසලතා සංවර්ධනය කර ගැනීමට සහ පිටත වැඩ ලෝකයේ සාර්ථකත්වයට දායක වීමට සහ පශ්චාත් උපාධි සුදුසුකම් සහ පර්යේෂණ හරහා වෘත්තියක් සොයාගෙන යාමට හැකි වන්නේ නම්, ඔවුන්ට අවශ්‍ය වන්නේ කුමක් ද යන්න පිළිබඳව ද තත්ත්ව සහතික ක්‍රමෝපාය (QAS) අවධානය යොමු කරයි. ඉගැන්වීම්වල ගුණාත්මකභාවය, පර්යේෂණ, උපදේශනය සහ ඒ කෙරෙහි ආයතනය තබන අගය මෙහි කොටසක් වන අතර මොරටු ව විශ්වවිද්‍යාලයේ කටයුතු මේ සම්බන්ධව ඇති වෘත්තීය විශිෂ්ටත්වයට සමගාමීව පවතින බව තහවුරු කිරීම සැලසුම් කිරීම පිණිස වූ කටයුතු තත්ව සහතික ක්‍රමෝපායට (QAS) ඇතුළත් වේ.

තවද, ඉගැන්වීම් ප්‍රතිඵල, කාර්ය සාධන ඇගයීම්, පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ ව්‍යාපාර යනාදිය එකිනෙකට ඌනපූරක වන බවත් ඒවායේ අන්තර්සම්බන්ධතාව සම්බන්ධව අද්විතීය දැක්මක් පිහිටුවීමට ආධාර කරන බවටත් තත්ත්ව සහතික ක්‍රමෝපාය (QAS) සලකයි. ගෝලීය අභියෝග හමුවේ දිනෙන් දින තරඟකාරී වන පරිසරයක් තුළ, තනි පුද්ගලයන්ට හා සමාජයට අවශ්‍ය වන දැ සැපයීමට වර්ධනය වන පීඩනය හමුවේ සහ ආයතනය එහි තරඟකරුවන්ගෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා අංශවල විවිධතා විදහා දැක්වීමේ මොරටුව විශ්වවිද්‍යාලයේ මෙහෙවර නැවත තහවුරු කර ගැනීමට තත්ව සහතික ක්‍රමෝපායන් (QAS) උපකාරී වේ. විශේෂයෙන්ම ඇගයීමේ ගුණත්වය සහ සියලු අධ්‍යයන ප්‍රලේඛනය ඉහළ නැංවීමේ අදහසින් ලේඛන චෞර්යයට අදාළව මොරටුව විශ්වවිද්‍යාලය මෙම සන්දර්භය තුළ අදාළ ප්‍රතිපත්ති කිහිපයක් සංවර්ධනය කර ඇත. විශ්වවිද්‍යාලය සැමවිටම පෝෂණය කළ අගයන් පහත හෙළීමකින් තොරව වෙනස්කම් සමඟ වඩා හොඳින් කටයුතු කිරීමේ හැකියාව එමඟින් විශ්වවිද්‍යාල වෙත සැපයිය යුතුය.

ලොව ප්‍රමුඛ විශ්වවිද්‍යාලයක් වීමේ අපගේ දැක්ම උදෙසා, මොරටුව විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීමෙන් ඉහළ යාමට උත්සාහ දරමින් සිටින අතර 2015 ජූලි මස මොරටුව විශ්වවිද්‍යාලය ලෝක විශ්වවිද්‍යාලවල වෙබෝමෙට්‍රික්ස් ශ්‍රේණිගත කිරීම්වලදී ශ්‍රී ලංකාවේ තෙවන හොඳම විශ්වවිද්‍යාලය වූයේ පේරාදෙනිය විශ්වවිද්‍යාලයට වඩා එක් ශ්‍රේණිගත කිරීමක් පහළින් සිටිමිනි, දකුණු ආසියාවේ 56වන ස්ථානයටද ලෝකයේ 2401වන ස්ථානයටද (ඉහළම 20%) පත් විය. වෙබෝමෙට්‍රික්ස් ඇගයීමේ නිර්ණායකවල ස්වභාවය හේතුවෙන් මොරටුව විශ්වවිද්‍යාලය වැනි මධ්‍යම ප්‍රමාණයේ විශ්වවිද්‍යාලයකට තම ස්ථානය වැඩිදියුණු කිරීමට දුෂ්කරය.

ප්‍රථම වරට ආසියානු කලාපයේ විශ්වවිද්‍යාල 12,000 ක් පමණ අතරින් QS ආසියා විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම 2017 (QS AUR 2017) සඳහා සලකා බලන ලද විශ්ව විද්‍යාල 400 අතරින් 291-300 ස්ථානයේ හි මොරටුව විශ්වවිද්‍යාලය ශ්‍රේණිගත වී ඇති අතර මෙයින් මොරටුව විශ්වවිද්‍යාල ආසියාවේ ඉහළම පෙළේ විශ්වවිද්‍යාල 2.5%න් එකක් වේ.

මෙය CILT, IMechE, CText, IChemE, RIBA, RICS, CICES, PAQS වෙතින් ප්‍රථම උපාධි වැඩසටහන් කීපයක් සඳහා ජාත්‍යන්තර පිළිගැනීම පවත්වා ගැනීමට අමතරවය. ඉංජිනේරු අධ්‍යයන සුදුසුකම් සහතික

කිරීමේ ආයතනය වන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) සමගින් 2014 ජූනිවලදී වොෂින්ටන් සම්මුතියෙහි පූර්ණ සාමාජිකයෙකු බවට පත්වෙමින්, දැන් මොරටුව විශ්වවිද්‍යාලයෙන් පිරිනමන සියලු ඉංජිනේරු උපාධි පාඨමාලා ගුණාත්මක වශයෙන් ලොව හොඳම විශ්වවිද්‍යාලවලින් පිරිනමන එම උපාධි පාඨමාලාවලට සමාන බව සැලකේ.

2017 වර්ෂය තුළදී දැනටමත් අත්පත් කරගත් පැවරීම් අළුත් කිරීමට හා අවස්ථා කිහිපයකදී නව පැවරීම් වලදී ප්‍රධාන වශයෙන් පැවරීම් නිල ගමන් කිහිපයක් ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) නැවත පවරන ලද / පවරන ලද විද්‍යාවේදී ඉංජිනේරු උපාධි වැඩසටහන් වර්ෂ 2017 අතරතුර ඉංජිනේරු පීඨය පිරිනමණ ලදී.

විශ්වවිද්‍යාල උපකුලපතිතුමා සභාපතිත්වය දරන, විශ්වවිද්‍යාල නිලධාරීන් සහ සියලු වෘත්තීය සමිතිවල නියෝජිතයන් අතර පවත්වන්නා වූ මාසික "පසුවිපරම" රැස්වීම 2006 වසරේ මාර්තු මාසයේ සිට පවත්වනු ලබන අතර විශ්වවිද්‍යාලයේ ඉලක්ක සාක්ෂාත් කර ගනු වස් විශ්වවිද්‍යාලයේ සහ කාර්ය මණ්ඩලයේ ඵලදායීත්වය වැඩිදියුණු කිරීමේ ක්‍රම හා විධි එහිදී සාකච්ඡාවට භාජනය වේ. මෙයට අමතරව, අදාළ මාසය තුළ විසඳා ගත යුතු ශිෂ්‍ය ප්‍රජාව සම්බන්ධ වැදගත් ගැටළු සාකච්ඡා කිරීම පිණිස වූ උපකුලපතිතුමා සභාපතිත්වය දරණ විශ්වවිද්‍යාල නිලධාරීන් සහ සියලුම ශිෂ්‍ය සමිතිවල කමිටු නිලධාරීන් අතර පවත් වනු ලබන සම්බන්ධතා රැස්වීමක්ද සෑම මාසයකදීම රැස් වේ. තවද පීඨ මට්ටමේ ඇති ශිෂ්‍ය ගැටළු සාකච්ඡා කර විසඳා ගැනීම සඳහා වූ පීඨයේ පීඨාධිපතිගේ සභාපතිත්වය සහිත කාර්ය මණ්ඩල-ශිෂ්‍ය සම්බන්ධතා රැස්වීමක් ද සෑම මාසයකම සියලුම පීඨවල පවත් වනු ලබයි. මෙම සියලු රැස්වීම් විශ්වවිද්‍යාලයේ වාර්ෂික දින දර්ශනයේ ඇතුළත් අංගයන් වේ.

2017 වසර තුළ, පද්ධති වැඩිදියුණු කිරීම සඳහා නව මූලාරම්භ කිහිපයක් ගන්නා ලදී. ශිෂ්‍ය ලියාපදිංචිය, ප්‍රතිඵල සැකසීම, පිටපත් නිකුත් කිරීම, ශිෂ්‍ය සුබසාධනය, සැපයුම් කාර්යය, වාහන වෙන් කිරීම, වත්කම් කළමනාකරණය, ලේඛන පාලනය, ආයතනික කාරණා, කාර්ය මණ්ඩල සංවර්ධනය යනාදිය වැනි පරිපාලන කාර්ය සඳහා කළමනාකරණය තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමේ වැදගත්කම මෙයට ඇතුළත්‍ය. 2017 වසර තුළ, ඇතැම් මොඩියුල යොදවා ඇති අතර අනෙක් ඒවා සංවර්ධන, ක්‍රියාවට නැංවීමේ සහ පරීක්ෂණ ක්‍රියාවලියේ ඇත. අනෙක් මූලාරම්භයන්ට ප්‍රථම වතාවට 653 ක සමස්ථ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ රැකියා විස්තර, විවිධාකාර පරිපාලන කාර්ය සඳහා ක්‍රියාපටිපාටි අත්පොත, සියලුම නව පරිපාලක සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා හුරු කිරීමේ පුහුණුව සහ වෙනත් සමාන ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

### 1.8 පර්යේෂණ මූලාරම්භ

මොරටුව විශ්වවිද්‍යාල පර්යේෂණ සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා අත්‍යවශ්‍ය ක්‍රියාකාරකමක් ලෙසට සලකනු ලබයි. 2015 වසර තුළ අධ්‍යක්ෂ/පර්යේෂණ කාර්යාලය මගින් සහාය දක්වන විශේෂයෙන්ම පර්යේෂණ සඳහා අවධාරණය ඇතිව පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් පිහිටුවනු ලැබීමෙන් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ක්‍රියාකාරකම් සහ පර්යේෂණ සංස්කෘතිය කැපී පෙනෙන ලෙස ප්‍රවර්ධනය වී ඇත.

විශ්වවිද්‍යාලය මගින් පර්යේෂණ උපාධි තුනක් පිරිනමයි, එනම් විද්‍යාපති (පර්යේෂණයේ ප්‍රධාන සංරචකයක් සහිතව), දර්ශනපති (MPhil) සහ වාස්තුවිද්‍යා, ඉංජිනේරු සහ තොරතුරු තාක්ෂණ පීඨ හරහා ආචාර්ය (PhD) උපාධි. FGS මගින් මෙම වැඩසටහන් පරිපාලන ක්‍රියාපටිපාටි විධිමත් කිරීමේ, උසස් තත්ත්වයේ ශිෂ්‍යයන් ආකර්ෂණය කර ගැනීමේ, නව පර්යේෂණ හවුල්කාරත්ව සහ අරමුදල් සැපයීමේ අවස්ථා සොයා ගැනීමේ සහ විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ ධාරිතාව ඉහළ නැංවීමේ ක්‍රමෝපායන් හරහා මෙම වැඩසටහන් ඉහළ නැංවීමට අපේක්ෂා කරයි. FGS මගින් මෙම ප්‍රයත්නයේදී පර්යේෂණ කාර්යාලය සහ ජාත්‍යාන්තර සබඳතා කාර්යාලය සමග සමීපව කටයුතු කරයි. 2017 වසරේදී, 10 ක ආචාර්ය උපාධි ශිෂ්‍යයන් ඇතුළුව, 101 ක නව පර්යේෂණ ශිෂ්‍යයන් පිරිසක් බඳවා ගන්නා ලදී.

විදේශීය විශ්වවිද්‍යාල සමග ඒකාබද්ධ ආචාරය උපාධි පිරිනැමීමට නීතිය අනුව ආචාර්ය උපාධිය යටතේ නව රෙගුලාසියක් සැකසීමේදී FGS උපකාරී විය. මෙම වැඩසටහන යටතේ ප්‍රථම ආචාර්ය උපාධි අපේක්ෂකයා මොරටුව විශ්වවිද්‍යාලය සහ වෝලොන්ගොන් විශ්වවිද්‍යාල මගින් පිරිනමන ඒකාබද්ධ ආචාර්ය උපාධියට 2016 වසරේදී බඳවා ගන්නා ලදී.

වසර 2017 දී තවදුරටත් පර්යේෂණ ඉහළ නැංවීමට සහ පර්යේෂණ ප්‍රතිඵල බෙදා හැරීමට තවත් මූලාරම්භ කිහිපයක් ගන්නා ලදී. මේවාට ඇතුළත් වන්නේ: ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සඳහා ප්‍රදාන (උපාධි අධ්‍යයන හරහා ලබා දුන් රුපියල් මිලියන 5): පිළිගත් විදේශීය විද්‍යාත්ඥයින්ට සත්කාර කිරීම සඳහා ප්‍රදාන (උපාධි අධ්‍යයන පීඨය හරහා රුපියල් මිලියන 3.5); සම්මන්ත්‍රණවලට සහභාගීවීම සඳහා උප කුලපතිතුමාගේ යෝජනා ක්‍රමය සහ උත්පාදිත අරමුදල් භාවිතයෙන් විවෘත ප්‍රවේශ ප්‍රකාශයට පත් කිරීම (සනාතන සභාවේ පර්යේෂණ කමිටුව හරහා); සහ වැඩිදියුණු කළ මිණුම් ලකුණු සමග සහ තනි වර්ෂයක කාර්ය සාධනයක් මත පදනම්ව සංශෝධිත ත්‍යාග ක්‍රමය. ඊට අමතරව, 2017 වසර තුළ, පර්යේෂණ පරිපාලනයට සහ කළමනාකරණය පද්ධතියට වැඩිදියුණු කිරීම, විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ සහ බෙදා හැරීමේ

ධාරිතාව ඉහළ නැංවීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ කිහිපයක් පැවැත්වීම ඇතුළු විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා FGS මගින් බොහෝ මූලාරම්භයන් හඳුන්වා දෙන ලදී.

ජාත්‍යන්තරව සහ දේශීයව යන දෙයාකාරයෙන්ම බාහිර අරමුදල් සැපයීමේ නියෝජිතායතනවලින් පර්යේෂණ සඳහා අරමුදල් ලබා දීම සුරක්ෂිත කිරීමට විද්‍යාර්ථීන්ට උනන්දු කරන ලදී. 2017 වසරේදී, විශ්වවිද්‍යාලයට බාහිර අරමුදල් සැපයීමේ නියෝජිතායතනවලින් රුපියල් මිලියන 11.3 ක් ලැබුණි. එය පසුගිය වසරට සාපේක්ෂව ඉතාමත් කැපී පෙනෙන වර්ධනයකි. ඊට අමතරව, විශ්වවිද්‍යාලය සනාතන සභාවේ පර්යේෂණ කමිටුව (SRC) හරහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පර්යේෂන ව්‍යාපෘතිවලට අරමුදල් සපයන ලදී. 2017 වසර තුළ, SRC මගින් කෙටිකාලීන ප්‍රදාන 45, දිගු කාලීන ප්‍රදාන 27, ජාතික සංවර්ධන ප්‍රදාන 1 සහ ප්‍රාග්ධන දිරිගැන්වීමේ ප්‍රදාන 4 ඇතුළු මුළු එකතුව රුපියල් මිලියන 68 ක් ප්‍රදානය කරන ලදී.

81 න් 33 ක අධි සම්මාන ත්‍යාග සමගින් පර්යේෂණ විශිෂ්ටතා ත්‍යාගවල වැඩිවීම මගින් ඉහත මූලාරම්භ සහ ක්‍රියා පර්යේෂණ කාර්ය සාධනය වැඩිදියුණු කර ඇත. එමෙන්ම එය 2013 වසරේදී 12 සිට 2014 වසරේදී 21, 2015 වසරේදී 40, 2016 වසරේදී 66, සහ2017 වසරේදී 138 දක්වා සුචිගත කළ ජර්නලවල උසස් තත්ත්වයේ ප්‍රකාශන වැඩිදියුණු කර ඇත (පසුගිය වසරට සාපේක්ෂව 101% ක වර්ධනයකි). මුළු ප්‍රකාශන සංඛ්‍යාවද 2016 වසරේදී 240 සිට 2017 වසරේදී 301 දක්වා වැඩි විය (25% වැඩිවීමකි).

මෙම මූලාරම්භ සහ ක්‍රියාකාරකම් පර්යේෂණ එළිදැක්වීම්වල කැපී පෙනෙන සීඝ්‍ර වර්ධනයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ - පර්යේෂණ උපාධි සහ ප්‍රකාශන සංඛ්‍යාව, පර්යේෂණ සහ ප්‍රකාශනවල තත්ත්වය, පර්යේෂණ අරමුදල් සැපයීම සහ පර්යේෂණ සහයෝගීතා.

## 1.9 ජාත්‍යන්තරකරණය

මොරටුව විශ්වවිද්‍යාලය 2017 වසර තුළ දී ජාත්‍යන්තරකරණය සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදී. මොරටුව විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පෙනුම වැඩිදියුණු කිරීම සඳහා විවිධ ක්‍රමවේද යොදා ගැනීමට අවධානය යොමු කිරීමේ පරමාර්ථය ඇතිව 2015 සැප්තැම්බර් මස ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අධ්‍යක්ෂකවරයෙක් පත් කරන ලදී. ඒකාබද්ධ උපාධි ආරම්භ කිරීම, ජාත්‍යන්තර ශිෂ්‍යයින් ආකර්ෂණය කර ගැනීම, ජාත්‍යාන්තර සංචාරවලට පහසුකම් සැපයීම, අපගේ ශිෂ්‍යයන් සඳහා ජාත්‍යාන්තර විශ්වවිද්‍යාලවලට පත් කිරීමට පහසුකම් සැපයීමට, අන්තර්ජාතික විශ්වවිද්‍යාල සමඟ ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම්වලට එළඹීමට ආදිය සඳහා කටයුතු සිදු කරන ලදී. 2017 වසර තුළ ඇතැම් ක්‍රියාකාරකම්වලට විය හැකි සහයෝගීතාවන් මූලාරම්භ කිරීමට මොරටුව විශ්වවිද්‍යාලය වෙත ජාත්‍යන්තර විශ්වවිද්‍යාල 12කින් කළ සංචාර ඇතුළත් වන අතර වර්තමානයේදී මොරටුව විශ්වවිද්‍යාලය සතුව ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමග ගිවිසුම් 25ක් සහ අවබෝධතා ගිවිසුම් 12 ක් ඇති අතර ඇතැම් ඒවා ඉතාමත් සක්‍රියය.

2017 වසරේදී, විශ්වවිද්‍යාල සහ ආයතන 8 ක් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් කරන ලදී. සැලකිය යුතු සක්‍රිය සහයෝගීතාවලට මෙකට්‍රෝනික් ක්ෂේත්‍රයේ විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ ෂැන්ඩොන්ග් විශ්වවිද්‍යාලය; ලැට්වියාවේ තාක්ෂණය පිළිබඳ රිගා ආයතනය සමග උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි ශිෂ්‍ය හුවමාරු වැඩසටහන; ඕස්ට්‍රේලියාවේ වොලොන්ගොන් විශ්වවිද්‍යාලය සහ මොරටුව විශ්වවිද්‍යාලය අතර ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහනක් පිහිටුවීම; ගොඩනැගිලි ආර්ථික අධ්‍යයනාංශය සහ ලිවර්පූල් ජොන් මුවර්ස් විශ්වවිද්‍යාලය අතර සහයෝගීතාව; බටහිර ඔස්ට්‍රේලියානු විශ්වවිද්‍යාලය සමග අපද්‍රව්‍ය ප්ලාස්ටික් අගය එකතු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය; ව්‍යවහාරික විද්‍යාව පිළිබඳ මුන්ස්ටර් විශ්වවිද්‍යාලය සමග ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන; ජපානයේ ෂිබුරා තාක්ෂණික ආයතනය සමඟ අධ්‍යාපනික හුවමාරු හා සහයෝගීතාව; ජපානයේ හිරෝෂිමා විශ්වවිද්‍යාලය සමඟ අධ්‍යයන හා අධ්‍යාපන හුවමාරුව; ජර්මනියේ බ්‍රිමෙන් විශ්වවිද්‍යාලය සහ මොරටුව විශ්වවිද්‍යාලය අතර සහයෝගීතාව ඇතුළත් වේ.

2017 වසර තුළ පශ්චාත් උපාධි හාදාරණ විදේශීය ශිෂ්‍යයන් 7 දෙනෙක් ලියාපදිංචි කර ඇත. වර්තමානයේදී මොරටුව විශ්වවිද්‍යාලයේ 25 දෙනෙකුට වැඩි පූර්ණ කාලීන විදේශීය ශිෂ්‍යයන් සිටී. ඊට අමතරව, විදේශීය ශිෂ්‍යයන් විවිධාකාර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් යටතේ මොරටුව විශ්වවිද්‍යාලයේ ගත කරන යෝජනා ක්‍රම කීපයක් තිබේ.







## 1.10 ක්‍රීඩා සහ විනෝදාස්වාද ක්‍රියාකාරකම්

2017 වසරේදී මොරටුව විශ්වවිද්‍යාලය මගින් ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේදී ශූරතා කිහිපයක්ම දිනා ගත් අතර, අන්තර් විශ්වවිද්‍යාල කැරම් පිරිමි ශූරතාව, අන්තර් විශ්වවිද්‍යාල ඔරු පැදීමේ පිරිමි ශූරතාව, අන්තර් විශ්වවිද්‍යාල මේස පන්දු කාන්තා ශූරතාව සහ අන්තර් විශ්වවිද්‍යාල අත්පන්දු පිරිමි ශූරතාව මේ අතර වේ. එපමණක් නොව මොරටුව විශ්ව විද්‍යාලය බැඩ්මින්ටන්, මේස පන්දු, පිහිනීම සහ ටෙනිස් වැනි ක්‍රීඩා කිහිපයකින් චීනයේ තායිපෙ පැවති ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල 2017 හි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පිරිමි සහ කාන්තා කණ්ඩායම් නියෝජනය කළහ.

මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වර්ණ සම්මාන ප්‍රදානෝත්සවය 2017 දී සිසුන් 441 දෙනෙක් 2016 වර්ෂය තුල ක්‍රීඩා වලදී ඔවුන්ගේ කාර්ය සාධනය සඳහා විශ්වවිද්‍යාල වර්ණ විය. විශිෂ්ටතම ක්‍රිඩකයන් එක්එක් සහ සෑම ක්‍රිඩාවකම හොඳම ක්‍රිඩකයා සම්මානයෙන් පිදුම් ලැබීය. විශේෂ සම්මාන එනම් ඉහලම **GPA** සහිත පළමු වසර වර්ණලාභියා සඳහා Memorial Challenge Trophy, ඉහලම **GPA** සහිත දෙවන වසර වර්ණලාභියා සඳහා සම්මාන, 2017 දකුණු ආසියාතික කරාටේ ශූරතාවලියේදී ශ්‍රී ලංකාව නියෝජනය කරන විශිෂ්ටතම ක්‍රිඩකයා සහ විශිෂ්ටතම ශිෂ්‍යයා (ක්‍රිඩා හා අධ්‍යාපනික) පිරිනමණ ලදී.

කැළණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද 2017 ඔක්තෝබර් මාසයේදී පැවැත්වූ ආරාධිත විශ්වවිද්‍යාලය සහ උසස් අධ්‍යාපන ආයතනික කැරම් ශූරතාවලියක'Grip to Grip' දී පිරිමි ශූරතාව මොරටුව විශ්ව විද්‍යාලය දිනා ගත්හ. මොරටුව විශ්වවිද්‍යාල අත් පන්දු කණ්ඩායම 2017 සැප්තැම්බර් මස NDES අත් පන්දු තරඟාවලියේ ශූරතාව දිනූ අතර මොරටුව විශ්වවිද්‍යාලයේ කාන්තා මේස පන්දු කණ්ඩායම කැළණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කරන ලද SIEG මේස පන්දු ශූරතාවලියේ ශූරතාව දිනා ගත්හ.




2017 වසර තුළ මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයනාංශ, පීඨ හා සිසුන්ගේ සමාජ සහ සංගම් විසින් විවිධ ක්‍රිඩා හා විනෝදාත්මක, සංස්කෘතික සහ ප්‍රජා සත්කාරක වැඩසටහන් සංවිධානය කරන ලදී. ප්‍රවාහන හා කාර්ය සම්පාදන කළමනාකරණ අධ්‍යයනාංශයේ ප්‍රවාහන හා කාර්ය සම්පාදන සංගමය විසින් සංවිධානය කරන ලද TranSPORTZ 2017, සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශ විසින් සංවිධානය කරන ලද Fashion Premier League (FPL), විලාසිතා නිර්මාණ ශිෂ්‍ය සංගමයේ වාර්ෂික ක්‍රිකට් තරඟාවලිය (FDSS), "Civil Cric Fiesta 2017", තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශයේ ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද "FIT Sixes", the annual cricket extravaganza 2017දී පවත්වන ලද එවැනි ක්‍රිඩා ඉසව් වේ.

මොරටුව විශ්වවිද්‍යාලය "පිරිත් සජ්ජායනාවක්" සහ දානයක් නව පරිපාලන ගොඩනැගිල්ලට සහ ජනතාවට ආශිර්වාදය ඇති කිරීමේ අරමුණ සමඟ සාර්ථකව සංවිධානය කරන ලද අතර තවද 2017 දී පිරිත් සජ්ජායනා ගොඩනනැගිලි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, සිවිල් ඉංජිනේරු සංගමය සහ රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු අධ්‍යයනාංශය විසින් සංවිධානය කරන ලදී.

සිවිල් ඉංජිනේරු සංගමය, තාක්ෂණ කළමනාකරණ පීඨයේ MOT 2017 හි ව්‍යාපාර පරිපාලනවේදී ශිෂ්‍යයන් සහ තොරතුරු තාක්ෂණ පීඨයේ ශිෂ්‍ය සංගමය විසින් අලුත් අවුරුදු උත්සව සංවිධානය කරන ලද අතර සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ ඇතුලත් කිරීම 2014 විසින් "Civil Padura 2017", ගොඩනැගිලි ආර්ථික විද්‍යා ශිෂ්‍ය සංගමය විසින් "සරසවි ගී සිසිල", TLM අධ්‍යයනාංශයේ උපාධි අපේක්ෂකයන් විසින් "Rhythm Divine" සහ භූ සම්පත් ඉංජිනේරු සංගමය විසින් "ERE Unplugged 17" යන සංගීත වැඩසටහන් කිහිපයක් සංවිධානය කරන ලදී.

වෙනත් වාර්ෂික වැඩසටහන් කිහිපයක් අතරින් ප්‍රවාහන හා කාර්ය සම්පාදන සංගමය (STL) විසින් "Sneha 2017" , සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය විසින් "Suhastha", ගොඩනැගිලි ආර්ථික විද්‍යා ශිෂ්‍ය සංගමය (BESS) විසින් "අකුරට සවියක් 2017" සහ භූ සම්පත් ඉංජිනේරු සංගමය (ERES) විසින් "ගුරු ගෙදරට අරුණැල්ලක් 2017" ආදිය වර්ෂ 2017 අතරතුරදී සංවිධානය කරන ලද නොයෙක් ප්‍රජා සත්කාරක වැඩසටහන්වලින් කිහිපයකි.

**1.11 සීමා**

2014-2018 SMP හි 1-8 දක්වා වූ ඉලක්කවල පරමාර්ථ බොහොමයක් සැලකිය යුතු ලෙස අත් කර ගෙන ඇත. කෙසේ වුවද, මොරටුව විශ්වවිද්‍යාලයට රජයේ අරමුදල් මත යැපෙන්නට සිදු වී ඇති ක්ෂේත්‍ර සම්බන්ධව සහ තීරණ ගැනීමේ ස්වාධීනත්වයේ මඳ නිසා ඉලක්ක හා පරමාර්ථ තවදුරටත් සාක්ෂාත් කර ගත යුතුව ඇත.

- වේතනය සහ වෙනත් දිරි දීමනාවල අඩු කම හේතුවෙන් ව්‍යාපෘති කළමනාකරු සහ වැඩ ඉංජිනේරු යන තනතුරුවලට සුදුසුකම්ලත් සහ පුහුණු වෘත්තිකයන් බඳවා ගැනීමට විශ්වවිද්‍යාලයට අතිශයින්ම අසීරු වී ඇති නිසා ව්‍යාපෘති කළමනාකරණය සහ නඩත්තු කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමේ බරපතල බාධා ඇත. එම තත්ත්වයම විදුලි අධීක්ෂක වැනි සහායක තනතුරුවලට අදාළ වේ. උත්සාහයන් කිහිපයකට පසුව පවා බඳවා ගැනීමට විශ්වවිද්‍යාලය අසමත් වූ අතර මෙයට විසඳුමක් සොයා ගත යුතුව ඇත.

- උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෙනස්වන තත්ත්වයන්ට මුහුණ දීම පිණිස රාජ්‍ය විශ්වවිද්‍යාල විකාශනය වන අවශ්‍යතාවයන් සපුරාලීමට නව සේවක සංඛ්‍යාවක් හඳුන්වා දීම අත්‍යවශ්‍ය වේ. විශ්වවිද්‍යාලීය ව්‍යාපාර සම්බන්ධතා, පහසුකම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණ සේවා සහ නායකත්වය, ඊ-ඉගෙනුම් ප්‍රවර්ධනය, අලෙවිකරණය සහ මාධ්‍ය වැනි නව කාර්යයන් සඳහා සුදුසුකම් ලත් වෘත්තිකයන් අවශ්‍ය වේ. මෙම විකාශනය වන අවශ්‍යතාවයන් සඳහා විශ්වවිද්‍යාලය එවැනි සේවක සංඛ්‍යාවකින් තොරව මහත් පරිශ්‍රමයක් දරමින් සිටින අතර අනුමත කිරීමේ ක්‍රියාව වේදනාකාරී වේ.

- ප්‍රසම්පාදන සම්බන්ධ ගැටළු සහ කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල ක්‍රියාකාරිත්වය නිසා ගොඩනැගිලි ඉදිකිරීම් කිහිපයක් සැලකිය යුතු ලෙස පසුබෑමකට ලක්ව ඇත. බොහෝ ගැටලු නිසා කාර්යක්ෂම කොන්ත්‍රාත්කරුවකුගේ සේවාවන් ලබාගැනීම අපහසුය. උපදේශකයන්ද අකාර්යක්ෂමය. විශ්වවිද්‍යාලයෙන් හොඳ ව්‍යාපෘති කළමනාකරුවෙකු නොමැති විට ගැටලු සංකීර්ණ වී ඇති අතර අනිවාර්ය ප්‍රමාදයන් ප්‍රතිඵල වේ.

- නේවාසික නවාතැන් පහසුකම් වැඩි කිරීම ප්‍රශංසනීයයි. කෙසේවෙතත්, සියලු පුනරාවර්තන අවශ්‍යතා සපුරාලීමට විශ්වවිද්‍යාලවලට ලබා දෙන පුනරාවර්තන අරමුදල් ප්‍රමාණවත් නොවන අතර සම්මත තත්ත්වයකින් නේවාසිකාගාර පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් මෙහෙයුම් හා නඩත්තු අරමුදල් තිබිය යුතුය. රජයෙන් එවැනි අරමුදල් ලබා නොදෙනුයේ නම්, එවැනි නඩත්තු කටයුතු සඳහා අවම වශයෙන් අරමුදල් කොටසක් හෝ සපුරාලීම සඳහා නේවාසික ගාස්තු වැඩි කිරීමට බලධාරීන් විසින් සාමූහික තීරණයක් ගත යුතුය.

- විශ්වවිද්‍යාලය පිහිටා ඇත්තේ මොරටුව, කටුබැද්දේ පිහිටි අක්කර 53 ක ඉඩමකයි. වසර ගණනාවක් තිස්සේ කරගෙන යමින් පවතින පුළුල් කිරීමේ කටයුතු හේතුවෙන් අද වන විට මෙම භූමියේ ඉඩ ප්‍රමාණය ඉතා සීමා වී ඇත. ඉඩ සම්බන්ධව ඇති මෙම සීමාවන් මඟහරවා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාලය සිරස් ගොඩනැගිලි ඉදි කිරීමේ උපාය මාර්ගය දියත් කිරීමට උත්සාහ දරා ඇත. විශ්වවිද්‍යාලයක් සඳහා මහෝපකාරී වන පරිසරයක් පවත්වා ගැනීමට අවශ්‍ය සන්දර්භයක් තුළ මෙම ක්‍රමෝපාය මඟින් අදාළ ගැටලුවට සම්පූර්ණ විසඳුමක් ගෙන දෙනු ඇතැයි අපේක්ෂා කළ නොහැක. මෙලෙස, නේවාසිකාගාර පහසුකම් පුළුල් කිරීම සහ අධ්‍යයන ක්‍රියාකාරකම් යන අංශ දෙකින්ම මොරටුව විශ්වවිද්‍යාලයට නව ඉඩම් අත්පත් කර ගැනීම අත්‍යවශ්‍යය. අධ්‍යයන වැඩසටහන්වල පුළුල් වීම සඳහා අඩු තරමින් අක්කර 10-15ක් වූ වඩා විශාල ඉඩම් කැබැල්ලක් අවශ්‍ය වේ.

- 2016 වසරේ පිළිගැනීමේ අවශ්‍යතා ළඟා කර ගැනීමට උපකරණ ඉහළ දැමීම සඳහා ඉංජිනේරු පීඨයට උපකරණ ප්‍රසම්පාදනය කිරීමට රු. මිලියන 500 ක විශේෂ අරමුදලක් වෙන් කිරීම වෙනුවෙන් මොරටුව විශ්වවිද්‍යාලය රජයට ස්තුතිවන්ත වේ. කෙසේ වෙතත්, ජාත්‍යන්තර මට්ටමේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම සඳහා අත්‍යවශ්‍ය වන ජාත්‍යන්තර පිළිගැනීම රඳවා ගැනීමට මෙම ආකාරයේ අරමුදල් පවත්වා ගත යුතුය. 2017 දී ප්‍රාග්ධන අරමුදල් සඳහා ප්‍රතිපාදන සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර එය නවීන පහසුකම් පවත්වා ගැනීමට අපහසු වේ. මේ නිසා SMP සමග සංසන්දනය කිරීමේදී විශ්වවිද්‍යාලයේ ප්‍රගතිය ප්‍රමාදවීමට ද හේතු වී තිබේ. මොරටුව විශ්වවිද්‍යාලය සැබැවින්ම අන්තර්ජාතික විශ්වවිද්‍යාලයකට ක්‍රමයෙන් පරිවර්තනය කිරීම සඳහා 2011 දී (රුපියල් මිලියන 100) සහ 2012 දී (රුපියල් මිලියන 75) ලබා දුන් අමතර අරමුදල් පසු වසරවල ලබා දී නැත. අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වීමට එවැනි අමතර අරමුදල් සැපයීම අත්‍යාවශ්‍යය.

- නවෝත්පාදනය කිරීම, තාක්ෂණ සංවර්ධනය කිරීම, කඩිනම් ආර්ථික වර්ධනය සඳහා වූ ක්‍රමෝපායන් ලෙස නව්‍ය ව්‍යාපාර වාණිජකරණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස විශ්වවිද්‍යාලවලට අන්තර්ජාතිකව

කීර්තිමත් අනෙක් විශ්වවිද්‍යාල මෙන් බීජෞෂක පිහිටුවීමට හැකියාව තිබිය යුතුය. විශ්වවිද්‍යාලවල ඇති බීජෞෂකවලට අලාභ දැරිය නොහැකි බැවින් ඒවා නෛතිකව අවසර දෙනු නොලැබේ. බීජෞෂනයට අවශ්‍ය වන්නේ: බීජාධාර සහ සාර්ථකත්වය පිළිබඳව සහතිකයක් නොමැතිව ආධාර, හිමිකාරත්වය සඳහා නෛතික යාන්ත්‍රණය. අවදානම් දැරිය හැක්කේ ශ්‍රී ලංකා නිමැවුම්කරුවන්ගේ කොමිසමට පමණි. එසේම, විශ්වවිද්‍යාලවලම වාණිජකරණය වූ තාක්ෂණය සඳහා කොටස්කරුවෙක් වීමේ දී ව්‍යාපාර කාර්යයන්වලට එම විශ්වවිද්‍යාලවලටම හවුල්කරුවෙක් විය නොහැකිය කළ හැකි එකම දේ වන්නේ එවැනි සොයා ගැනීම් සඳහා කර්තෘභාරයක් ලබා ගැනීම හෝ තාක්ෂණ සම්පූර්ණයෙන්ම විකිණීම පමණි. විශ්වවිද්‍යාලය මගින් දැන් පේටන්ට් ගණන, වාණිජකරණය කළ තාක්ෂණ ගණන සහ නව්‍ය ව්‍යාපාර ගණන ප්‍රධාන කාර්ය සාධන දර්ශක ලෙස සලකා බලින් සිටින නිසා මෙම ප්‍රතිපත්තියට වෙනසක් අවශ්‍යය.

- පර්යේෂණ සහ සංවර්ධන කාර්යය විශේෂයෙන්ම සංවර්ධනයට නැඹුරු වූ පර්යේෂණ සහ සංවර්ධන කාර්යය සිදු කිරීමට විශ්වවිද්‍යාල දිරිගන්වයි. කාර්මාන්ත ගැටලු සඳහා එවැනි ඉලක්ක නැඹුරු වූ පර්යේෂණ සහ සංවර්ධන විසඳුම්වලට බොහෝ ඉල්ලීම් තිබේ. කෙසේ වෙතත්, නිතරම ප්‍රමාදයන් සඳහා විශ්වවිද්‍යාල නිතරම දෝෂාරෝපණයට ලක් වන අතර සමහර අවස්ථාවල එවැනි ව්‍යාපෘති නියමිත වේලාවට නිමකර දීමේ දුෂ්කරතා නිසා විශ්වවිද්‍යාලවලට ලබා නොදේ. එයට එක් හේතුවක් වන්නේ වැඩි කාලයක් ගන්නා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමට ඇති අවශ්‍යතාවයි. පර්යේෂණ ප්‍රසම්පාදනය කලින් සැලසුම් කළ නොහැකි අතර මේ නිසා ඉක්මන් ප්‍රසම්පාදනයක් අවශ්‍යය. සුපුරුදු මාර්ගෝපදේශවලින් බැහැර වීම බොහෝ විගණන විමසුම්වලට හේතු වේ. පර්යේෂණ කාර්යය වෙනුවෙන් ප්‍රසම්පාදනය සඳහා බොහෝ රටවලට විශේෂ මාර්ග තිබේ. මෙම ගැටලුවෙන් මිදීමට මොරටුව විශ්වවිද්‍යාලය තමන්ගේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් අනුමැතිය සඳහා මූල්‍ය සහ ක්‍රමෝපාය අමාත්‍යාංශයට ඉදිරිපත් කළ අතර පසුව මෙම මාර්ගෝපදේශ සමාලෝචනය කරන ලද අතර වසර තුනකට පමණ පෙර මෙම ගැටලුව විසඳීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් තවත් යෝජනාවක් ඉදිරිපත් කළේය. එවැනි ප්‍රමාද මග හැරීමට මෙම අවහිරය ඉතාමත් ඉක්මනින් ඉවත් කරනු ඇතැයි ඉතාම ඕනෑකමින් අපේක්ෂා කරමු.

පසුගිය වසර කිහිපය තුළ මොරටුව විශ්වවිද්‍යාලය අත් කරගෙන ඇති ජයග්‍රහණ රජය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගනු ඇතැයි ද විශ්වවිද්‍යාලයේ ක්‍රමෝපායික සැලැස්මේ ඉලක්ක හා අරමුණු ඉටු කර ගැනීමට හා **''වඩාත්ම ගෝලීයව පිළිගත් දකුණු ආසියාවෙහි දැනුම් ව්‍යවසාය බවට පත් වීම''** සඳහා වූ එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම පිණිස සහාය වනු ඇතැයි ද අවංකවම බලාපොරොත්තු වෙමි.

## 2. සම්පත් සහ ශිෂ්‍යයන්

### a. සාරාංශය

| පීඨය/ අංශය/ මධ්‍යස්ථානය | මුළු උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව* | | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය* | | | | මුළු පරිපාලන කාර්ය මණ්ඩලය** | | මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය*** | | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය**** | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | | කොන්ත්‍රාත් | | | | | | | |
| | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| වාස්තු විද්‍යා පීඨය | 1950 | 2324 | 78 | 78 | 16 | 22 | 1 | 1 | 7 | 18 | 59 | 58 |
| ව්‍යාපාර පීඨය | - | 98 | | 10 | | 5 | | | | 5 | 3 | 1 |
| ඉංජිනේරු පීඨය | 4663 | 5601 | 243 | 226 | 36 | 43 | 2 | 2 | 78 | 73 | 195 | 201 |
| තොරතුරු තාක්ෂණ පීඨය | 1422 | 1719 | 28 | 30 | 1 | 1 | 1 | 2 | 26 | 30 | 37 | 42 |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | | | | | | 1 | | 1 | | | 3 | 2 |
| අංශ සහ මධ්‍යස්ථාන | | | 7 | 7 | | | 21 | 26 | 8 | 7 | 372 | 334 |
| මුළු එකතුව | 8035 | 9742 | 356 | 351 | 53 | 72 | 25 | 32 | 119 | 133 | 669 | 638 |

සටහන්-
[1] වාස්තු විද්‍යාවේදී
[2] නිර්මාණවේදී
[3] ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී
[4] නගර සහ ග්‍රාම නිර්මාණය පිළිබඳ විද්‍යාවේදී
[5] පහසුකම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී
[6] භූමිනිර්මාණවේදී
[7] ඉංජිනේරු විද්‍යාවේදී (MPR)
[8] ඉංජිනේරු විද්‍යාවේදී (භූ සම්පත්)
[9] විද්‍යාවේදී ඉංජිනේරු (පේෂකර්ම සහ රෙදිපිළි තාක්.)
[10] ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී
[11] විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ නිර්මාණවේදී
[12] තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී
[13] තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී

* වසර තුළ දෙන ලද ඕනෑම අවස්ථාවක උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව.

** ලේඛකාධිකාරි, මූල්‍යාධිකාරි, නියෝජ්‍ය ලේඛකාධිකාරි/මූල්‍යාධිකාරි, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/ මූල්‍යාධිකාරි, සහකාර ලේඛකාධිකාරි/ මූල්‍යාධිකාරි, නියෝජ්‍ය අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ/ ශාරීරික අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා නිලධාරීන්, වැඩ ඉංජිනේරු, පාලක, ප්‍රධාන ආරක්ෂක නිලධාරි (2017 දෙසැම්බර්31 දිනට).

*** ස්ථිර අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත්තුමය අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය සහ තාවකාලික උපදේශකවරුන් (2017 දෙසැම්බර්31 දිනට).

**** ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත්තුමය සහ තාවකාලික අනධ්‍යයන කාර්ය මණ්ඩලය (2017 දෙසැම්බර් 31 දිනට).

## b. විස්තර

| පීඨය/ අංශය/ මධ්‍යස්ථානය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව* | | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය* | | | | මුළු පරිපාලන කාර්ය මණ්ඩලය** | | මුළු අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය*** | | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය**** | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2016 | 2017 | ස්ථිර | | කොන්ත්‍රාත් | | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| | | | | 2016 | 2017 | 2016 | 2017 | | | | | | |
| වාස්තු විද්‍යා පීඨය | AT 1 | 370 | 430 | 78 | 78 | 16 | 22 | 01 | 01 | 07 | 18 | 59 | 58 |
| | AD 2 | 203 | 258 | | | | | | | | | | |
| | QS 3 | 573 | 698 | | | | | | | | | | |
| | TCP 4 | 321 | 369 | | | | | | | | | | |
| | FM 5 | 276 | 326 | | | | | | | | | | |
| | BLA6 | 207 | 243 | | | | | | | | | | |
| **උප එකතුව** | | **1950** | **2324** | **78** | **78** | **16** | **22** | **01** | **01** | **07** | **18** | **59** | **58** |
| ව්‍යාපාර පීඨය | | - | 98 | - | 10 | - | 05 | | | | 05 | 03 | 01 |
| **උප එකතුව** | | **-** | **98** | **-** | **10** | **-** | **05** | | | | **05** | **03** | **01** |
| ඉංජිනේරු පීඨය | MPR 7 | 3587 | 4308 | 243 | 226 | 36 | 43 | 02 | 02 | 78 | 73 | 195 | 201 |
| | EM 8 | 266 | 314 | | | | | | | | | | |
| | TM 9 | 302 | 361 | | | | | | | | | | |
| | TLM 10 | 283 | 343 | | | | | | | | | | |
| | FD 11 | 225 | 275 | | | | | | | | | | |
| **උප එකතුව** | | **4663** | **5601** | **243** | **226** | **36** | **43** | **02** | **02** | **78** | **73** | **195** | **201** |
| තොරතුරු තාක්ෂණ පීඨය | AT 1 | 928 | 1126 | 28 | 30 | 01 | 01 | 01 | 02 | 26 | 30 | 37 | 42 |
| | ITM 13 | 494 | 593 | | | | | | | | | | |
| **උප එකතුව** | | **1422** | **1719** | **28** | **30** | **01** | **01** | **01** | **02** | **26** | **30** | **37** | **42** |
| පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | | | | | | | 01 | | 01 | | | 03 | 02 |
| **උප එකතුව** | | | | | | | **01** | | **01** | | | **03** | **02** |
| අංශ සහ මධ්‍යස්ථාන | | | | 07 | 07 | - | | 21 | 26 | 08 | 07 | 372 | 334 |
| **උප එකතුව** | | | | **07** | **07** | | | **21** | **26** | **08** | **07** | **372** | **334** |
| **මුළු එකතුව** | | **8035** | **9742** | **356** | **351** | **53** | **72** | **25** | **32** | **119** | **133** | **669** | **638** |

සටහන්-
[1] වාස්තු විද්‍යාවේදී
[2] නිර්මාණවේදී
[3] ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ විද්‍යාවේදී
[4] නගර සහ ග්‍රාම නිර්මාණය පිළිබඳ විද්‍යාවේදී
[5] පහසුකම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී
[6] භූමිනිර්මාණවේදී
[7] ඉංජිනේරු විද්‍යාවේදී (MPR)
[8] ඉංජිනේරු විද්‍යාවේදී (භූ සම්පත්)
[9] විද්‍යාවේදී ඉංජිනේරු (පේෂකර්ම සහ රෙදිපිළි තාක්.)
[10] ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී
[11] විලාසිතා නිර්මාණය සහ නිපැයුම් ප්‍රවර්ධනය පිළිබඳ නිර්මාණවේදී
[12] තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී
[13] තොරතුරු තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී

* වසර තුළ දෙන ලද ඕනෑම අවස්ථාවක උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව.

** ලේඛකාධිකාරි, මූල්‍යාධිකාරි, නියෝජ්‍ය ලේඛකාධිකාරි/මූල්‍යාධිකාරි, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/ මූල්‍යාධිකාරි, සහකාර ලේඛකාධිකාරි/ මූල්‍යාධිකාරි, නියෝජ්‍ය අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ/ ශාරීරික අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා නිලධාරීන්, වැඩ ඉංජිනේරු, පාලක, ප්‍රධාන ආරක්ෂක නිලධාරි (2017 දෙසැම්බර් 31 දිනට).

*** ස්ථිර අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත්තුමය අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය සහ තාවකාලික උපදේශකවරුන් (2017 දෙසැම්බර්31 දිනට).

**** ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය, කොන්ත්‍රාත්තුමය සහ තාවකාලික අනධ්‍යයන කාර්ය මණ්ඩලය (2017 දෙසැම්බර් 31 දිනට).

| කාර්ය මණ්ඩල ප්‍රවර්ගය | වැටුප් පරිමාණය | අනුමත සේවක සංඛ්‍යාව | සිටින කාර්ය මණ්ඩලය | | | ස්ථිර සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩු | සත්‍ය සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | තාවකාලික | කොන්ත්‍රාත් | | |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | U-AC 3 සිට U-AC 5 | 576 | 344 | | 72 | 232 | 160 |
| | U-AC 1 සිට U-AC 2 | 0 | 0 | 103 | | 0 | 0 |
| පුස්තකාල කාර්ය මණ්ඩලය | U-AC 5 | 1 | 1 | | | 0 | 0 |
| | U-AC 4 | | | | | 0 | 0 |
| | U-AC 3 | 6 | 6 | | | 0 | 0 |
| පරිපාලන කාර්ය මණ්ඩලය සහ මූල්‍ය කාර්ය මණ්ඩලය | U-EX 3 | 2 | 2 | | | 0 | 0 |
| | U-EX 2 | 14 | 13 | | | 1 | 1 |
| | U-EX 1 | 13 | 7 | | | 6 | 6 |
| වෙනත් විධායක කාර්ය මණ්ඩලය | U-EX 1, U-EX 2 | 7 | 2 | | | 5 | 5 |
| | U-EX 2 | 3 | 1 | | 2 | 2 | 0 |
| | U-EX 1 | 4 | 2 | | 1 | 2 | 1 |
| වෛද්‍ය නිලධාරීන් | U-MO 2 | 1 | 1 | | | 0 | 0 |
| | U-MO 1 | 3 | 1 | | 2 | 2 | 0 |
| අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | U-AS 2 | 60 | 27 | | | 33 | 33 |
| | U-AS 1, U-AS 2 | 8 | 3 | | | 5 | 5 |
| තාක්ෂණික කාර්ය මණ්ඩලය | U-EX 2 | 160 | 3 | | | 25 | 25 |
| | U-EX 1 | | 2 | | | | |
| | U-MN 4 | | 28 | | | | |
| | U-MN 3 | | 0 | | | | |
| | U-MN 2 | | 2 | | | | |
| | U-MN 1 | | 0 | | | | |
| | U-MT 1 | | 100 | | | | |
| ලිපිකාර සහ සමාන්තර කාර්ය මණ්ඩලය | U-MN 4 | 1 | 16 | | | 95 | 60 |
| | U-MN 3 | 13 | 3 | | | | |
| | U-MN 2 | 4 | 3 | | | | |
| | U-MN 1 | 246 | 147 | | 35 | | |
| ප්‍රාථමික කාර්ය මණ්ඩලය | U-PL 3 | 96 | 205 | | 11 | 111 | 75 |
| | U-PL 2 | 138 | 61 | | 5 | | |
| | U-PL 1 | 211 | 68 | | 20 | | |
| එකතුව | | 1567 | 1048 | 103 | 148 | 519 | 371 |

## 3. දේශීය ශිෂ්‍යයන්

### a. සාරාංශය

(i) ප්‍රථම උපාධි (උපාධි අපේක්ෂක)

| පීඨය | ඇතුළත් කර ගැනීම (ශිෂ්‍ය සංඛ්‍යාව) | | 1 වසර සිසුන් | | 2 වසර සිසුන් | | 3 වසර සිසුන් | | 4 වසර සිසුන් | | 5 වසර සිසුන් | | උපාධි ලත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| වාස්තු විද්‍යා පීඨය | 354 | 374 | 358 | 354 | 360 | 358 | 357 | 360 | 466 | 357 | 55 | 92 | 265 | 376 |
| ව්‍යාපාර පීඨය | | 98 | | | | | | | | | | | | |
| ඉංජිනේරු පීඨය | 938 | 938 | 928 | 938 | 897 | 928 | 896 | 897 | 1004 | 896 | | | 801 | 904 |
| තොරතුරු තාක්ෂණ පීඨය | 283 | 297 | 288 | 283 | 302 | 288 | 275 | 302 | 274 | 275 | - | | 184 | 238 |
| මුළු එකතුව | **1575** | **1707** | **1574** | **1575** | **1559** | **1574** | **1528** | **1559** | **1744** | **1528** | 55 | 92 | **1250** | **1518** |

(ii) පශ්චාත් උපාධි (පාඨමාලාව අනුව)

| පීඨය | ඇතුළත් කර ගැනීම (ශිෂ්‍යයන් සංඛ්‍යාව) | | වත්මන් ශිෂ්‍ය සංඛ්‍යාව | අවසන් කළ ශිෂ්‍ය සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | විද්‍යාපති/ ඉංජි. පති/ MBA | | පශ්චාත් උපාධි පාඨමාලා | |
| | 2016 | 2017 | | 2016 | 2017 | 2016 | 2017 |
| වාස්තු විද්‍යා පීඨය | 57 | 94 | 328 | 19 | 53 | 18 | 25 |
| ඉංජිනේරු පීඨය | 49 | 47 | 128 | 22 | 38 | 11 | 5 |
| ව්‍යාපාර පීඨය | 603 | 421 | 1728 | 178 | 164 | 96 | 170 |
| තොරතුරු තාක්ෂණ පීඨය | 59 | 39 | 153 | 33 | 41 | 2 | 4 |
| එකතුව | 768 | 601 | 2337 | 252 | 296 | 127 | 204 |

### (iii) පශ්චාත් උපාධි (පර්යේෂණය අනුව)

<table>
<tr><td rowspan="3">පීඨය</td><td colspan="6">බඳවා ගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව</td><td colspan="6">වත්මන් ශිෂ්‍ය සංඛ්‍යාව</td><td colspan="6">උපාධි ලත් ශිෂ්‍යයන් සංඛ්‍යාව</td></tr>
<tr><td colspan="2">විද්‍යාපති</td><td colspan="2">දර්ශනපති</td><td colspan="2">ආචාර්ය</td><td colspan="2">විද්‍යාපති</td><td colspan="2">දර්ශනපති</td><td colspan="2">ආචාර්ය</td><td colspan="2">විද්‍යාපති</td><td colspan="2">දර්ශනපති</td><td colspan="2">ආචාර්ය</td></tr>
<tr><td>2016</td><td>2017</td><td>2016</td><td>2017</td><td>2016</td><td>2017</td><td>2016</td><td>2017</td><td>2016</td><td>2017</td><td>2016</td><td>2017</td><td>2016</td><td>2017</td><td>2016</td><td>2017</td><td>2016</td><td>2017</td></tr>
<tr><td>වාස්තු විද්‍යා පීඨය</td><td colspan="6" rowspan="3">2015 සිට නව ලියාපදිංචි කිරීම් උපාධි අධ්‍යයන පීඨය යටතේ ඉදිරිපත් කෙරේ</td><td>1</td><td>1</td><td>8</td><td>7</td><td>6</td><td>3</td><td>1</td><td></td><td>3</td><td>1</td><td>1</td><td>3</td></tr>
<tr><td>ඉංජිනේරු පීඨය</td><td>77</td><td>70</td><td>52</td><td>48</td><td>68</td><td>65</td><td>14</td><td>7</td><td>5</td><td>4</td><td>2</td><td>3</td></tr>
<tr><td>තොරතුරු තාක්ෂණ පීඨය</td><td>1</td><td>1</td><td>4</td><td>3</td><td>2</td><td>2</td><td>-</td><td>-</td><td>-</td><td>1</td><td>-</td><td>-</td></tr>
<tr><td>පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය</td><td>45</td><td>63</td><td>32</td><td>28</td><td>13</td><td>10</td><td>77</td><td>130</td><td>43</td><td>71</td><td>30</td><td>40</td><td>-</td><td>10</td><td>-</td><td>-</td><td>-</td><td>-</td></tr>
<tr><td>එකතුව</td><td>45</td><td>63</td><td>32</td><td>28</td><td>13</td><td>10</td><td>156</td><td>202</td><td>107</td><td>129</td><td>106</td><td>110</td><td>19</td><td>17</td><td>8</td><td>6</td><td>3</td><td>6</td></tr>
</table>

## (b) විස්තර

### (i) ප්‍රථම උපාධි (උපාධි අපේක්ෂක)

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් කර ගැනීම (ශිෂ්‍ය සංඛ්‍යාව) | | 1 වසර සිසුන් | | 2 වසර සිසුන් | | 3 වසර සිසුන් | | 4 වසර සිසුන් | | 5 වසර සිසුන් | | උපාධි ලත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 | 2016 | 2017 |
| වාස්තු විද්‍යා පීඨය | AT [1] | ඉංග්‍රීසි | 54 | 60 | 55 | 54 | 57 | 55 | 57 | 57 | 92 | 57 | 55 | 92 | 43 | 41 |
| | AD [2] | ඉංග්‍රීසි | 37 | 55 | 44 | 37 | 35 | 44 | 46 | 35 | 41 | 46 | - | | 37 | 32 |
| | QS [3] | ඉංග්‍රීසි | 124 | 125 | 128 | 124 | 116 | 128 | 89 | 116 | 116 | 89 | - | | 93 | 114 |
| | TCP [4] | ඉංග්‍රීසි | 51 | 48 | 47 | 51 | 64 | 47 | 73 | 64 | 86 | 73 | - | | 49 | 74 |
| | FM [5] | ඉංග්‍රීසි | 46 | 50 | 47 | 46 | 48 | 47 | 54 | 48 | 81 | 54 | - | | 43 | 70 |
| | BLA [6] | ඉංග්‍රීසි | 42 | 36 | 37 | 42 | 40 | 37 | 38 | 40 | 50 | 38 | - | | - | 45 |
| **උප එකතුව** | | | **354** | **374** | **358** | **354** | **360** | **358** | **357** | **360** | **466** | **357** | **55** | **92** | **265** | **376** |
| ව්‍යාපාර පීඨය | | | | **98** | | | | | | | | | | | | |
| **උප එකතුව** | | | | **98** | | | | | | | | | | | | |
| ඉංජිනේරු පීඨය | MPR [7] | ඉංග්‍රීසි | 723 | 721 | 727 | 723 | 708 | 727 | 684 | 708 | 745 | 684 | - | | 626 | 694 |
| | EM [8] | ඉංග්‍රීසි | 50 | 48 | 48 | 50 | 50 | 48 | 53 | 50 | 65 | 53 | - | | 43 | 49 |
| | TM [9] | ඉංග්‍රීසි | 61 | 59 | 54 | 61 | 49 | 54 | 59 | 49 | 79 | 59 | - | | 41 | 66 |
| | TLM [10] | ඉංග්‍රීසි | 51 | 60 | 55 | 51 | 49 | 55 | 61 | 49 | 67 | 61 | - | | 48 | 61 |
| | FD [11] | ඉංග්‍රීසි | 53 | 50 | 44 | 53 | 41 | 44 | 39 | 41 | 48 | 39 | - | | 43 | 34 |
| **උප එකතුව** | | | **938** | **938** | **928** | **938** | **897** | **928** | **896** | **897** | **1004** | **896** | | | **801** | **904** |
| තොරතුරු තාක්ෂණ පීඨය | IT [12] | ඉංග්‍රීසි | 188 | 198 | 189 | 188 | 189 | 189 | 164 | 189 | 198 | 164 | - | | 140 | 180 |
| | ITM [13] | ඉංග්‍රීසි | 95 | 99 | 99 | 95 | 113 | 99 | 111 | 113 | 76 | 111 | - | | 44 | 58 |
මොරටුව විශ්වවිද්‍යාලය පාර්ලිමේන්තුවේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් සංස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර ශ්‍රී ලංකාවේ පිහිටි මොරටුව, කටුබැද්ද, බණ්ඩාරනායක මාවතේ පිහිටා ඇත.

**1.2** නිකුත් කිරීම සඳහා අවසර ලබා දීමේ දිනය

2018 පෙබරවාරි 14 වන දින පාලක සභාව විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදි.

**1.3** ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

- ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා විමසුම් මනස පෝෂණය කරන සහ දැනුම සහ කුසලතා සංවර්ධනය කරන තාක්ෂණික සහ ආශ්‍රිත ශික්ෂණවල ප්‍රතිසංස්කරණාත්මක අධ්‍යාපනය සැපයීම.
- දැනුම පිළිබඳ සීමා මායිම් ව්‍යාප්ත කිරීමට සහ ජාතික තාක්ෂණික හැකියා ඉහළ නැංවීමට ජාතිකව වැදගත් සහ ඉහළ බලපෑම් සහිත පර්යේෂණ කරගෙන යාම.
- අන්තර්ජාතිකව ස්ථානගත වූ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලයක් ලෙස රජයට, කර්මාන්තයට සහ සමාජයට විශේෂඥ සේවා සැපයීම.
- ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, තාක්ෂණික, සමාජයීය සහ ආර්ථික සංවර්ධනයට දායක වීම.

**1.4** **මූල්‍ය කාල පරිච්ඡේදය**

මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාල පරිච්ඡේදය 2017 ජනවාරි 01 දින සිට 2018 දෙසැම්බර් මස 31 වන දින දක්වා මාස 12ක කාල පරිච්ඡේදය නියෝජනය කරයි.

### 2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

**2.1** පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පොදු පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නොමැති නම්, මෙම ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන සෑම කාල පරිච්ඡේදයකටම සංගතව යොදා තිබේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

### 2.2.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශනවලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, හිමිකම්වල වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශවලට සටහන් ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතිවලට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත.

### 2.2.2 මිනුම් පදනම

මෙම මූල්‍ය ප්‍රකාශ අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධව නිසි හෙළිදරව් කිරීම් කර ඇති අවස්ථාවල හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙළ කර ඇත.

### 2.2.3 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රමාණාත්මක, පටු සහ විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු වත්මන් කාල පරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීමට හා සංසන්දනාත්මක බව වැඩි දියුණු කිරීමට මූල්‍ය ප්‍රකාශනවලින් වාර්තා කර ඇති සියලු වටිනාකම් පූර්ව කාලපරිච්ඡේදයට අනුව හෙළිදරව් කර ඇත.

අවශ්‍ය අවස්ථාවලදී, වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීමට තහවුරු කිරීමට සංසන්දනාත්මක සංඛ්‍යා නැවත සකස් කර ඇත. වර්ෂය තුළදී පහත සඳහන් දෑ නැවත වර්ග කර ඇත.

- **සටහන 01:** භාණ්ඩාගාර ප්‍රදාන මගින් ලබා ගන්නා ලද, අභ්‍යන්තර උත්පාදිත අරමුදල් හරහා ලබා ගන්නා ලද සියලු දේපළ, පිරියත හා උපකරණ (PPE) සහ පරිත්‍යාග ලෙස ලැබුණ වත්කම් එක්ව ඉදිරිපත් කර ඇත. පෙර වර්ෂවල දේපොළ, පිරියත හා උපකරණ අරමුදල් ප්‍රභවය මත පදනම්ව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

- **සටහන 15:** 2013.12.31 දිනට උත්පාදනය කළ අරමුදල්වල ප්‍රාග්ධන ගිණුමේ ශේෂය පොදු සංචිත ගිණුමට මාරු කර ඇත. වාර්ෂිකව 10% ක් උත්පාදනය කළ අරමුදල් ප්‍රාග්ධන ගිණුම ක්‍රමක්ෂය වීමට ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කර ඇත. ඒ අනුව, 2014, 2015 සහ 2016 යන මූල්‍ය වර්ෂ සඳහා අදාළ වන ක්‍රමක්ෂය මුදල් පොදු සංචිත ගිණුමට මාරු කර ඇත. 2017 මූල්‍ය වර්ෂයට අදාළ ක්‍රමක්ෂය මුදල් 2017.12.31 න් අවසන් වූ කාල සීමාව සඳහා මූල්‍ය කාර්ය සාධනයේ ප්‍රකාශ හඳුනා ගෙන ඇත.

- **සටහන 16:** 2013.12.31 දිනට පරිත්‍යාග ශේෂය- ප්‍රාග්ධන ගිණුම පොදු සංචිත ගිණුම වෙත මාරු කර ඇත. වාර්ෂිකව 10% ක් පරිත්‍යාග ප්‍රාග්ධන ගිණුම ක්‍රමක්ෂය වීමට ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කර ඇත. ඒ අනුව, 2014, 2015 සහ 2016 යන මූල්‍ය වර්ෂ සඳහා අදාළ වන ක්‍රමක්ෂය මුදල් පොදු සංචිත ගිණුමට මාරු කර ඇත. 2017 මූල්‍ය වර්ෂයට අදාළ ක්‍රමක්ෂය මුදල් 2017.12.31 න් අවසන් වූ කාල සීමාව සඳහා මූල්‍ය කාර්ය සාධනයේ ප්‍රකාශ හඳුනා ගෙන ඇත.

- සටහන **10** සහ **12**: 2016 දී වෙනස් වූ ආදායමක් ලෙස වර්ගීකරණය කරන ලද රු. 35,065,248 වර්ෂ 2017 දී වෙනත් පර්යේෂණ ප්‍රදානයන් ලෙස නැවත වර්ගීකරණය කරන ලද අතර ඒ අනුව සංසන්දනාත්මක සංඛ්‍යාද වෙනස් වී ඇත.

## 2.2.4 භාවිතා වන සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය වන භාවිතා වන සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලැබේ.

සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර වෙනත් ආකාරයකින් දක්වා ඇති නම් හැර රුපියලට වටයා ප්‍රකාශ කර තිබේ.

## 2.2.5 සුවිශේෂී ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

SLPSAS/LKAS/SLFRS වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමට සහ ඉදිරිපත් කිරීමට, වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල වාර්තා කළ වටිනාකම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමට බලපාන විනිශ්චය කිරීම, ඇස්තමේන්තු හා උපකල්පන සිදු කිරීම කළමනාකරණයට අවශ්‍ය වේ. මෙම ඇස්තමේන්තු සහ විනිශ්චයවලින් සැබෑ ප්‍රතිඵල වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පනයන් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට සංශෝධන, සංශෝධනය වර්තමාන හා අනාගත කාල පරිච්ඡේද යන දෙකටම බලපාන්නේ නම් අනාගත කාල පරිච්ඡේද සහ සංශෝධනය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ හෝ සංශෝධනය කරනු ලබන කාල පරිච්ඡේදයට පමණක් සංශෝධනය බලපාන්නේ නම් ඇස්තමේන්තුව සංශෝධනය වන කාල පරිච්ඡේදය තුළ හඳුනා ගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවල පිළිගත් වටිනාකමට වඩාත්ම සැලකිය යුතු බලපෑම් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමේදී ඇස්තමේන්තු, අවිනිශ්චිතභාවය සහ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ සැලකිය යුතු අංශ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වත්කම්වල ආර්ථික ඵලදායී ජීව කාලය
වත්කමේ ඵලදායී ආර්ථික අගය ඔවුන්ගේ හොඳම ඇස්තමේන්තුව මත පදනම්ව කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අතර එසේ කිරීම ප්‍රායෝගික නොවන අවස්ථාවල විශේෂඥ උපදෙස් ලබා ගැනේ.
ගිණුම් ඇස්තමේන්තු හා විනිශ්චයන් වෙනස් වීම
ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්වල යම් වෙනස්කම් මූල්‍ය වාර්තාවලට අදාළ සටහන් තුළ හෙළිදරව් කර ඇත.

## 2.2.6 වාස්තවිකත්වය හා ඒකරාශී කිරීම

සමාන භාණ්ඩවල එක් එක් ද්‍රව්‍ය කාණ්ඩය මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. අසමාන හෝ කාර්යය අයිතම ඒවා නොවැදගත් නම් වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.3 වත්කම් හා ජීවා තක්සේරු කිරීමේ පදනම

2.3.1 දේපළ, පිරියත හා උපකරණ (PPE)

(අ) හඳුනා ගැනීම සහ මිනුම

දේපළ, පිරියත සහ උපකරණ සියල්ල මූලික පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ අලාභානි අඩු කර හඳුනා ගැනේ.
රාජ්‍ය ප්‍රදාන හරහා මිලදී ගන්නා ලද දේපළ, යන්ත්‍රෝපකරණ හා උපකරණ මත ක්ෂය වීම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට නිකුත් කරන අතර අදාල වත්කම්වල ඵලදායී ජීව කාලය පුරාවට අනුරූප ප්‍රදාන වටිනාකම ක්‍රමක්ෂය කෙරේ.

උත්පාදිත අරමුදල් හරහා සහ ප්‍රදාන හරහා මිලට ගත් දේපළ, පිරිවැය සහ උපකරණ මත ක්ෂය කිරීම මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශයට නිකුත් කරන අතර සහ අනුරූප ප්‍රදාන වටිනාකම වාර්ෂිකව 10% ක් ක්‍රමක්ෂය කෙරේ.

(ආ) පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැයට එහි මිලදී ගැනුම් පිරිවැය සහ එහි අදහස් කරන භාවිතය සඳහා කාර්යය මට්ටමට සෘජුවම දායක විය හැකි යම් පිරිවැය ඇතුළත් වේ.

වසර සඳහා භාවිතා කරන ලද රජයේ ප්‍රාග්ධන ප්‍රතිදාන සහ වෙනත් ප්‍රතිදාන ඇතුළුව මුළු ප්‍රාග්ධන වියදම් රු: 1,458,541,425 ක් විය. එය පහත පරිදි වියදම් කර ඇත.

| | රජයේ ප්‍රදාන (රු) | අරමුදල් උත්පාදන (රු) | පරිත්‍යාග සහ වෙනත් අරමුදල් (රු) |
|---|---|---|---|
| ඉදිකි රීම් කටයුතු | 163,583,937 | - | - |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | 429,852,374 | 8,900,699 | 668,647,229 |
| පුනරුත්ථාපනය | 117,764,158 | - | - |
| මානව ප්‍රාග්ධන වියදම් | 69,793,028 | - | - |
| | **780,993,497** | **8,900,699** | **668,647,229** |

- රජයේ ප්‍රාග්ධන ප්‍රතිදාන ලැබීම 795,000.000

අඩු කළා 2016 වර්ෂය සඳහා ලැබිය යුතු ගණනය කිරීම (77,406,825)
717,593,175

2017 වර්ෂය සඳහා ලැබිය යුතු රජයේ ප්‍රදාන 63,400,322
**780,993,497**

(ඈ) පසුකාලීන වියදම්

වත්කම්වල ඉපැයීමේ ධාරිතාවය පවත්වා ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීමේ අරමුණ සඳහා දැරූ පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

(ඇ) ක්ෂය වීම්

රාජ්‍ය ප්‍රදාන, උත්පාදනය කළ අරමුදල් මගින් මිලට ගත් සහ පරිත්‍යාග මගින් අත්පත් කරගත් දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂයවීම් ඇස්තෙම්න්තුගත ඵලදායී ජීව කාලයන් තුළ එවැනි වත්කම්වල පිරිවැය කපා හැරීම සඳහා මූල්‍ය කාර්ය සාධනයට අය කරනු ලැබේ.

05.10.95 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 649 දරන චක්‍රලේඛය අනුව සරල රේඛීය ක්‍රමය භාවිතා කර සියලුම දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂය ගණනය කර ඇත.

වත්කම් භාවිතා කළ මාසයේ සිට ක්ෂය කිරීම ගණනය කර ඇත.

වාර්ෂික ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.

| වත්කම් වර්ගය | අනුපාතය |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 05% |
| ලී බඩු සහ කාර්යාල උපකරණ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | 20% |
| උපාංග සහ සවිකිරීම් | 10% |
| පුස්තකාල පොත් | 20% |
| මෝටර් වාහන | 20% |
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | 10% |
| ක්‍රීඩා උපකරණ | 20% |
| UTP කේබල් | 10% |
| උපාධි ලෝගු | 20% |
| PABX පද්ධතිය | 10% |
| ජල සැපයුම් යෝජනා ක්‍රමය | 10% |
| නේවාසිකාගාර උපකරණ | 20% |

(ඉ) වත්කම් ප්‍රත්‍යාගණනය

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2013.12.31 දින දක්වා මිලදී ගත් / අත්පත් කරගත් පුස්තකාල පොත් හැර අනෙකුත් සියලු දේපළ, පිරියත සහ උපකරණ සියල්ල ප්‍රත්‍යාගණනය කර ඇත. නව ප්‍රත්‍යාගණන වටිනාකම 2017 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනයට සංස්ථාපිත කර ඇත.

(ඊ) හඳුනා නොගැනීම

දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ඉවත් කිරීමක් මත හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගැනේ.

වත්කම් හඳුනා නොගැනීම මත ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ගණනය කරනු ලබන්නේ ශුද්ධ බැහැර කිරීම් වටිනාකම හා ගෙන යාමේ වටිනාකම අතර වෙනස ලෙසය. එම වත්කම හඳුනා නොගන්නා වර්ෂය තුළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි ඇතුළත් කෙරේ.

ප්‍රාග්ධන අයිතම බැහැර කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතිවලට (SLPAS7) අනුකූලව ගිණුම්ගත කර ඇත.

2017 වර්ෂය තුළදී වෙන්දේසි තුනක් පවත්වන ලදී. PPE යටතේ බැහැර කළ භාණ්ඩවල මුළු පිරිවැය රු. 12,614,958.44 කි.

විස්තරය පහත පරිදි වේ:

| | |
|---|---|
| 2013.12.31 දිනට පෙර අත්පත් කරගත් අයිතම බැහැර කිරීම | 12,053,367.96 |
| 2014.01.01 දිනට පසු අත්පත් කරගත් අයිතම බැහැර කිරීම | 561,590.48 |
| **එකතුව** | **12,614,958.44** |

2014.01.01 දිනට පසු අත්පත් කරගත් අයිතම ඉවත් කිරීම සඳහා ගිණුම්කරණ ගැළපීම් 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නැත. මුල් වත්කම් කේත නව වත්කම් කේතවලින් වෙනස් වන නිසා එම අයිතමවල ප්‍රත්‍යාගණන වටිනාකම හඳුනාගත නොහැකි බැවිනි. කෙසේ වෙතත්, එම අයිතම ඉතා පැරණි සහ භාවිතා කළ හැකි තත්ත්වයේ නොමැති නිසා නව ප්‍රත්‍යාගණන වටිනාකම ඉතා කුඩා විය හැක. තවද, 2018 දී, මෙම අයිතම ප්‍රත්‍යාගණනය කර තිබේද නැද්ද යන්න සොයා බැලීම සඳහා සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කරනු ලැබේ. එම අයිතමවලට අදාළව යම් ප්‍රත්‍යාගණන වටිනාකමක් ඇති නම්, වෙන්දේසි ක්‍රියාමාර්ග 2017 වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය පිළිබඳ මූල්‍ය ප්‍රකාශයෙන් ගෙනා ඇති බැවින් 2018 වර්ෂයේදී පොදු සංචිත ගිණුම හරහා අවශ්‍ය ගැළපීම් සිදු කරනු ලැබේ.

(උ) අනෙකුත් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් මත වියදම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන ලද අනෙකුත් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් (මානව ප්‍රාග්ධන සංවර්ධනය) සඳහා වියදම පුනරාවර්තන වියදම් ලෙස ගණනය කර ඇති අතර මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට දක්වා ඇත.

2.3.2 නොනිමි වැඩ

නොනාමි ප්‍රාග්ධන වැඩ පිරිවැයෙන් යම් අලාභ අඩු කිරීමෙන් ප්‍රකාශ කරනු ලැබේ. මේවා ප්‍රාග්ධනීකරණය අපේක්ෂාවෙන් දේපළ, පිරියත සහ උපකරණ ඉදිකිරීමේදී සෘජුවම දරා ඇති ප්‍රාග්ධන ස්වාභාවයේ වියදම් වේ. නොනාමි ප්‍රාග්ධන වැඩ දේපළ, පිරියත හා උපකරණවල අදාළ වත්කම් වර්ගය වෙත, එය භාවිතයට ලබා ගත හැකි විට මාරු කරනු ලැබේ.

2.3.3 තොග

තොග පිරිවැයට හෝ ශුද්ධ උපලබ්දි අගය යන දෙකෙන් අඩු අගයට ප්‍රකාශ කෙරේ. ගබඩාවල ඇති තොග පෙර පිවිසි පෙර නිකුතු ක්‍රමය (FIFO) භාවිතා කර පිරිවැයට ගණනය කරනු ලබයි.

විශ්වවිද්‍යාලයේ තොගවලට ලිපිද්‍රව්‍ය සහ අධ්‍යයන කටයුතු සහ නඩත්තු ක්‍රියාකාරකම්වලට භාවිතා කරන අනෙකුත් පාරිභෝජන භාණ්ඩ, මුද්දර සහ ඉතිරි තොග සහ ඖෂධ හා සැරහුම් ඇතුළත් වේ.

2.3.4 අස්පෘශ්‍ය වත්කම්

(අ) බැඳුම්කර හා ගිවිසුම් උල්ලංඝනය කිරීම

අස්පෘශ්‍ය වත්කම් ලෙස බැඳුම්කර හා ගිවිසුම් උල්ලංඝනය කිරීම මත ලැබිය යුතු වටිනාකම 2017.12.31 දිනට රුපියල් 53,626,535.83 කි.

**2.4 වගකීම් සහ ප්‍රතිපාදන**

(අ) මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලු දන්නා වගකීම් ගිණුම්ගත කර ඇත.

(ආ) සේවකයන්ගේ සේවා කාලයේ වර්ෂ සලකා 2017 වර්ෂය සඳහා සේවකයින්ගේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

**2.5 පොදු සංචිත**

විශ්වවිද්‍යාලයේ පොදු සංචිතයේ විස්තර, 95.10.05 දිනැති අංක 649 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| සමුච්චිත ක්ෂයවීම් | රු: | (1,191,056,582.49) |
| වෙනත් | රු: | 1,894,595,529.40 |
| එකතුව | රු: | **(703,538,946.91)** |

2.6 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

2.6.1 ආදායම

ආදායමෙහි රාජ්‍ය ප්‍රදාන (භාණ්ඩාගාරය), විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ අමාත්‍යාංශයේ ප්‍රදාන සහ අභ්‍යන්තර මූලාශ්‍රවලින් උත්පාදිත ආදායම, උපචිත පදනම මත ගණනය කරන ලද ආයෝජනය මත පොළිය අඩංගු වේ.

(අ) රාජ්‍ය ප්‍රදාන

රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සහ රාජ්‍ය සහාය හෙළිදරව් කිරීම සඳහා සඳහා ආදායම් ප්‍රවේශ ක්‍රමය භාවිතා කරන ලදී

(ආ) උත්පාදිත ආදායම

පශ්චාත් උපාධි පාඨමාලා සහ පුහුණු වැඩසටහන් / කෙටිකාලීන පාඨමාලා පිරිවැය ප්‍රතිසාධන පදනම මත පවත්වනු ලැබේ.

උපදේශන සේවා, පරීක්ෂණ පැවරුම් සහ ස්වයං මූල්‍ය පුහුණු පාඨමාලා වල (පශ්චාත් උපාධි පාඨමාලා ඇතුළුව) ලැබීම් සහ ගෙවීම් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ලැබීම් | රු. | 590,904,766.54 |
| ගෙවීම් | රු. | (508,563,295.99) |
| ශේෂය | රු. | **82,341,470.55** |

සත්‍ය ලැබීම් රු. 590,904,766.54 ක මුදලින් රු. 508,563,295.99 ක් 2017 වර්ෂය සඳහා පිළිවෙලින් පිරිවැය ප්‍රතිසාදන ක්‍රියාකාරකම් සහ පිරිවැය ප්‍රතිසාදන ක්‍රියාකාරකම් මත වියදම් වෙතින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගෙන ඇති අතර ශේෂය රු. 82,341,470.55 ක් විලම්භිත ආදායම ලෙස ගිණුම්ගත කර ඇත.

ක්‍රියාමාර්ගයක් ලෙස පසුගිය වසර 3 තුලදී අක්‍රියව පැවතුනු ලෙජර ගිණුම් පාඨමාලා / ව්‍යාපෘති සම්බන්ධීකාරකගේ නිර්දේශය සහ පාලක සභාවේ අනුමැතිය මත වසන ලදී.

(ඉ) **සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**

2017 වර්ෂය තුළ අනුබද්ධිත සමාගමක් වන Uni Consultancy Services (පුද්) සමාගම සමඟ මොරටුව විශ්වවිද්‍යාලය විසින් පහත සඳහන් ගනුදෙනු සිදු කර ඇත. Uni Consultancy Services (පුද්) සමාගම වෙතින් ලැබුණු ආදායම රු. 1,573,605.00කි. Uni Consultant Services (පුද්) සමාගම විසින් සපයනු ලබන සේවාවන් සඳහා ගෙවීම් රු. 5,088,720.78 කි.

(ඊ) බැඳුම්කර හා ගිවිසුම් උල්ලංඝණය කිරීමෙන් ඇති වූ ආදායමෙන් ආයෝජනය මත ලැබුණු පොලිය රුපියල් 4,484,422.15 කි

1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව බැඳුම්කර හා ගිවිසුමේ කඩ කිරීමෙන් ලැබුණු පොලී නම් වූ ප්‍රතිපාදන ගිණුමක මෙම පොලී ආදායම හඳුනා ගන්නා ලදී.

2.6.2 වියදම

(i) වියදම ව්‍යාපෘති /ද්‍රව්‍ය මගින් විශ්ලේෂණය කර ඇති අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ පොදු ආකෘති වාර්තාකරණ පද්ධතිය මගින් ලබා දී ඇති මාර්ගෝපදේශ මත පදනම්ව වියදම් ශීර්ෂවලට වර්ග කර ඇත.

(ii) 2006 වර්ෂයේ සිට, පුද්ගල පාරිශ්‍රමික යටතේ ඇතුළත් කළ පාරිතෝෂික ප්‍රතිපාදන විගණන නිලධාරීන්ගේ උපදෙස් පරිදි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙනත් මෙහයුම් වියදම් යටතේ හෙළිදරව් කර ඇත.

(iii) මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ ආයතනය - ITUM සඳහා විද්‍යාගාර හා පුස්තකාල ඇතුලු පොදු පහසුකම් වියදම් සහ උපයෝගිතා සැපයීමේ පිරිවැය, ITUM වෙතින් අය විය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර නැත.

## 2.7 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකරණ ප්‍රමිතීන්ට (SLPSAS 2) අනුකූලව "වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත.

## 2.8 සංසන්දනය පිළිබඳ ප්‍රකාශනය

ආදායම් සහ වියදම් සංසන්දනය පිළිබඳ ප්‍රකාශනය සකස් කරන ලද අතර අයවැයගත සහ භාණ්ඩාගාරය වෙතින් ලද අතිරේක ප්‍රදාන සඳහා පමණක් ඉදිරිපත් කරන ලදී.

21.6 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට සටහන්

සටහන - 1

| | 2017<br>රු.ශි. | 2016<br>රු.ශි. |
|---|---|---|
| <u>දේපළ පිරියත සහ උපකරණ</u> | | |
| <u>පිරිවැය සටහන - 01 (a)</u> | | |
| ජනවාරි 01 වන දිනට ශේෂය | 6,616,755,515 | 5,416,462,844 |
| වර්ෂය තුළ එකතු කිරීම් | 1,220,486,847 | 1,063,571,542 |
| වර්ෂය තුළ බැහැර කිරීම් | (1,029,345.48) | (3,757,499) |
| වර්ෂය තුළ වත්කම් ප්‍රත්‍යාගණනය | 7,450,867,591 | - |
| වර්ෂය සඳහා ගැළපුම් | (4,379,562,949) | - |
| නොනිමි වැඩවලින් මාරු කිරීම් (සටහන 3) | 169,347,211 | 140,478,628 |
| දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 11,076,864,870 | 6,616,755,515 |
| | | |
| <u>ක්ෂය සඳහා වෙන් කිරීම් - සටහන - 01 (a)</u> | | |
| ජනවාරි 01 වන දිනට ශේෂය | 3,489,343,978 | 2,983,932,273 |
| වර්ෂය සඳහා ක්ෂය | 660,316,656 | 305,746,730 |
| වර්ෂය තුළ බැහැර කිරීම් | (321,427) | (2,963,708) |
| ක්ෂය ගැළපුම් | (2,958,536,297) | 202,628,683.22 |
| දෙසැම්බර් 31 වන දිනට ශේෂය | 1,190,802,910 | 3,489,343,978 |
| | | |
| දෙසැම්බර් 31 වන දිනට ලියා හළ අගය | 9,886,061,960 | 3,127,411,537 |

| සටහන - 02 | 2017 | 2016 |
|---|---|---|
| ආයෝජන (දිගු කාලීන) | රු.ශි. | රු.ශි. |
| ආරම්භක ශේෂය - විශ්වවිද්‍යාලය | 359,181,663 | 349,250,730 |
| ආරම්භක ශේෂය - නේවාසිකාගාරය | 37,098 | 37,098 |
| ලද පොලී | 12,242,513 | 9,930,932 |
| පෙර වර්ෂවලට - ගැළපුම් | - | - |
| එකතු කළා - ආයෝජන | 110,000,000 | - |
| ආපසු ගැනීම් | - | - |
| | 481,461,273 | 359,218,761 |

| **සටහන - 03** | **2017** | **2016** |
|---|---|---|
| <u>නොනිමි වැඩ</u> | රු.ශි. | රු.ශි. |
| ආරම්භක ශේෂය | 1,047,770,449 | 827,323,004 |
| එකතු කළා /අඩු කළා පූර්ව වර්ෂ ගැළපුම් | 2,496,467 | - |
| වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන (සටහන 13) | 163,583,937 | 360,926,072 |
| පරිත්‍යාග සහ උත්පාදිත අරමුදල් – (සටහන 15/16) | - | - |
| | 1,213,850,852 | 1,188,249,077 |
| ගොඩනැගිලි වෙත ප්‍රාග්ධනිත කළ (සටහන 1) | (169,347,211) | (140,478,628) |
| **අවසන් ශේෂය** | **1,044,503,641** | **1,047,770,449** |

| **සටහන - 4** | **2017** | **2016** |
|---|---|---|
| <u>**තොග**</u> | රු.ශි. | රු.ශි. |
| **ගබඩා** | 16,018,174 | 19,970,817 |
| **මුද්දර** | 52,267 | 85,470 |
| **ඖෂධ** | 435,876 | 395,126 |
| **එකතුව** | **16,506,318** | **20,451,413** |

| සටහන - 5 | 2017 | 2016 |
|---|---|---|
| <u>කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්</u> | රු.ශි. | රු.ශි. |
| උත්සව අත්තිකාරම් | 203,750 | 204,000 |
| විශේෂ අත්තිකාරම් | 6,850 | 7,250 |
| වැටුප් අත්තිකාරම් | 81,344 | 81,344 |
| ආපදා ණය | 48,584,193 | 44,041,487 |
| වාහන ණය | 1,492,585 | 1,009,843 |
| කාර්ය මණ්ඩල ණය | 154,893 | 216,444 |
| පරිගණක ණය | 946,000 | 1,133,133 |
| ගමන් වියදම් අත්තිකාරම් | - | 414,491 |
| උත්සව අත්තිකාරම් - නේවාසිකාගාර | - | 676 |
| එකතුව | 51,469,614 | 47,108,669 |

| සටහන - 6 | 2017 | 2016 |
|---|---|---|
| ලැබිය යුතු | රු.පි. | රු.පි. |
| සැපයුම් සඳහා අත්තිකාරම් | 840,682 | 152,000 |
| විවිධ අත්තිකාරම් | 3,032,234 | 1,780,858 |
| ක්‍රීඩා අමාත්‍යාංශයෙන් ලැබිය යුතු මුදල් | - | - |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් (ලැබිය යුතු ප්‍රාග්ධන ප්‍රදාන) | 63,400,322 | 77,406,825 |
| අගරු වූ චෙක්පත් | - | 25,000 |
| කොන්ත්‍රාත්කරුවන්ගෙන් ප්‍රතිපූරණ | - | 112,474 |
| ලැබිය යුතු තැන්පතු | 992,530 | 1,188,081 |
| ලැබිය යුතු මහපොළ | 27,717,950 | 10,170,650 |
| ලැබිය යුතු ශිෂ්‍යාධාර | 974,300 | 1,335,600 |
| මහපොල වැඩිපුර ගෙවීම් අයකර ගැනිම | 66,650 | 3,385,200 |
| ලැබිය යුතු පරිත්‍යාග ශිෂ්‍යත්ව | 32,500 | 6,500 |
| ලැබිය යුතු පුස්තකාල දඩ | 333,395 | 622,827 |
| ශිෂ්‍යාධාර අත්තිකාරම් | 2,744,250 | 3,628,250 |
| ලැබිය යුතු ආදායම් | 14,705,580 | 9,035,292 |
| විවිධ ණයගැතියන් | - | 34,240 |
| ණයගැතියන් – නේවාසිකාගාර | - | 1,489 |
| එකතුව | 114,840,394 | 108,885,285 |

| සටහන - 7 | 2017 | 2016 |
|---|---|---|
| බැංකු මුදල් | රු.පි. | රු.පි. |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 0000306836 | 782,948 | 670,161 |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 0000307829 | 84,955,529 | 76,054,604 |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 0000307453 | 10,655,945 | 57,123,041 |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 0000307164 | 1,295,900 | 1,229,400 |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 0000307353 | 529,170 | 487,214 |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 7099353 | 4,358,479 | 23,193,548 |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 306795 (නේවාසිකාගාර) | 1,556,138 | 1,323,008 |
| ලංකා බැංකුව - ගිණුම් අංකය 71579813 | 70,940 | 147,690 |
| විදේශ RFD/KAT/US$40 | 866,612 | 859,216 |
| එකතුව | 105,071,661 | 161,087,881 |

| සටහන - 8 | 2017 | 2016 |
|---|---|---|
| අතැති මුදල් | රු.පි. | රු.පි. |
| සුළු මුදල් අග්‍රිමය | | |
| ගණිත අධ්‍යයනාංශය | 3,200 | - |
| එකතුව | 3,200 | - |

| සටහන - 9 | 2017 | 2016 |
|---|---|---|
| ගෙවිය යුතු තැන්පතු | රු.පි. | රු.පි. |
| ටෙන්ඩර් | 137,000 | 141,000 |
| විවිධ | 2,597,785 | 3,184,072 |
| විශ්වස්තතා ඇපය | 17,500 | 17,500 |
| ආපන ශාලාව | 271,000 | 616,000 |
| විද්‍යාගාරය සහ පුස්තකාලය | 18,674,150 | 15,541,450 |
| ආරක්ෂණ | 42,315 | 37,960 |
| ලංසු බැඳුම්කරය | 915,000 | 853,000 |
| අන්තර්ජාලය | 786,000 | 750,000 |
| තැන්පතු - නේවාසිකාගාර | - | 33,073 |
| වෙනත් තැන්පතු - නේවාසිකාගාර | - | 13,593 |
| එකතුව | 23,440,750 | 21,187,648 |

| සටහන - 10 | 2017 | 2016 |
|---|---|---|
| පර්යේෂණ ප්‍රදාන | රු.පි. | රු.පි. |
| ජාතික විද්‍යා පදනම | 17,856,806 | 3,066,164 |
| ජාත්‍යන්තර අරමුදල් සැපයූ පර්යේෂණ ව්‍යාපෘති | - | - |
| වෙනත් පර්යේෂණ ප්‍රදාන | 67,554,484 | 46,160,962 |
| | 85,411,290 | 49,227,126 |

| සටහන - 11 | 2017 | 2016 |
|---|---|---|
| ගෙවිය යුතු | රු.පි. | රු.පි. |
| මහපොළ ශිෂ්‍යාධාර අරමුදල | 11,808,800 | 15,628,100 |
| නොගෙවූ ශිෂ්‍යාධාර | | 1,050 |
| නොගෙවූ මහපොළ | - | 17,500 |
| ගෙවිය යුතු මහපොළ | 106,550 | - |
| වෙනත් වගකීම් | 30,775,370 | 18,295,992 |
| ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සඳහා ලැබීම් | 21,929,147 | 21,966,912 |
| විවිධ ණයහිමියන් | 11,455,202 | 10,267,768 |
| රඳවා ගැනීමේ ගිණුම - සැපයුම්කරුවන් | 13,281,114 | 47,230,323 |
| උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විදේශීය සිසුන් සඳහා ප්‍රදාන | 392,000 | 392,000 |
| නොගෙවූ වැටුප් | 359,128 | 398,719 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 12,500 | 1,954,152 |
| උපචිත වියදම් – නේවාසිකාගාර | - | 1,172,503 |
| උපලබ්ධි නොවූ චෙක්පත් – නේවාසිකාගාර | - | 18,055 |
| එකතුව | 90,119,811 | 117,343,075 |

| සටහන - 12 | 2017 | 2016 |
|---|---|---|
| විලම්බිත ආදායම් | රු.පි. | රු.පි. |
| පශ්චාත් උපාධි පාඨමාලා | 317,931,190 | 275,799,666 |
| අර්ධ කාලීන පාඨමාලා | 5,859,492 | 6,772,177 |
| පුහුණු වැඩසටහන් | 24,579,200 | 17,917,810 |
| වෙනත් වැඩසටහන් | 112,794,404 | 70,397,326 |
| වැඩමුළු | - | - |
| ව්‍යාපෘති | 33,886,228 | 18,889,204 |
| එකතුව | 495,050,514 | 389,776,184 |

| සටහන - 13 | 2017 | 2016 |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන - වැය කළ | රු.පි. | රු.පි. |
| ආරම්භක ශේෂය | 3,740,706,725 | 2,880,131,903 |
| ගැළපුම් | 2,067,897 | (207,064,383) |
| වත්කම් අත්පත් කර ගැනීම් | 542,938,919 | 908,846,455 |
| වෙනත් ප්‍රාග්ධන ක්‍රියාකාරකම් වියදම් | 69,793,028 | 37,076,076 |
| ව්‍යාපෘති වියදම් (සටහන 3) | 163,583,937 | 360,926,072 |
| ආනයන අත්තිකාරම් | 4,677,612 | 57,110,511 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | (488,664,550) | (296,319,909) |
| ශේෂය | 4,035,103,569 | 3,740,706,725 |

| සටහන - 14 | 2017 | 2016 |
|---|---|---|
| ප්‍රාග්ධන ප්‍රදාන - වැය නොකළ | රු.පි. | රු.පි. |
| ආරම්භක ශේෂය | 50,000,000 | - |
| භාණ්ඩාගාරයෙන් ප්‍රදාන | 717,593,175 | 1,286,552,289 |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ප්‍රදාන | 63,400,322 | 77,406,825 |
| උපකරණ සඳහා UGC ප්‍රදාන | - | 50,000,000 |
| ගැළපුම් | (50,000,000) | - |
| වත්කම් අත්පත් කර ගැනීම | (617,409,560) | (1,003,033,042) |
| W.I.P අතිරික්තය | (163,583,937) | (360,926,072) |
| එකතුව | - | 50,000,000 |

(2017 වසරේදී, භාණ්ඩාගාරයෙන් රු. මිලියන 725ක් සහ අමාත්‍යාංශයෙන් රු. මිලියන 20ක් ලැබිණි. වැය නොකළ ප්‍රාග්ධන ගිණුමේ ආරම්භක ශේෂය රු. මිලියන 50ක් විය. භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රජයේ ප්‍රදානය රු. මිලියන 77.4ක් පියවීමෙන් පසුව ඉතිරිය රු. මිලියන 717.59 භාණ්ඩාගාරයෙන් රජයේ ප්‍රදාන ලෙස දක්වා ඇත.)

| සටහන - 15 | 2017 | 2016 |
|---|---|---|
| උත්පාදිත අරමුදල් - ප්‍රාග්ධන | රු.පි. | රු.පි. |
| ආරම්භක ශේෂය | 363,925,939 | 329,114,221 |
| ගැළපුම් | - | - |
| උපකුලපතිතුමාගේ අරමුදල සහ අමතාසුන් අධ්‍යයනාංශ අරමුදල් | 8,900,699 | 34,811,718 |
| | 372,826,638 | 363,925,939 |
| අඩු කළා- පොදු සංචිත ගිණුමට මාරු කිරීම | (298,848,433) | - |
| පෙර වර්ෂ සඳහා ක්‍රමක්ෂය | (11,093,091) | - |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | (7,397,820) | - |
| ප්‍රාග්ධනය – නේවාසිකාගාර | - | 125,046 |
| එකතුව | 55,487,293 | 364,050,985 |

සටහන - 16
<u>පරිත්‍යාග - ප්‍රාග්ධන</u>

| | 2017 | 2016 |
|---|---|---|
| | රු.පි. | රු.පි. |
| ආරම්භක ශේෂය | 1,201,195,628 | 1,081,282,259 |
| ගැළපුම් | 7,975,000 | |
| W.I.P අතිරික්තය | - | - |
| ලැබීම් | 668,647,229 | 119,913,369 |
| | 1,877,817,857 | 1,201,195,628 |
| අඩු කළා- පොදු සංචිත ගිණුමට මාරු කිරිම | (1,066,967,527) | - |
| පෙර වර්ෂ සඳහා ක්‍රමක්ෂය | (17,525,916) | - |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය | (81,085,033) | - |
| එකතුව | 712,239,381 | 1,201,195,628 |

සටහන - 17
<u>සීමාකළ අරමුදල්</u>

| | 2017 | 2017 | 2016 | 2016 |
|---|---|---|---|---|
| | රු.පි. | රු.පි. | රු.පි. | රු.පි. |
| උත්පාදිත අරමුදල් | 344,399,097 | | 293,881,598 | |
| එකතු කළා - ලැබීම් | 460,153,287 | | 262,666,120 | |
| අඩු කළා - ගෙවීම් | (505,867,958) | | (212,148,620) | |
| | 298,684,426 | | 344,399,097 | |
| එකතු කළා - අධ්‍යයනාංශ ගිණුම් සහ පාඨමාලා සං· | 113,494,375 | | 90,824,413 | |
| | 412,178,800 | | 435,223,510 | |
| අවසන් ශේෂය | | 412,178,800 | | 435,223,510 |
| පරිත්‍යාග කළ අරමුදල් | 17,908,727 | | 17,377,320 | |
| එකතු කළා - ලැබීම් | 823,475 | | 584,823 | |
| අඩු කළා - ගෙවීම් | (861,169) | 17,871,033 | (53,416) | 17,908,727 |
| පර්යේෂණ ප්‍රදාන අරමුදල් | 9,194,335 | | 9,056,155 | |
| එකතු කළා - ලැබීම් | 188,937 | | 138,180 | |
| අඩු කළා - ගෙවීම් | - | 9,383,272 | - | 9,194,335 |
| බැඳුම්කර සහ ගිවිසුම් අරමුදල | 120,103,161 | | 105,266,210 | |
| එකතු කළා - ලැබීම් | 18,509,830 | | 16,171,428 | |
| අඩු කළා - ගෙවීම් | (3,385,084) | 135,227,906 | (1,334,478) | 120,103,161 |
| වෙනත් අරමුදල් | 25,187,589 | | 22,400,637 | |
| එකතු කළා - ලැබීම් | 741,100 | | 2,988,805 | |
| අඩු කළා - ගෙවීම් | (82,701) | 25,845,987 | (201,853) | 25,187,589 |
| | | 600,506,998 | | 607,617,322 |

සටහන - 18
<u>පරිත්‍යාග අරමුදල</u>

| | 2017 | 2016 |
|---|---|---|
| | රු.පි. | රු.පි. |
| ආරම්භක ශේෂය | 21,760,149 | 20,872,943 |
| ලැබීම් | 2,730,000 | 2,068,960 |
| පොලී ලැබීම් | 1,446,499 | 1,580,246 |
| ගෙවීම් | (3,121,724) | (2,762,000) |
| එකතුව | 22,814,924 | 21,760,149 |

## 21.7 මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශයට සටහන්

| සටහන - 19<br>ලද පොලී | 2017<br>රුපි. | 2016<br>රුපි. |
|---|---|---|
| ආයෝජනවලින් පොලිය | 24,357,024 | 23,304,089 |
| ණය සහ අත්තිකාරම්වලින් පොලී | 3,290,224 | 2,086,103 |
| | 27,647,248 | 25,390,191 |

| සටහන - 20<br>ශිෂ්‍යයන්ගෙන් ආදායම් | 2017<br>රුපි. | 2016<br>රුපි. |
|---|---|---|
| ලියාපදිංචිය - උපාධි අපේක්ෂක | 2,565,939 | 2,234,960 |
| පශ්චාත් උපාධි | 2,208,325 | 1,985,875 |
| ඉගැන්වීම් ගාස්තු - උපාධි අපේක්ෂක | 4,776,600 | 4,862,850 |
| - පශ්චාත් උපාධි | 333,000 | - |
| විභාග ගාස්තු - උපාධි අපේක්ෂක | 245,125 | 241,625 |
| - පශ්චාත් උපාධි | 598,675 | 769,690 |
| | 10,727,664 | 10,095,000 |

| සටහන - 21<br>වෙනත් ආදායම් | 2017<br>රුපි. | 2016<br>රුපි. |
|---|---|---|
| දේපළවලින් කුලී | 768,421 | 492,634 |
| ප්‍රතිපූරණ | - | - |
| විවිධ ලැබීම් | 13,356,503 | 12,065,477 |
| පුස්තකාල දඩ | 483,290 | 434,793 |
| වෛද්‍ය ගාස්තු | 179,340 | 116,118 |
| පැරණි ගබඩා විකිණීම | 1,623,447 | 2,141,128 |
| | **16,410,999** | **15,250,150** |

| සටහන - 22<br>පුද්ගල සංවේතන | **2017**<br>රුපි. | **2016**<br>රුපි. |
|---|---|---|
| අධ්‍යයන | | |
| වැටුප් සහ වේතන | 379,733,483 | 305,756,151 |
| දීමනා | 388,762,667 | 429,143,388 |
| ජීවන වියදම් දීමනා | 42,839,829 | 42,859,179 |
| UPF | 65,698,680 | 58,415,519 |
| විශ්‍රාම වැටුප් | 34,071,309 | 30,163,264 |
| E.T.F. | 19,953,971 | 17,745,738 |
| වැඩබලන ගෙවීම් | - | 28,407 |
| බාහිර කථීකාචාර්ය ගාස්තු | 47,059,364 | 36,207,115 |
| | | |
| අනධ්‍යයන | | |
| වැටුප් සහ වේතන | 243,093,613 | 183,512,933 |
| දීමනා | 148,359,996 | 180,866,587 |
| ජීවන වියදම් දීමනා | 62,696,459 | 63,285,568 |
| භාෂා ප්‍රවීණතා දීමනාව | - | - |
| UPF | 30,033,388 | 25,423,705 |
| විශ්‍රාම වැටුප් | 17,008,891 | 13,830,749 |
| ETF | 9,464,576 | 7,908,500 |
| වැඩබලන ගෙවීම් | 383,933 | 172,247 |
| අතිකාල දීමනා | 46,364,910 | 36,453,740 |
| නිවාඩු දීමනා | 192,240 | 107,620 |
| | 1,535,717,309 | 1,431,880,411 |

සටහන - 23

| ගමන් සහ යැපීම් වියදම් | 2017<br>රු.පි. | 2016<br>රු.පි. |
|---|---|---|
| දේශිය | 1,398,937 | 1,162,869 |
| විදේශිය | 5,690,366 | 6,880,367 |
| | 7,089,303 | 8,043,236 |

සටහන - 24

| සුබසාධන සේවා | 2017<br>රු.පි. | 2016<br>රු.පි. |
|---|---|---|
| නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු | 4,599,342 | 2,734,553 |
| වෛද්‍ය සැපයුම් | 880,273 | 725,740 |
| වැඩමුළු සම්මන්ත්‍රණ | - | 105,000 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 4,829,341 | 5,797,698 |
| නිවාඩු ගමන් බලපත්‍ර සහ වාර ප්‍රවේශ පත්‍ර | 1,660,010 | 1,423,663 |
| ත්‍යාග සහ හානිපූරණ | 1,724,983 | 1,272,500 |
| පශ්චාත් උපාධි පර්යේෂණ සහ ශිෂ්‍යත්ව | - | - |
| ශිෂ්‍යයන් සඳහා පාඨමාලා ද්‍රව්‍ය සහ ඉගෙනුම් ගුණත්වය | - | - |
| කර්මාන්ත අභ්‍යාසලාභීත්වය සහ වෘත්තීය මගපෙන්වීම | 126,499 | 109,214 |
| ශිෂ්‍ය සංවර්ධන | - | - |
| විශ්වවිද්‍යාල ක්‍රීඩා ක්‍රියාකාරකම් | 2,365,440 | 2,464,973 |
| ශිෂ්‍ය සුබසාධනය, සේවක සුබසාධනය, ශිෂ්‍ය සංගමය | 768,746 | 555,546 |
| සංයුක්ත සැලැස්ම, පාලනය සහ සමාජ සහභාගීත්වය | - | - |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 2,211,069 | 2,239,044 |
| වෙනත් -ප්‍රවෘත්ති පත්‍ර, සහරා යනාදිය | 46,366,519 | 56,168,311 |
| | 65,532,223 | 73,596,243 |

සටහන - 25

| වෙනත් මෙහෙයුම් වියදම් | 2017<br>රු.පි. | 2016<br>රු.පි. |
|---|---|---|
| පාලක සභා සහ කමිටු සේවා | 1,220,200 | 576,660 |
| වෘත්තිය සහ වෙනත් ගාස්තු | 3,151,707 | 7,166,726 |
| සංග්‍රහ වියදම් | 6,866,132 | 6,709,177 |
| උපාධි ප්‍රදානෝත්සවය | 6,237,614 | 4,239,902 |
| විභාග වියදම් | 16,728,006 | 14,409,887 |
| පාරිතෝෂික වෙන් කිරීම | 46,189,544 | 34,349,444 |
| දේපළ ණය පොලී - රජයේ දායකත්වය | 5,662,217 | 5,365,996 |
| | 86,055,421 | 72,817,791 |

සටහන - 26

| ශිෂ්‍යයන්ට මූල්‍ය සහාය | 2017<br>රු.පි. | 2016<br>රු.පි. |
|---|---|---|
| මහපොළ ශිෂ්‍යත්ව | 86,382,100 | 77,436,100 |
| ශිෂ්‍යාධාර | 4,616,200 | 7,296,400 |
| ප්‍රදාන ශිෂ්‍යත්ව | 77,000 | 204,500 |
| | 91,075,300 | 84,937,000 |

සටහන - 27

| කොන්ත්‍රාත්තුමය සේවා | 2017<br>රු.පි. | 2016<br>රු.පි. |
|---|---|---|
| ප්‍රවාහනය | 1,799,174 | 1,952,782 |
| විදුලි සංදේශ | 58,157,251 | 51,744,084 |
| තැපැල් ගාස්තු | 2,063,808 | 2,023,538 |
| විදුලිය | 86,933,117 | 84,287,517 |
| ආරක්ෂක සේවා | 27,424,884 | 14,675,924 |
| ජලය | 7,083,699 | 6,702,577 |
| පිරිසිදු කිරීමේ සේවා | 57,030,592 | 52,585,613 |
| කුලී සහ හයර් ගාස්තු | 9,622,145 | 1,702,598 |
| වරිපනම් සහ බදු | 244,543 | 24,768 |
| මුද්‍රණ සහ වෙළඳ ප්‍රචාරණ | 9,100,101 | 5,252,603 |
| වෙනත් | 365,667 | 474,214 |
| | 259,824,981 | 221,426,217 |

| සටහන - 28 | 2017 | 2016 |
|---|---|---|
| සැපයුම් සහ පාරිභෝජන | රුපි. | රුපි. |
| ලිපිද්‍රව්‍ය | 25,217,982 | 29,291,281 |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 10,452,137 | 9,258,954 |
| යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 100,350 | 4,017,745 |
| රසායන සහ විදුරු භාණ්ඩ | 2,035,829 | 2,282,182 |
| වෙනත් සැපයුම් (මෘදුකාංග, නඩත්තු අයිතම ආදිය) | 62,211,404 | 71,791,711 |
| | 100,017,702 | 116,641,873 |

| සටහන - 29 | 2017 | 2016 |
|---|---|---|
| නඩත්තු | රුපි. | රුපි. |
| වාහන | 12,881,561 | 10,080,188 |
| පිරියත යන්ත්‍ර සහ උපකරණ | 23,263,347 | 22,634,212 |
| ගොඩනැගිලි සහ ව්‍යුහ | 8,492 | - |
| ගෘහ භාණ්ඩ | - | 114,100 |
| වෙනත් | - | 15,000 |
| | 36,153,399 | 32,843,500 |

| සටහන - 30 | 2017 | 2016 |
|---|---|---|
| මූල්‍ය පිරිවැය | රුපි. | රුපි. |
| බැංකු ගාස්තු | 617,208 | 585,981 |
| | 617,208 | 585,981 |

| සටහන - 31 | 2017 | 2016 |
|---|---|---|
| උත්පාදිත ආදායම / වියදම | රුපි. | රුපි. |
| පශ්චාත් උපාධි පාඨමාලා | 176,509,742 | 186,905,145 |
| කෙටි කාලීන පාඨමාලා | 46,327,616 | 34,625,220 |
| උපදේශක ව්‍යාපෘති | 285,725,938 | 260,867,572 |
| | 508,563,296 | 482,397,938 |

මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සටහන්

| සටහන - 32 | 2017 | 2016 |
|---|---|---|
| මුදල් සහ මුදල් සමාන දෑ | රුපි. | රුපි. |
| ආයෝජන (දිගු කාලීන) | 481,461,273 | 359,218,761 |
| බැංකු මුදල් | 105,071,661 | 161,087,881 |
| අතැති මුදල් | 3,200 | - |
| මුදල් සහ මුදල් සමාන දෑ | 586,536,134 | 520,306,642 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඵච්ඊඩී/බී/ශුපාආ/6/17/එෆ්

ඔබේ අංකය
உமது இல.
Your No }

දිනය
திகதி
Date } 2018 ඔක්තෝබර් 22දින

උපකුලපති

මොරටුව විශ්වවිද්‍යාලය.

මොරටුව විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

මොරටුව විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත යථාකාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනමව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතීන්ට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු

විශ්වවිද්‍යාලය සිය පර්යේෂණ තුලින් සිදු කරනු ලබන නව සොයාගැනීම්වල අයිතිය කෝඩජෙන් ඉන්ටනැෂනල් පුද්ගලික සමාගමට සම්පූර්ණයෙන් පැවරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය සමග ඇතිකර ගත් ගිවිසුම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ප්‍රදාන උපයෝගී කරගෙන මිලදී ගන්නා වත්කම් හා පරිත්‍යාග ලෙස ලැබෙන වත්කම්වල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමානුකූල පදනමකට රාජ්‍ය ප්‍රදාන හා පරිත්‍යාග විලම්භිත ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත්, විශ්වවිද්‍යාලය විසින් ඊට පටහැනි ලෙස ප්‍රාග්ධන ප්‍රදාන, පරිත්‍යාග හා උත්පාදිත අරමුදල් සියයට 10 කින් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග හා උත්පාදිත අරමුදල් වලින් මිලදී ගත් වත්කම්වල වටිනාකමින් සියයට 10 බැගින් පිළිවෙලින් රු.81,085,033 ක් හා රු.7,397,820 ක් විලම්භිත ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාස්තු විද්‍යා ගොඩනැගිල්ලේ අදියර IV ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණු රු. 1,005,799 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) 2017 වර්ෂයේදී පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු රු.667,104,496 ක් වටිනාකමැති නේවාසිකාගාර ගොඩනැගිල්ල භාවිතා කිරීමට සුදුසු තත්ත්වයට පත්වූ දින සිට ක්ෂය කළයුතු වුවද 2017 වර්ෂයට අදාල ක්ෂය ගැලපුම් සිදුකර නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට පැවති පිරිවැය රු.4,366,962,846 ක් වූ වත්කම් පිළිබඳව තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති තක්සේරු වාර්තාවන්හි, වත්කම්වල ඉදිරි ඵලදායී ජීවිත කාලය සඳහන් කර නොතිබීම නිසා තක්සේරු කළ වත්කමෙහි ආරම්භක අවස්ථාවෙහි සලකන ලද ඵලදායී ජීවිත කාලය මත පදනම්ව ක්ෂය කර තිබුණි.

(ඈ) උපාධි ලෝගු, මාල හා හිස්වැසුම් යන අයිතම එක් ගිණුමක දක්වා තිබුණු අතර 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ සම්පූර්ණ ශේෂය ප්‍රත්‍යාගණනය කිරීමෙන් තොරව මාල සහ හිස්වැසුම්වල වටිනාකම පමණක් රු.1,724,300 ක් ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර තිබුණි. එමෙන්ම 2013 වර්ෂයේදී එම ගිණුමේ සම්පූර්ණ ශේෂය ප්‍රත්‍යාගණන ගිණුමට ගෙන තිබීම හේතුවෙන් උපාධි ලෝගුවල වටිනාකම් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වලින් සම්පූර්ණයෙන් අත්හැරී තිබුණි. තවද උපාධි මාල සහ හිස්වැසුම්වල නව ප්‍රත්‍යාගණිත වටිනාකම වූ රු.1,724,300 වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රු.344,860 ක් ක්ෂය කළයුතු වුවත් ඒ සඳහා ගැලපීම් කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළ ආයෝජනය කරන ලද රු. 70,000,000 ක් ආයෝජන ගිණුමට හරකිරීම වෙනුවට උපදේශක සේවා සංචිත අරමුදල් ගිණුමට හරකර තිබුණි. එම ආයෝජන වෙනුවෙන් සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.253,290 ක පොළිය ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අවසන් ගිණුම් අනුව වාස්තු විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ IV වන අදියර (Building for Faculty of Architecture Phase IV) සඳහා වූ නොනිමි වැඩ වටිනාකම රු.97,216,592 ක් වුවද මූල්‍ය කටයුතු අංශයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එම වටිනාකම රු.98,198,390 ක් වූයෙන් රු.981,798 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයයන් තුනක ක්ෂය වෙන්කිරීම් ශේෂය රු.654,903,732 ක් වුවද ලෙජර් ගිණුම් අනුව එම වටිනාකම රු.683,684,440 ක් වූයෙන් රු.28,580,708 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනට ගබඩා තොග ශේෂය රු.16,018,174 ක් වුවද උපලේඛන අනුව එම ශේෂය රු.15,759,988 ක් වූයෙන් රු.258,186 ක වෙනසක් පැවතුණි.

(ඈ) රාජ්‍ය ප්‍රදාන පදනම් කරගනිමින් මිලදී ගන්නා ලද වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ක්ෂය ප්‍රමාණය රු.569,749,583 ක් වුවද සමාලෝචිත වර්ෂයේ ක්‍රමක්ෂය ලෙස රු.577,147,403 ක් කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගැනීම හේතුවෙන් රු.7,397,820 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

විදුලි උත්පාදන යන්ත්‍ර 07 ක් මිලදී ගැනීමට අදාලව ලිපිගොනු හා මූලික ලියවිලි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම යන්ත්‍ර කුමන දිනයක ස්ථාපිත කළේද යන්න හඳුනාගත නොහැකි විය. එසේම 2018 අගෝස්තු 24 දින වනවිටත් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අධ්‍යයන නිවාඩු ලබා විදේශගත වූ ආචාර්යවරුන් 31 දෙනෙකු අදාළ ගිවිසුම් කඩකර තිබුණු අතර 2018 ජූලි 25 දින වන විට ඉන් 29 දෙනෙකුගෙන් එකතුව රු. 51,788,857 ක මුදලක් අයවියයුතුව පැවතුණි. ඉතිරි ආචාර්යවරුන් දෙදෙනාගෙන් අයකරගත යුතු වටිනාකම ගණනය කර නොතිබුණි. ආචාර්යවරුන් 08 දෙනෙකුගෙන් අයවියයුතු එකතුව රු.7,573,815 ක් ඔවුන්ගේ අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීම සඳහා අදාළ ආචාර්යවරුන් වසර දෙකකට වැඩි කාලයක සිට එකඟතාවය ලබාදී තිබුණ ද එම මුදල් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. එමෙන්ම වසර 10 කට වැඩි කාලයක සිට ආචාර්යවරුන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.1,473,002 ක මුදලක් අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත 3 (ආ) වගන්තිය | විශ්වවිද්‍යාලයේ ස්වයං මූල්‍යයන කටයුතු වලින් උත්පාදිත ආදායම මත 2017/18 වර්ෂයේ දෙවන හා තුන්වන කාර්තු වෙනුවෙන් ආර්ථික සේවා ගාස්තුව රු.809,834 ක් අඩුවෙන් ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 128 | ආයතනයක ගණන් දීමේ නිලධාරියා මූල්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වගකීමට බැඳෙන අතර මුදල් ලැබීම, ගෙවීම හා තිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වාගෙන යනබවට හා එම ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කලට සෝදිසි කරන බවටද වගබලා ගත යුතුය. එසේ වුවද නිසි අධීක්ෂණය නොමැති වීම හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් ලංකා බැංකුවේ පවත්වාගෙන යන අංක 306795 දරන ජංගම ගිණුමට අදාලව මුදල් පොත හා බැංකු සැසඳුම් ප්‍රකාශ සම්මත අයුරින් පිළියෙලකර නොතිබුණු අතර බැංකු ප්‍රකාශනයේ ගනුදෙනු පදනම් කරගෙන මුදල් පොත පිළියෙල කිරීම පමණක් සිදුකර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 507 (1) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.16,506,308 ක් වූ තොග වටිනාකම තුළ විශ්වවිද්‍යාලයෙහි නඩත්තු අංශය සතුව පැවති තොගය ඇතුළත් කර නොතිබුණු අතර නඩත්තු ගබඩාව 2017 දෙසැම්බර් 31 දිනට තොග සත්‍යාපනයක් ද සිදුකර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) රාජ්‍ය වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක CSA/81/40 හා 2007 පෙබරවාරි 28 දිනැති ජනාධිපති කාර්යාල චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය විසින් චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස එකතුව රු. 3,871,682 ක මුදලක් රැස්වීම, සම්මන්ත්‍රණ වැඩමුළු ආදිය පැවැත්වීම සඳහා ආහාරපාන සහ නවාතැන් ගාස්තු වෙනුවෙන් හෝටල් වෙත ගෙවා තිබුණි. |
| (ඈ) රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ | |
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | ආයතනය සතුව පවතින රු.9,886,061,960 ක් වූ ස්ථාවර වත්කම සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | ආයතනය සතු පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ යටතේ 2015 සැප්තැම්බර් 16 දිනැති අංක 13/2015 දරන ආයතන චක්‍රලේඛ ලිපිය | විශ්වවිද්‍යාලයේ නිල වාහන ලබාදෙනු ලබන නිලධාරීන් සඳහා ඉන්ධන දීමනාව මාසික වැටුපට එකතු කර ගෙවීම් කළයුතු වුවද 2017 වර්ෂයේ ජනවාරි සිට ඔක්තෝබර් මස දක්වා නිලධාරීන් 10 දෙනෙකුට එකතුව රු.752,926 ක මුදලක් ඉන්ධන දීමනා ලෙස මුදලින් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 58,682,610 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 229,602,809 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.170,920,199 ක වර්ධනයක් පැවතුණි. වර්ෂයේ ආදායම රු.543.679.722 කින් වැඩිවී තිබුණද වියදම රු.372,759,523 කින් වැඩිවීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 05 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී රු.64,407,671 ක් වූ ඌනතාවය 2014 වර්ෂය දක්වා අඛණ්ඩව පිරිහී 2015 වර්ෂයේදී නැවත වර්ධනයක් දක්නට ලැබුණ ද 2016 වර්ෂයේදී රු. 229,602,809 ක් දක්වා පිරිහීමක් දක්නට ලැබුණු අතර 2017 වර්ෂයේ නැවත වර්ධනයවී රු. 58,682,611ක ඌනතාවයක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා දේපල පිරියත හා උපකරණ සඳහා ක්ෂය නැවත ගැලපීමෙන් පසු 2012 වර්ෂයේදී රු.665,988,174 ක් වූ විශ්වවිද්‍යාලයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,538,431,528 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 3.2 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

විශ්වවිද්‍යාලය විසින් බාහිර ආයතනයකට විරුද්ධව රු.මිලියන 05 ක වන්දි ඉල්ලා මොරටුව දිස්ත්‍රික් අධිකරණයේ නඩුවක් පවරා ඇති අතර එම නඩුවේ විත්ති පාර්ශවය විසින් එම නඩුව සම්බන්ධව මහාධිකරණයට ඇපෑලක් ඉදිරිපත් කර තිබුණි. එමෙන්ම බාහිර හා අභ්‍යන්තර පාර්ශවකරුවන් 06 දෙනෙකු විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණවල නඩු පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය සඳහා අයවැය මගින් පර්යේෂණ ප්‍රදාන සඳහා වෙන්කර තිබුණු රු.මිලියන 40 ක ප්‍රතිපාදනය රු.මිලියන 55 ක් දක්වා පසුව සංශෝධනය කර තිබුණද 2017 දෙසැම්බර් 31 දිනට එම සීමාව ඉක්මවා රු.12,700,127 ක් වැයකර තිබුණි.

(ආ) 2017 වර්ෂය තුළ අවම වශයෙන් එක් පර්යේෂණ ව්‍යාපෘතියක හෝ නිරතවූ පර්යේෂණ ප්‍රදානලාභීන් ගණන 72 ක් විය. සනාතන සභා පර්යේෂණ කමිටුව විසින් 2017 දෙසැම්බර් 31 දින වනවිට අනුමත කර තිබුණු පර්යේෂණ 169 ක් අතරින් 30 ක නියැදියක් පිළිබඳව කරන ලද පරීක්ෂාවේදී සමාලෝචිත වර්ෂයේදී නිමකළ යුතුව තිබූ එකතුව රු.12,385,150 ක් වූ පර්යේෂණ 14 ක් නිමකර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම වලදී අදාල කරගන්නා වෙබෝ මෙට්‍රික් නිර්ණායකයන් අනුව විශ්වවිද්‍යාලය තුළින් උත්පාදිත දැනුම වර්ධනයට පර්යේෂණයන්ගේ දායකත්වය ඉහළ විය යුතු අතර ඒ අනුව වාර්ෂිකව සිදුකරන පර්යේෂණයන් විශ්වවිද්‍යාලය ලෝක ශ්‍රේණිගත කිරීම් අතර මට්ටම තීරණය කිරීමට බලපානු ලබයි. සෑම වර්ෂයකම ජනවාරි සහ ජූලි මාසවල සිදුකරනු ලබන ලෝක ශ්‍රේණිගත කිරීම් වලට අනුව මොරටුව විශ්වවිද්‍යාලය 2017 වර්ෂයේ පිළිවෙලින් 2647 ස්ථානයේ හා 2681 ස්ථානයේ වූ අතර 2018 වර්ෂයේ එම ස්ථාන පිළිවෙලින් 2809 හා 2717 ක් වී තිබුණි.

(ඇ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව විශ්වවිද්‍යාලයීය දේශීය හා විදේශීය සිසුන් පර්යේෂණවල නිරත වීමට අපේක්ෂිත සංඛ්‍යාව පිළිවෙලින් 350 ක් හා 15 ක් වුවද එයින් දේශීය සිසුන් 108 ක් පමණක් පර්යේෂණවල නිරතවී තිබුණි. ක්‍රියාකාරී සැලැස්මෙ ඉදිරිපත් කර ඇති දත්තයන්ට අනුව, 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ පර්යේෂණවල නිරත දේශීය හා විදේශීය සිසුන් සංඛ්‍යාව පිළිවෙලින් සියයට 61 ක් හා සියයට 100 ක පසු බෑමක් නිරූපණය විය. එමෙන්ම වාර්ෂික පර්යේෂණ ඇගයීම් ක්‍රියාවලියේ සිදුවන ප්‍රමාදයද පර්යේෂකයින් අධෛර්යමත් වීමට හේතුවී තිබුණි.

(ඍ) පර්යේෂණවල නිරත වන්නන් සවිබල ගැන්වීම සඳහා 2017 වර්ෂය තුළ රුපියල් මිලියනයක ප්‍රතිපාදන යටතේ පුහුණුවීම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කර තිබුණද, එම කාර්ය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඎ) 2015 නොවැම්බර් 17 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභා ආයතන චක්‍රලේඛ ලිපි අංක 15/2015 ප්‍රකාරව විශ්වවිද්‍යාල විසින් පවත්වනු ලබන විභාගයන්හි ප්‍රතිඵල මාස 03 ක කාලයක් තුළ නිකුත් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද අභ්‍යන්තර විභාග 169 කින් ප්‍රතිඵල ලබා නොදුන් විභාග 6 ක් වන අතර විභාග 90 ක ප්‍රතිඵල නිකුත් කිරීම මාස 3 ඉක්මවා ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය විය.ඒ අනුව ප්‍රතිඵල ලබා නොදීම, සමස්තයක් ලෙස ගත් කළ ප්‍රතිඵල ලබා නොදුන් විභාග 6 ද ඇතුළුව සියයට 57 ක් වැනි ඉහළ අගයක් ගෙන තිබුණි. එමෙන්ම මෙම පාඨමාලා අතරින්, විගණිත දිනය වූ 2018 ජුනි 20 දින වන විට එක් පාඨමාලාවක කණ්ඩායම් 3 ක් සඳහා වූ විභාග 3 ක ප්‍රතිඵල, මාස 08 ක්ද තවත් පාඨමාලාවක කණ්ඩායම් 3 ක් සඳහා වූ විභාග 3 ක ප්‍රතිඵල පිළිවෙලින් මාස 6, මාස 10 සහ මාස 6 ක් ද ලෙස ප්‍රමාදවී තිබුණි.

(ඏ) 2016/17 අධ්‍යයන වර්ෂය සඳහා එක් එක් පාඨමාලාවල එකතුව 68 ක ශිෂ්‍ය පුරප්පාඩු පැවති අතර 2017/2018 අධ්‍යයන වර්ෂය වෙනුවෙන්ද ශිෂ්‍ය පුරප්පාඩු 30 ක් පැවතුණි. ඒ අනුව විශ්වවිද්‍යාලය වෙත බඳවා ගතහැකි ශිෂ්‍ය සංඛ්‍යාව, සම්පූර්ණයෙන් බඳවා නොගැනීම හේතුවෙන් පසුගිය වර්ෂ දෙකෙහි විශ්වවිද්‍යාල ප්‍රවේශය නොලැබුණු ශිෂ්‍යයන් පිළිවෙලින් 68 කට හා 30 කට උසස් අධ්‍යාපනය ලැබීමට තිබුණු අවස්ථාව අහිමි වී ගොස් තිබුණි.

## 4.2 කළමණාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධ්‍යයන නිවාඩු ලබා 1989 වර්ෂයේදී විදේශ ගත වූ ආචාර්යවරයෙකුගෙන් ගිවිසුම කඩකිරීම සම්බන්ධයෙන් රු.1,122,267 ක් අයකර ගැනීම සඳහා පවරන ලද නඩුව විශ්වවිද්‍යාලය විසින් දෙවැනි වරට ආචාර්යවරයාහට විදේශගත වීමට අවසර දීමේදී නිසි පරිදි පරිපාලන ක්‍රමවේදය අනුගමනය කර නොමැතිවීම හේතුවෙන් ගාස්තුවට යටත්ව නිශ්ප්‍රභා කර තිබුණු අතර ගිවිසුම කඩවීම සම්බන්ධයෙන් රු.703,311 ක් හා වැය වී ඇති නඩු ගාස්තු රු.117,300 ක් ලෙස එකතුව රු. 820,611 ක් තවදුරටත් අයකර ගතයුතු වුවද නිලධාරීන්ගේ නොසැලකිල්ල, ප්‍රමාදය, සහ වරද හේතුවෙන් රජයට සිදුවූ පාඩුව අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට 2017 ජුනි 30 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) ගිවිසුම් කඩකල ආචාර්යවරයෙකුගෙන් අයකර ගතයුතු රු.4,093,176 ක ඇපකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා පැවරූ නඩුවක් සම්බන්ධයෙන්, ඇපකරුවන් විසින් අත්සන් කරන ලද ගිවිසුමෙහි ඇප වටිනාකම ලෙස අකුරින් රුපියල් හාරලක්ෂ අනූ තුන් දහස් එකසිය හැත්තෑ පහයි ශත පනස් තුනක් ලෙසත් ඉලක්කමින් රු.4,093,176 ලෙසත් සඳහන්කර තිබුණු බැවින්, අකුරින් ලියූ අගය පිළිගැනීම සාමාන්‍ය සම්මතය බවත්, ඇප ගිවිසුමෙහි අකුරින් හා ඉලක්කමින් ලියා ඇත්තේ බැලූ බැල්මට ගිවිසුමෙහි අනෙක් කොටස් සම්පූර්ණ කළ තැනැත්තා නොවන බවත් ඉලක්කමින් ලියූ වටිනාකම නිවැරදි වුවත් නිවැරදි බවට තහවුරු කිරීමට මොරටුව විශ්වවිද්‍යාලය අපොහොසත් වීමත් ඇපකරුවන්, ඇප ගිවිසුම අත්සන් කර ඇත්තේ 2004 ජනවාරි 05 දිනත් ප්‍රධාන ගිවිසුම අත්සන් කර ඇත්තේ 2004 ජනවාරි 14 වීමත් හේතුවෙන් ඇප ගිවිසුම අත්සන් කරන අවස්ථාවේදී ප්‍රධාන ගිවිසුම අත්සන් කර නොමැති බැවින් ද එම 2004 ජනවාරි 05 දින වනවිට වලංගු නොවන ගිවිසුමට ඇතුලත් කරුණු සම්බන්ධයෙන් ඇපකරුවන් වගකීමට නොබැඳෙන බවත් අධිකරණ තීන්දුව මගින් ප්‍රකාශයට පත්කර තිබුණි. ඒ අනුව විශ්වවිද්‍යාලයෙහි වගකිව යුතු නිලධාරීන් විසින් නොසැලකිලිමත්ව වගකීම් විරහිතව කටයුතු කිරීම හේතුවෙන් මෙවැනි තත්ත්වයක් ඇතිවී තිබුණු බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) 2002 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර සැලසුම්වල පැවති දුර්වලතාවයන් හේතුවෙන් අතරමග නවතා දමා ඇති "Proposed Multipurpose Auditorium" ව්‍යාපෘතියේ සැළසුම් අදියර වෙනුවෙන් වැයකර තිබුණු රු.1,273,329 ක මූලික වියදම් 2017 දෙසැම්බර් 31 දිනටද නොනිමි වැඩ වටිනාකම තුළ ඇතුළත් කර තිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2017 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 954 ක් හා 881 ක් වූ අතර සත්‍ය කාර්ය මණ්ඩලය 514 ක් හා 667 ක් වීමෙන් පිළිවෙලින් 440 ක් හා 214 ක පුරප්පාඩු පැවතුණි. මෙම පුරප්පාඩු පිරවීම සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිවෙලින් 86 ක් හා 71 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. තවද කථිකාචාර්යවරුන්ගේ පැවති පුරප්පාඩු 230 ක් බාහිර කථිකාචාර්යවරුන් මගින් පිරවීමට කටයුතු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ ඒ වෙනුවෙන් රු.47,059,364 ක් වැය කර තිබුණි.

5. තිරසාර සංවර්ධනය

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව විශ්වවිද්‍යාලය විසින් නව විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012.03.23 දිනැති හා අංක HE/ID/2012/03 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව මොරටුව විශ්වවිද්‍යාල පරිපාලන ගොඩනැගිල්ල සඳහා වූ රු.මිලියන 171 ක් වූ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. මිලියන 282 දක්වා සංශෝධනය කිරීමත්, දළ බිම් ප්‍රමාණය වර්ග මීටර් 3950 කින් යුත් පස් මහල් ගොඩනැගිල්ලක් ලෙස සම්පූර්ණ කිරීමත් ව්‍යාපෘතිය 2012 ආරම්භ කර වසර 2016 දී සම්පූර්ණ කිරීමත් කළයුතු වූවද ඊට පටහැනිව මහල් 4 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකර 2017 වර්ෂයේදී නිමකර තිබුණි.

(ආ) (i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 හා 2007 ඔක්තෝබර් 03 දින නිකුත් කරන ලද අතිරේක 14 හි විධිවිධානයන් පරිදි මුළු පිරිවැය ඇස්තමේන්තුව සියයට 10 ඉක්මවා යනවිට සංශෝධිත පිරිවැය ඇස්තමේන්තුව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළයුතු අතර විචලන නියෝග නිකුත් කිරීමට පෙර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමතිය ලබා ගත යුතුය. ඊට පටහැනි ලෙස මුළු පිරිවැය ඇස්තමේන්තුව සියයට 22 ක් ඉක්මවා තිබියදී අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණ අතර එකතුව රු.44,317,130 ක් සඳහා නිකුත් කර තිබුණු විචලන නියෝග 16 ක් සඳහා ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) නිකුත් කර තිබුණු එකතුව රු.41,906,020 ක් වූ විචලන නියෝග 10 ක් සඳහා ගෙවීම් කර තිබුණද විශේෂ පට්ටයන් සඳහා උපදේශන ආයතනයේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(iii) 2017 සැප්තැම්බර් 06 දින විවෘත කරන ලද ඉහත ගොඩනැගිල්ලේ 2017 අගෝස්තු 30 දින කළ ස්ථානීය පරීක්ෂාවේදී හඳුනාගත් අඩුපාඩු 2018 ජුලි 31 වන විටද සකස් කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය ඉදිකිරීම ක්ෂේත්‍රය හා සම්බන්ධ උපදේශනාත්මක සේවාවන් ආයතන වලට සැපයීමේ ආයතනයක් වුවද සිය පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් තම ආයතනය සතු ශිල්පීය හා තාක්ෂණික සේවා දැනුම උපයෝගි කර ගැනීමකින් තොරව රු.4,545,000 ක් වැයකර පෞද්ගලික ආයතනයකින් උපදේශන සේවය ලබාගෙන තිබුණු අතර යෝජිත වාස්තු විද්‍යා ගොඩනැගිල්ල අදියර II ඉදිකිරීම සම්බන්ධයෙන් ද රු.මිලියන 5 ක් (වැට රහිත) වැයකර උපදේශන සේවාව වෙනත් පෞද්ගලික ආයතනයකින් ලබාගෙන තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (iii) අනුව කොන්ත්‍රාත්කරුට සිදු කරනු ලබන ගෙවීම් වලින් සියයට 90 ක් සම්පූර්ණ වීමට ප්‍රථම සවලීකරන අත්තිකාරම් ලෙස ගෙවූ මුදල සම්පූර්ණයෙන් අයකරගත යුතු වුවද, කොන්ත්‍රාත් වටිනාකම රු.97,672,271 ක් (බදු රහිතව) වූ යෝජිත වාස්තු විද්‍යා ගොඩනැගිල්ල ඉදිකිරීම් ව්‍යාපෘතියේ අදියර II සම්බන්ධයෙන්, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.16,995,389 ව්‍යාපෘතිය අවසන් වී මාස 17 ක ප්‍රමාදයකින් පසුව එනම් 2015 අගෝස්තු 06 දින අයකරගෙන තිබුණි.

## 6.1 නොවිසඳී ඇති විගණන ඡේද

(අ) 2018 අප්‍රේල් 04 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් විශ්වවිද්‍යාලය තුළ අනුමතියකින් තොරව පවත්වාගෙන යනු ලබන යුනි කන්සල්ටන්සි සර්විසස් සමාගම සඳහා 2018 අගෝස්තු 13 දින වන විටත් නීත්‍යානුකූල තත්ත්වයක් ඇතිකිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයෙන් පසුව භාණ්ඩ සමීක්ෂණයක් සිදු නොකිරීම සම්බන්ධයෙන් පරීක්ෂාවේදී 2018 ජුලි 31 දින වන විටත් පුස්තකාල පොත් සමීක්ෂණයක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මොරටුව විශ්වවිද්‍යාලය හා කෝඩජෙන් ඉන්ටර්නැෂනල් සමාගම සමග ඇති කරගත් ගිවිසුම සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් මයක් ඇතුළත කාරක සභාවට ලබාදිය යුතු වුවත් එසේ වාර්තාවක් ලබාදී නොතිබුණි. කෙසේ වෙතත්, මෙම ගිවිසුම සම්බන්ධයෙන් පහත කරුණු ද නිරීක්ෂණය විය.

(i) ඉහත ගිවිසුම ඇතිකර ගැනීම සඳහා තොරතුරු හුවමාරු මාධ්‍යය ලෙස ඊමේල් පණිවිඩ භාවිතා කර තිබූ අතර විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කර ඇති බුද්ධිමය දේපල සම්බන්ධයෙන් වූ ප්‍රතිපත්ති සංග්‍රහයේ viii කරුණට අනුව විශ්වවිද්‍යාලයේ උපකුලපති යනු බුද්ධිමය දේපල සම්බන්ධයෙන් වූ දෙපාර්ශවයකා සම්කිසි කරුණක් සම්බන්ධයෙන් "මැදිහත්කරු" ලෙස ක්‍රියා කරන්නෙකු පමණක් බව සඳහන් වුවද , ඊට අනුකූල නොවන ලෙස මෙම ගිවිසුමට එළඹීම සඳහා ආරම්භයේ සිටම උපකුලපති මූලික වී කටයුතු කර තිබුණි.

(ii) කෝඩජෙන් ආයතනයේ සභාපති මෙන්ම විධායක නිළධාරියා , 2015 අප්‍රේල් 20 දින විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස පත්වී ඇති අතර 2016 ජූලි 16 දිනැති විශ්වවිද්‍යාල උපකුලපතිගේ ලිපිය මගින් වාර 3ක් පාලක සභාවට නොපැමිණීම හේතුවෙන් සාමාජිකත්වය අහෝසි කර තිබුණු අයෙක් බවද අනාවරණය විය.

(ඈ) නව ආපනශාලා සංකීර්ණය සඳහා අවශ්‍ය පුටු හා මේස රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාවලියෙන් බැහැරව කුලී පදනම මත ලබාගැනීම සම්බන්ධයෙන් මාස 03 ක් ඇතුලත කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද 2018 අගෝස්තු 10 දින වනවිටද ඒ අනුව කටයුතු කර නොතිබුණි. විශ්වවිද්‍යාලය විසින් 2011 ජූලි 10 දින පවත්වන ලද මූලික විමර්ශන වාර්තාව අනුව මූල්‍යාධිකාරිද ඇතුළුව 4 දෙනෙකුට කරුණු විමසා විධිමත් පියවර ගැනීම නිර්දේශ කර තිබුණු අතර 2016 දෙසැම්බර් 07 දින 430 වන පාලක සභා තීරණවලට අනුව ඉහත නිලධාරීන්ට චෝදනා පත්‍ර ගොනු කිරීම සඳහා අනුමැතිය දී තිබුණද 2017 ජනවාරි 04 දිනැති 431 පාලක සභා අනුමැතියෙන් මූල්‍යාධිකාරිට හැර අනෙක් තිදෙනාට චෝදනා පත්‍ර නිකුත් කිරීමට අනුමැතිය ලබාදී තිබුණි. එම චෝදනාවන්ගෙන් ඔහු නිදහස් කිරීමට තරම් පිළිගතහැකි සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණද පාලක සභාව විසින් ඔහුට විරුද්ධව තිබූ චෝදනා පත්‍ර ඉවත් කිරීමට අනුමැතිය දී තිබුණි.

7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මගින් එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර නෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව කටයුතු නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබීම. |
| (ඇ) | අරමුදල් කළමනාකරණය | අරමුදල් ඇති කිරීමේ අරමුණු ඉටු කර ගැනීමට ක්‍රියා නොකිරීම. |
| (ඈ) | ගබඩා පාලනය | ගබඩා පොත්පත් හා බින්කාඩ්පත් යාවත්කාලීනව පවත්වාගෙන නොතිබීම හා විධිමත් අධීක්ෂණයක් සිදු නොකිරීම. |
| (ඉ) | කාර්යමණ්ඩල පරිපාලනය | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම සිදුනොකිරීම. |
| (ඊ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය නොකිරීම. |
| (උ) | භාණ්ඩ සමීක්ෂණය | විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් ඇතුළු සියළුම අංශ ආවරණය වන පරිදි සමීක්ෂණ සිදු නොකිරීම. |
| (ඌ) | ඉදිකිරීම් කොන්ත්‍රාත් | විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් ක්‍රියාවලියේදී විශ්වවිද්‍යාලයේ උපදේශනාත්මක ඇතුම ඒ සඳහා යොදා නොගැනීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

දුරකථන අංක
தொலைபேசி இல
Telephone Nos.

උප කුලපති
உப வேந்தர்
Vice-Chancellor } 2651259

කාර්යාලය
அலுவலகம்
Office } 2650168 2650301 2650340 2650441 2650534

Fax No } 2650622 2651671

මගේ අංකය
எனது இல
My No }

ඔබේ අංකය
உமது இல
Your No }

මොරටුව
மொறட்டுவை
Moratuwa

මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
மொறட்டுவைப் பல்கலைக்கழகம், இலங்கை
UNIVERSITY OF MORATUWA, SRI LANKA

දිනය
திகதி
Date } 2019.01.16

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය
අංක 306/72,
පොල්දුව පාර,
බත්තරමුල්ල.

**මොරටුව විශ්වවිද්‍යාලයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක එච්ආර්ඩී/සී/යූඑම්/6/17/එෆ්/ඒ හා 2018 ඔක්තෝම්බර් 22 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ.

උක්ත වාර්තාවේ සඳහන් කරුණු සම්බන්ධයෙන් පහත පැහැදිලි කිරීම් දක්වමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු

කෝඩිජෙන් ඉන්ටර්නැෂනල් පුද්ගලික සමාගම සම්බන්ධිත පාර්ශවයක් ලෙස නොසැලකෙන බැවින් මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමක් අවශ්‍ය නොවේ.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

රාජ්‍ය ප්‍රදාන පරිත්‍යාග හා උත්පාදිත අරමුදල් මත ක්‍රමක්ෂය හඳුනාගැනීමේදී එම අරමුදල් මගින් මිලදී ගන්නා වත්කම්වල ඵලදායී ජීවිත කාලයට අනුරූපීව ක්‍රමක්ෂය කිරීම අත්‍යවශ්‍ය නොවන අතර ඒවා ක්‍රමානුකූල පදනමක් මත ක්‍රමක්ෂය කිරීමක් පමණක් අවශ්‍ය වේ. එමෙන්ම රාජ්‍ය ප්‍රදාන, එමගින් මිලදී ගන්නා ලද වත්කම්වල ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමක්ෂය කර ඇත. තවද, 2016.12.31 දක්වා පරිත්‍යාග හා උත්පාදිත අරමුදල් ක්‍රමක්ෂය කිරීමක් නොකළ අතර එම 2017 වර්ෂයේ පටන් ක්‍රමක්ෂය කිරීම ආරම්භ කරන ලදී. එහිදී එම අරමුදල් 10%ක් බැගින් වාර්ෂිකව ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී. ඉහත බලපෑ ප්‍රමාණයක් පත්‍රාව නම් පරිත්‍යාග හා උත්පාදිත අරමුදල් මත අත්පත් කරගන්නා ලද වත්කම් වල වාර්ෂික ක්ෂය වෙන වෙනම ගණනය කළ නොහැකි වීමය. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී උචිත ගිණුම්කරණ ප්‍රතිපත්ති සකස් කර ගැනීමේ හැකියාවක් ආයතනයක් ලෙස ඇති බවද දන්වමි.

2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මෙම දෝෂය 2018 ජූලි මස ජර්නල් අංක 198 මගින් නිවැරැදි කර ඇත.

(ආ) අදාල නේවාසිකාගාර ගොඩනැගිල්ල දෙසැම්බර් මාසයේදී ප්‍රාග්ධනිත කර ඇති බැවින් ඒ සඳහා ක්ෂය වෙන් කිරීමක් කර නොමැත. මෙම නේවාසිකාගාර ගොඩනැගිල්ල වෙනුවෙන් 2017 වර්ෂයට අදාළ ක්ෂය වටිනාකම ගිණුම්ගත කිරීමට පියවර ගනු ලැබේ.

(ඇ) මෙම වත්කම් ප්‍රත්‍යගණනයේදී අති විශාල වත්කම් ප්‍රමාණයක් ප්‍රත්‍යගණනය කළ අතර එහිදී එකිනෙක වත්කමේ ඉතිරි ඵලදායී කාලය පදනම් කර ගනිමින් ක්ෂය ගණනය කිරීම ප්‍රායෝගික නොවන බැවින් අදළ වත්කම් පන්තියට අදළ ක්ෂය අනුපාතය යොදා ගනිමින් ක්ෂය ගණනය කර ඇත.

(ඈ) ස්ථාවර වත්කම් ලේඛනය තුළ මේවා වෙනවෙනම සටහන් කරන අතර ලෙජර ගිණුම එක් වත්කම් පන්තියක් ලෙස නිරූපනය කරනු ලබයි. එය පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුගත වීමකි. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට මෙම උපාධි ලේඛ ප්‍රත්‍යගණය කිරීම මගහැර ඇති අතර ඒවා විශ්වවිද්‍යාලයීය කණ්ඩායමක් මගින් ප්‍රත්‍යගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම උපාධි මාල සහ හිස්වැසුම්වල නව ප්‍රත්‍යගණන වටිනාකම වෙනුවෙන් 2017 වර්ෂයේදී ක්ෂය ගිණුම්ගත කිරීම මගහැර ඇති අතර එය 2018 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) 2018 ජූලි මස ජර්නල් අංක 227 මගින් ආයෝජන ගිණුමට මාරු කර ඇත. මෙම ස්ථාවර තැන්පතුව මත ලැබිය යුතු පොළිය 2018 ජූලි මස ජර්නල් අංක 88 මගින් ගිණුම්ගත කර ඇත.

2.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

(අ) 2017 නොවැම්බර් මස 07 දින 1644 වවුචරය මගින් වාස්තුවිද්‍යා ගොඩනැගිල්ල අදියර iv ඉදිකිරීම් ව්‍යාපෘතියට ගෙවා තිබූ රු.1,005,797ක මුදල ගොඩනැගිලි පුනරුත්ථාපන හා අළුත්වැඩියා වියදමක් ලෙස සටහන් වී තිබීමත්, 2017 දෙසැම්බර් මස 05 දිනැති වවුචර් අංක 1844 මගින් ඉහත ව්‍යාපෘතියට අදළව ගෙවන ලද රු.24,000ක මුදල මූලධන කටයුතු අංශයේ පොත්වල සටහන් නොවීමත් මෙම වෙනසට හේතු වේ. ඉහත වවුචර් අංක 1644 මගින් සිදු වී ඇති දෝෂය 2018 ජූලි මස ජර්නල් අංක 198 මගින් නිවැරදි කර ඇත.

ඒ අනුව 2017.12.31 දිනට මෙම ව්‍යාපෘතියේ නොනිමි වැඩවල වටිනාකම රු. 98,222,389 කි.

(ආ) 2017.12.31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මුළු ක්ෂය වෙන්කිරීමේ ශේෂයේ හා ලෙජර් ගිණුම් අනුව ක්ෂය වෙන්කිරීමේ ගිණුම්වල ශේෂයන්ගේ එකතුවෙහි වෙනසක් නොමැත. ක්ෂය වෙන් කිරීම් ගිණුම් අතර පවතින වෙනස්කම් 2018 වර්ෂයේදී ගැලපීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) 2017 වර්ෂයේ ජර්නල් අංක 599 මගින් රු. 95,000 ක් ගබඩා අත්තිකාරම් ගිණුමට වැඩියෙන් හරවී තිබූ අතර 2017 වර්ෂයේ බඩු නිකුත් කිරීමේ පත්‍රිකා අංක 13802 හි රු. 113,910.01 අඩුවෙන් සටහන්ව තිබුණි. මෙම හේතූන් මත ගබඩා තොග ශේෂය රු. 208,910.01 වැඩියෙන් දක්වා ඇත. මෙම දෝෂයන් 2018 අගෝස්තු මාසයේදී නිවැරුදි කර ඇත.

ඉතිරි වෙනස වන රු. 49,275.99 පෙර වර්ෂයන් සිට පැමිණෙන්නක් වන බැවින් එය ගබඩා අත්තිකාරම් ගිණුමේ ගැලපීම සඳහා කටයුතු කරනු ලැබේ.

(ඇ) රාජ්‍ය ප්‍රදාන මගින් මිලදී ගන්නා ලද වත්කම් ඇතුළු සියළුම වත්කම් වෙනුවෙන් වර්ෂයට අදල මුළු ක්ෂය වටිනාකම රු. 480,268,352 ක් වන අතර සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මුළු ක්‍රමක්ෂය වටිනාකම රු. 577,147,403 වේ. මෙම රු 577,147,403 ක ක්‍රමක්ෂය වටිනාකම සකස් වී ඇත්තේ රාජ්‍ය ප්‍රදනවලට අදල රු. 488,664,550 , පරිත්‍යාග වලට අදල රු. 81,085,033 හා උත්පාදිත අරමුදල් වලට අදල රු. 7,397,820 ට වටිනාකම්වල එකතුවෙනි

ඔබගේ වාර්තාවේ සඳහන් රු. 7,397,820 ක වෙනස උත්පාදිත අරමුදල් මත වන ක්‍රමක්ෂය වටිනාකම වන අතර එය නිවැරදිව ක්‍රමක්ෂය ගිණුමේ ගලපා ඇත.

2.2.5. විගණනය සඳහා සාක්ෂි නොවීම

මේ සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා අදල නිලධාරීන් දැනුවත් කර ඇති අතර අදල ලිපි ගොණු හා තොරතුරු ලැබීමෙන් පසු ස්ථාවර වත්කම් ලේඛණයට ගැනීමට පියවර ගනු ලැබේ.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) මෙම නිලධාරීන් අතුරින් 02 ගෙන් ලැබිය යුතු ශේෂය වන රු.218,953 ක් 2017.12.31 දින වන විට අය කර ගෙන ඇති අතර එය 2017.12.31 දිනට ලැබිය යුතු ණය උපලේඛනයේ නොමැත.

එමෙන්ම තවත් නිලධාරියකු ගෙන් ලැබිය යුතු ශේෂය 2018 අගෝස්තු මාසයේ පටන් ඔහුගේ වැටුපෙන් අය කර ගැනීම ආරම්භ කර ඇත. තවත් නිලධාරීන් දෙදෙනෙකු වැටුප් රහිත නිවාඩු ලබා සිටින අතර ඔවුන් නැවත සේවයට වාර්තා කල පසු ඔවුන් ගෙන් අයවිය යුතු වටිනාකම් හිඟ පොලියද සමඟ ඔවුන්ගේ වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

අනෙක් නිලධාරීන් 05 දෙනා සේවයෙන් ඉවත් වී / සේවය අතහැර ගියා සේ සලකා ඇත. ඔවුන්ගේ අර්ථසාධක අරමුදල් මේ දක්වා නිදහස් කර නොමැති අතර ඒ මගින් මෙම ශේෂයන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම.

(අ) 2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතට අනුව ආර්ථික සේවා ගාස්තු අදල පිරිවැටුමෙන් 0.5% ක් හා 2009 අංක 09 දරණ ජාතිය ගොඩ නැගීමේ බදු පනතට අනුව අදල පිරිවැටුමෙන් 2% ක් ජාතිය ගොඩ නැගීමේ බදු ගෙවිය යුතුය.

මෙම ආර්ථික සේවා ගාස්තු (ESC) හා ජාතිය ගොඩ නැගීමේ බදු (NBT) එකම පදනමක් මත වෙනස් බද අනුපාත 2 ක් යටතේ ගෙවිය යුතුය. 2017/18 වර්ෂයේ පළමු කාර්තුව දක්වා ස්වයං මූල්‍ය කටයුතුවලින් ලද සියළුම මුදල් ආර්ථික සේවා ගාස්තු ගණනය සඳහා සලකා තිබූ අතර 2017/18 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට අදළ පිරිවැටුම මත පමණක් ආර්ථික සේවා ගාස්තු ගණනය කර ඇත. 2017/18 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට ආර්ථික සේවා ගාස්තු ගණනය කිරීම සඳහා යොදා ගන්නා ලද පදනම 138 වන මුදල් කමිටුව මගින් නිර්දේශ කරන ලද අතර 455 වන පාලක සභාව මගින් අනුමත කර ඇත.

(ආ) (i)

මෙම නේවාසිකාගාර ගිණුම ආරම්භ කරන ලද්දේ නේවාසිකාගාරය සම්බන්ධ සුළු ආදයම් රැස්කර ගැනීම හා නේවාසිකාගාරය වෙනුවෙන් වන සුළු වියදම් දැරීමේ අරමුණ සහිතවය. එහිදී එහි පරිපාලනමය පහසුව සඳහා නේවාසිකාගාර කාර්යාලයට මෙම ගිණුම පවත්වා ගෙන යාම සඳහා අවසර ලබා දී ඇත. එහිදී ආදයම් රැස්කිරීමේ ක්‍රියාවල්යේදී සියුන් විසින් ගෙවිය යුතු මුදල සඳහන් පත්‍රිකාවක් (Pay in Slip) ඔවුන්ට ලබා දෙන අතර ඒ අනුව ඔවුන් විසින් එම මුදල බැංකුවට ගෙවා එහි පිටපතක් නේවාසිකාගාර කාර්යාලයට ලබා දෙනු ලැබේ .

ඔවුන් කිසිවිටකත් සිසුන්ගෙන් සෘජුවම මුදල් ලබා ගැනීමක් කර නොමැත. එමෙන්ම ගෙවීම්ද වෙක් පත් මගින් පමණක් කර ඇති අතර එහිදී ඒ සඳහා නේවාසිකාගාර ශාලාධිපති හා තවත් මූල්‍ය නිලධාරියෙකු එම චෙක්පත් සඳහා අත්සන් කර ඇත. එහිදී මෙම සියළුම ගෙවීම් සඳහා ක්‍රමවත් ගෙවීම් වවුචරයක් හා ගෙවීම් මුදල් පොතක් නඩත්තු කර ඇත. ශිෂ්‍යයන්ගෙන් ලබා ගන්නා ලද සියළුම මුදල් සඳහාද ඔවුන් සතුව ලේඛන පවත්වා ගෙන ගොස් ඇත. එමෙන්ම සෑම මාසයක් අවසානයේදීම ඔවුන් විසින් බැංකු සැසදුම් ප්‍රකාශන සකස් කිරීමක්ද කර ඇත.
ගිණුම් වර්ෂය අවසානයේදී මෙම නේවාසිකාගාර ගිණුම් සම්බන්ධ ආදායම් , වියදම් , වත්කම් හා වගකීම් සම්බන්ධ කොට එහි අවසාන ගිණුමක් සකස් කර ඒ සඳහා ලේඛකාධිකාරවරයාගේ හා උපකුලපතිතුමාගේ අනුමැතිය ලබා ගනු ලැබේ.

වර්ෂය අවසානයේදී මෙම නේවාසිකාගාර ගිණුම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ගිණුම සමග ඒකාබද්ධ කොට වාර්ෂික අවසාන ගිණුම් පිළියෙල කරනු ලබයි.

මෙම ගිණුම ආරම්භයේදී, එහි ආදායම් ක්‍රියාවලිය , ගෙවීම් ක්‍රියාවලිය හා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන ක්‍රියාවලිය නිසි ආකාරයට නිර්ණය කොට ඇති බැවින් හා ඒවා ගණන් දීමේ නිළධාරියාගේ අධීක්ෂණයට වාර්ෂිකව ලක් වන බැවින් ඔබගේ නිරීක්ෂණය හා එකග නොවන බව දන්වමි.

(ii)

2018 වර්ෂයේදී නඩත්තු අංශයේ උපගබඩාව සතු තොගය සත්‍යාපනය කිරීමට හා වර්ෂාවසාන තොගයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඈ)

මෙම රු. 3,871,682ක මුදල වැය කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික කළමනාකරණ සැලැස්ම සකස් කිරීම වෙනුවෙන් පැවති වැඩමුළුවක් සඳහා ය. ආයතනයක උපායමාර්ගික කලමණාකරණ සැලස්ම යනු එම ආයතනයේ අනාගත දිශානතිය තීරණය කරනු ලබන ප්‍රධානම කලමණාකරණ මෙවලම වේ. එබැවින් ඒ සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දිය යුතුව තිබිණි. එම වැඩමළුව විශ්වවිද්‍යාලය තුල පැවැත්වූයේ නම් ඒ සඳහා සහභාගි වන්නන් ඔවුන්ගේ දෛනික කටයුතු වලට අවධානය යොමු කරමින් එම වැඩමුළුවෙන් විටින් විට බැහැර වනු ඇත. එය වැඩමුළුවේ සාර්ථකත්වයට අයහපත් බලපෑමක් කරන අතර එය ප්‍රශස්ත උපායමාර්ගික කලමණාකරණ සැලැස්මක් නිර්මාණය කර ගැනීමට බාධාවක් වනු ඇත. එබැවින් මේ කටයුත්ත සඳහා විශ්වවිද්‍යාලයෙන් බැහැර හෝටලයක් තෝරා ගන්නා ලදි.

එමෙන්ම විගණන විමසුමේ සඳහන් රු.3,871,682 න් රු, 3,572,620 ක් දරා ඇත්තේ රාජ්‍ය ප්‍රතිපාදන මගින් නොවන අතර එය විශ්වවිද්‍යාලය විසින් උත්පාදනය කරන ලද ආදායම් මගින් දරා ඇති බව දන්වමි.

(ඈ) (i)

විශ්වවිද්‍යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන අතර පීඨ,දෙපාර්තමේන්තු හා අංශ විසින් ඊට අදළ වත්කම් සම්බන්ධයෙන් වෙනම වත්කම් ලේඛන පවත්වාගෙන යනු ලබයි.

2013.12.31 දින දක්වා අත්පත් කරගත් සියළුම වත්කම් ප්‍රත්‍යගණනය කර ඇති අතර එම ප්‍රත්‍යගණන අගයන් හා 2014,2015,2016 යන වර්ෂයන්වල මිලදී ගත් වත්කම්වල අගයන් ඇතුළත් කරමින් නව වත්කම් ලේඛනයක් සකස් කර ඇත. ඊට 2017 වර්ෂයේ මිලදී ගත් වත්කම් ද ඇතුළත් කර පරිපූර්ණ වත්කම් ලේඛනයක් 2018 වර්ෂයේදී සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii)

සියළුම පීඨ, දෙපාර්තමේන්තු හා අංශ විසින් වත්කම් ලේඛන නඩත්තු කරන අතර එහිදී එම වත්කම් ලේඛන තුල මෙම පරිගණක උපාංග හා මෘදුකාංග මිලදී ගැනීම, භාරකාරත්වය, අපහරණය සම්බන්ධව තොරතුරු යාවත්කාලීන කරනු ලැබේ.

(ඉ) 2018 අප්‍රේල් මාසයේ සිට මෙම ඉන්ධන දීමනාව ඔවුන්ගේ මාසික වැටුපට එකතු කරනු ලැබේ.

## 3.2 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

### SCFR/424/13-Filed By MTF Sahar(122359R)

මෙම නඩුව 2017.05.09 වන දින කරුණු තහවුරු කිරීම සඳහා කැඳවා ඇති අතර එදිනට පසු නැවත කැඳවීම් දිනයක් නීතිපති දෙපාර්තමේන්තුව මගින් මොරටුව විශ්වවිද්‍යාලය වෙත ලබා දී නැත. එබැවින් 2018.08.06 දිනැති ලිපිය මගින් එකී නඩුවේ ඉදිරි දිනය හා තත්ත්වය අප විසින් විමසා සිටින ලද නමුත් මෙතෙක් ඒ සඳහා පිළිතුරක් ලැබී නැත.

### මානව හිමිකම් කොමිෂන් සභාව 105017
### filled by MTF Sahar (122359R)

මෙම නඩුව හා සම්බන්ධිත ශ්‍රේෂ්ඨාධිකරණයේ පවතින නඩු අංක 424/13 දරණ නඩුව තීරණය කරන තුරු මෙම නඩුව බහා තබා ඇත.

### CSo –LT-Case Mr H Madanayaka

මෙම නඩුවේ කම්කරු විනිශ්චය සභාවේ තීන්දුවට එරෙහිව එච් මදනායක විසින් ඇපෑලක් ගොණුකර ඇති අතර එය දැනටමත් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරි නඩු කටයුතු කරගෙන යාම සඳහා 2018.08.15 දින දරණ ලිපියෙන් අදාල ලිපි ලේඛන නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දී ඇත.

### WP/HCCA/MT/09/2016(LA)
### Filed By MTF Sahar (122359R)

**මෙම නඩුව වානිජ මහා අධිකරණයේ පැවරිය යුතු නඩුවක් වන බවට 2018 ජූලි 23 වන දින තීන්දුවක් ලබා දෙන ලදී.ඒ අනුව මෙ නඩුවේ නඩු කටයුතු කරගෙන යන නීතිඥ සජීවනී විජේසිංහ මහත්මිය විසින් නඩුවේ තීන්දුව දැනටමත් ලබාගෙන ඇති අතර එය Institute of Technology of University of Moratuwa,Diyagama හි අධ්‍යක්ෂකතුමිය වන ප්‍රියංගනී සමරසේකර මහත්මිය වෙත යැවීමට කටයුතු කරන ලද බවට දන්වා සිටින ලදී.**

## 4 පොදු සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

### 4.1.1. ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය

(අ) රටක සමාජ ආර්ථික ප්‍රගමනය සඳහා විශ්වවිද්‍යාලයන් මගින් කරනු ලබන පර්යේෂණයන් ඉහළ දායකත්වයක් ලබා දෙනු ඇත. එහිදී විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනා සියල්ලක්ම සඳහා ඉඩ ප්‍රස්ථාවක් ලබා දීම වෙනුවෙන් වර්ෂය සඳහා වෙන් කරන ලද මුදල ශුක්මවා මෙසේ වියදම් කර ඇත.

එහිදී වෙනත් ප්‍රාග්ධන වැය ශීර්ෂයන්ගෙන් ඉතිරි වන ලද මුදල් මෙයේ පර්යේෂණ වියදම් සඳහා යොදවන ලදී.

(ආ) වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබුන පර්යේෂණ ප්‍රදාන සඳහා ඉතා ඉක්මනින් වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු සිදු කර ඇති අතර නියමිත කාලයට නිම නොකළ පර්යේෂණ ප්‍රදාන නීත්‍යනුකූලව අවසන් කිරීමට දැනුම් දී ඇත.

(ඇ) වෙබෝමෙට්‍රික් ලෝක ශ්‍රේණිගත කිරීමේ පටිපාටිය සකස් වී ඇත්තේ පැවැත්ම(Presence) දෘෂ්‍යතාව (Visibility/impact) විවෘතභාවය හා විශිෂ්ඨත්වය (Excellence) යන ප්‍රධාන දර්ශක හතර පදනම් කරගෙනය. මෙහිදී,

1. පැවැත්ම නැමැති දර්ශකයෙන් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෙබ් වසමේ (main web domain) ප්‍රමාණය පිළිබඳවත්
2. දෘෂ්‍යතාවය නැමැති දර්ශකයෙන් ,විශ්වවිද්‍යාලයේ වෙබ් පිටු සඳහා පසු පුරුක් (backlinks) උත්පාදනය කරන බාහිර ජාල(external networks) සංඛ්‍යාව පිළිබඳවත්
3. විවෘතභාවය නැමැති දර්ශකයෙන් ඉහළම කතුවරුන්ට අයත් ගූගල් විද්වත් උපහරණ/ උපුටා දැක්වීම්(Google scholar citations) සංඛ්‍යාව .පිළිබඳවත් ,
4. විශිෂ්ටත්වය නැමැති දර්ශකයෙන් ,විෂය පථ 26 ක් යටතේ වැඩි වශයෙන් උපුටා දක්වන ලද පර්යේෂණ ප්‍රකාශන අතුරින් ඉහලම 10% ට අයත් පර්යේෂණ ප්‍රකාශන සංඛ්‍යාව පිළිබඳවත් මිනුම් ලබා ගනු ලැබේ.

මින් පැවැත්ම හා විශිෂ්ටත්වය යන දර්ශක 2 ,විශ්වවිද්‍යාලය තුළ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් මගින් පාලනය කල හැකි අතර ,දෘෂ්‍යතාව හා විවෘතභාවය යන දර්ශක 2 විශ්වවිද්‍යාලය තුළ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් මගින් පාලනය කල නොහැක. තවද ඉහත කී එක් එක් දර්ශකය වෙන වෙනම ශ්‍රේණිගත කිරීම් වෙබෝමෙට්‍රික් විසින් සිදුකරනු ලබන අතර , ලෝක ශ්‍රේණිගත කිරීමේදී ලබා දෙන මුලු ලකුණු ප්‍රමාණයෙන් 5% පමණ ප්‍රතිශතයක් පැවැත්ම (Presence) සඳහා ද, 50% දෘෂ්‍යතාව (Visibility/impact) සඳහාද 10% විවෘතභාවය (Openness) සඳහාද 35% ක් විශිෂ්ටත්වය (Excellence) සඳහාද ලබා දෙනු ලැබේ.

පසුගිය වසර කීපය තුළ විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබූ මූලෝපාය ක්‍රියාමාර්ග හේතුවෙන් විශිෂ්ටත්වය දර්ශකයේ ශ්‍රේණිගත කිරීමට අනුව මොරටුව විශ්වවිද්‍යාලය 2017 ජනවාරි සහ ජූලි මස පිළිවෙලින් 3459 සහ 3394 යන ස්ථානවල ශ්‍රේණිගතව ඇති අතර සමස්තයක් ලෙස ගත් කල පර්යේෂණ ප්‍රකාශන පදනම් කරගනිමින් සකස් කරන ලද විශිෂ්ටත්වය දර්ශකයේ ශ්‍රේණිගත කිරීමට අනුව මොරටුව විශ්වවිද්‍යාලය ප්‍රගතියක් අත් කර ගෙන ඇති බව සැලකිය හැක. තවද, පැවැත්ම දර්ශකයේ ශ්‍රේණිගත කිරීමට අනුව මොරටුව විශ්වවිද්‍යාලය 2017 ජනවාරි සහ ජූලි මස පිළිවෙලින් 1496 සහ 959 යන ස්ථානවල ශ්‍රේණිගතව ඇති අතර සමස්තයක් ලෙස ගත් කල ප්‍රධාන වෙබ් වසමේ ප්‍රමාණය පදනම් කර ගනිමින් සකස් කරන ලද පැවැත්ම දර්ශකයේ ශ්‍රේණිගත කිරීමේදී මොරටුව විශ්වවිද්‍යාලය ඉහළ ප්‍රගතියක් අත්කරගෙන ඇති බව සැලකිය හැක.

(ඈ) 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලස්මට එසේ වුවත් විදේශීය සිසුන් පර්යේෂණ ප්‍රදානයන් වල නිරත වී නැත.

(ඉ) පර්යේෂණ වල නිරතවන්නන් සවිබල ගැන්වීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඊ) මෙම ප්‍රමාදය මග හරවා ගැනීමේ අරමුණින් මාසිකව පවත්වන පාලක සභාවේදී න්‍යාය පත්‍රයේ වෙනත් කරුණු යටතේ අදල පීඨ නියෝජනය කරන සාමාජිකත්වයේ අවධානයට යොමු කරනු ලබන බවත් ,ඒ අනුව අදාල පීඨවල මාසික පීඨ රැස්වීමේදී අවධානයට ලක් කර ඇති බවත් දන්වා සිටිමි. මීට අමතරව අදාල අංශවල මාසික රැස්වීම් වලදී මෙම කරුණු සම්බන්ධව විශේෂ අවධානය යොමු කිරීමට උපදෙස් දී ඒ අනුව කටයුතු කෙරේ.ඉහත ක්‍රමවේද /උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමෙන් මෙම ප්‍රමාදය ඉදිරියේදී මග හරවා ගත හැකි බව දන්වා සිටිමි.

(උ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කර එවන සියලු සිසුන් බඳවා ගෙන ඇත.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

(අ) මෙම නඩුව 2014.01.27 වන දින ඉල්ලා අස් කර ගෙන ඇති අතර පාලක සභා රැස්වීමෙන් සටහන් අංක 396.03.13 ට අනුව පෙරේරා මහතාගෙන් මොරටුව විශ්වවිද්‍යාලයට අය විය යුතු මුදල වන රුපියල් 703,311.12 ක මුදල අය කර ගැනීම අත්හැර දැමීම සඳහා ශ්‍රී ලංකා මුදල් රෙගුලාසි හි වගන්ති අංක 109(1) අනුව ඉල්ලා සිටින ලදී. ඒ 2014.03.05 වන දින පැවති 397 පාලක සභා රැස්වීමේදී 395/26 සටහන අනුව එකී මුදල අය කර ගැනීම අත්හැර දැමීම සඳහා පාලක සභාව විසින් අනුමැතිය ලබා දී ඇත.

(ආ) උඩුමුල්ල යන අයගේ අදාල ලිපිගොනුව පරීක්ෂා කිරීමේදී දක්වා ඇති වැරදි සහ දෝෂයන් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) මෙම වටිනාකම පොත්වලින් ඉවත් කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියට යවා ඇත.

### 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

2017.12.31 දිනට කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

| තනතුර | අනුමත | තථ්‍ය | තනතුරේ ස්වභාවය ස්ථිර/තාවකාලික/කොන්ත්‍රාත් | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| මහාචාර්ය | 576 | 345 | | | |
| කථිකාචාර්ය | | | | | |
| ආධුනික කථිකාචාර්ය | | | | | |
| අධ්‍යයන සහයක | 68 | 30 | | | |
| පරිපාලන සහ වෙනත් | 50 | 34 | කොන්ත්‍රාත්:4 | | |
| වෛද්‍ය නිලධාරීන් | 4 | 2 | කොන්ත්‍රාත් - 2 | | |
| අනෙකුත් අනධ්‍යයන කාර්යය මණ්ඩලය | 881 | 667 | | | |
| තාවකාලික | 256 | 103 | | | |
| කොන්ත්‍රාත් | | | අනධ්‍යයන - 71<br>අධ්‍යයන - 71<br>අධ්‍යයන සහයක - 9 | | |
| | | | | | |

ඒ අනුව කාර්ය මණ්ඩල පරිපාලනය යන කොටසෙහි තත්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලය 514 ක් හා පුරප්පාඩු 354 ක් ලෙස නිවැරදි විය යුතුය.

## 5. තිරසාර සංවර්ධනය

එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රයට සහ 2017.10.03 දිනැති 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතට අනුකූලව අප විශ්වවිද්‍යාලයේ විෂය පථයට ගැලපෙන දැනට ක්‍රියාත්මක වන කාර්යයන් පිළිබඳව වාර්තාවක් 2018.07.06 දින විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

තවද ඉදිරියේදී තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක කරා ලගා වීම සඳහා අප විශ්වවිද්‍යාලය මගින් ගන්නා ක්‍රියාමාර්ග, ඉලක්ක කරා ලගා වීම මැන බැලීම සඳහා දර්ශක හදුනා ගැනීම වැනි කාර්යන් සඳහා වැඩපිළිවෙලක් සකස්කරගෙන යනු ලැබේ.මේ සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙලෙහි (UNDP) උපදේශකත්වය ලබා ගැනීම සඳහා මූලික සාකච්ඡා ආරම්භ කර ඇත. UNDP සංවිධානය මගින් විශේෂඥ සහය ඇතිව අධ්‍යයන, කළමණාකරණ සහ අනධ්‍යයන කාර්යමණ්ඩලයේ තෝරා ගත් නිලධාරීන් සඳහා පුහුණු වැඩමුලු සංවිධානය කිරීමට අදහස් කර ඇත.ඉන් අනතුරුව ඉහත සඳහන් කළ විශ්වවිද්‍යාලයේ විෂයපථයට අදාල තිරසර සංවර්ධන ඉලක්ක සහ දර්ශක හදුනා ගැනීමට කමිටුවක් පත් කිරීමට අදහස් කර ඇත.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

(අ) (i) මෙම ගොඩනැගිල්ල සඳහා මූලික සැලසුම් සහ ඇස්තමේන්තු සකස් කරන ලද්දේ සිව් මහල් ගොඩනැගිල්ලක් සඳහාය. මෙහි ඇස්තමේන්තු ගත මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර 3950 කි. මහල් හතරකින් සමන්විත ගොඩනැගිල්ලක් සඳහා ප්‍රමාණතා පත්‍ර (BOQ) සකස් කරන ලද අතර ලංසු කැඳවන ලද්දේ ද සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහාය. කෙසේ වෙතත් කැබිනට් අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යංශය සමග ලිපි හුවමාරු කර ගැනීමේදී සිදු වූ අත්වැරදීමක් හේතුවෙන් කැබිනට් පත්‍රිකාවේ එය පස් මහල් ගොඩනැගිල්ලක් යනුවෙන් සඳහන් කර ඇත. නමුත්, එය අන් කිසිවක් නොව පැහැදිලි වශයෙන්ම මුද්‍රණ දෝෂයකි. එවැනි වෙනත් පරස්පර ස්ථාන කිසිවක් කැබිනට් පත්‍රිකාවේ හෝ වෙනත් කිසිදු ලේඛනයක දක්නට නැත. ව්‍යාපෘතියේ ප්‍රධානතම අංගය වන බිම් ප්‍රමාණය වර්ග මීටර 3950 ක් වශයෙන් කැබිනට් අනුමැතියෙහිද නිවැරදිව දක්වා ඇති අතර, මහල් සංඛ්‍යාව 5 ක් වශයෙන් දක්වා ඇත. කෙසේ වෙතත්, එම අදියරේදී මූලික සැලසුම්, ප්‍රමාණතා පත්‍ර (BOQ) හා ලංසු ලේඛන සම්පූර්ණ කරන ලද්දේ සිව් මහල් ගොඩනැගිල්ලක් සඳහාය. එබැවින් ඉහත මුද්‍රණ දෝෂ හේතුවෙන් විශ්වවිද්‍යාලයට, රජයට හෝ වෙනත් කිසිදු පාර්ශවයකට කිසිදු අලාභයක් සිදුව නැත.පස් මහල් ගොඩනැගිල්ලක් වෙනුවට සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හේතුවෙන් කිසිදු අමතර පිරිවැයක් දැරීමට සිදුව නොමැති බව පහත සඳහන් පැහැදිලි කිරීම මගින් සනාථ වේ.

කැබිනට් අනුමැතිය ප්‍රකාරව පස් මහල් ගොඩනැගිල්ලක් ඉදි කරනු ලැබුවේ නම්, ඒ සඳහා වන සමස්ත පිරිවැය මෙම බිම් ප්‍රමාණය සඳහා අනුමත වියදමට වඩා ඉතා වැඩි අගයක් ගත යුතුය. (1. පස්වන මහලේ ඕනෑම අයිතමයක් ඉදි කිරීම සඳහා වන වියදම රට පහල මහල් වල ඉදිකිරීම් පිරිවැයට වඩා වැඩි විය යුතුය. 2. සිව් මහල් ගොඩනැගිල්ලකට වඩා පස් මහල් ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී අඩිතාලම සඳහා වැය වන පිරිවැය ඉහල අගයක් ගත යුතුය. 3. පස්වන මහල සඳහා පඩි පෙලවල් 2 සඳහා වන පිරිවැය එකතු විය යුතුය. 4. පස්වන මහල සඳහා විදුලි සෝපාන රදවනයක් (Lift Well) සඳහා වන පිරිවැය එකතු විය යුතුය. 5. පස්වන මහලෙ slab එක සඳහා වන පිරිවැය යනාදිය එකතු විය යුතුය.)

එබැවින්, මෙම කැබිනට් පත්‍රිකාවේ වූ මුද්‍රණ දෝෂය හේතුවෙන් විශ්වවිද්‍යාලයට කිසිදු අමතර පිරිවැය දැරීමට සිදුවී නොමැති අතර,මෙම ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණයෙහි අඩු වීමක් හෝ එමගින් සමස්ත විශ්වවිද්‍යාලයීය අවශ්‍යතාවයන්ට හානියක් සිදු වී නොමැත. ඉදිරියේදී ආරම්භ කරන ව්‍යාපෘති වලට අදාල අනුමැතීන් ලබා ගැනීමේදී ඉදිරිපත් කරනු ලබන ලියවිලි වල ඇතිවිය හැකි දෝෂ වළක්වා ගැනීම සඳහා ඍජු අධීක්ෂණයක් සිදු කොට එම ලියවිලි යකස් කිරීමටත් අවශ්‍ය අනුමැතීන් ලබා දීම හා ලබා ගැනීම සිදු කිරීමටත් අදල අංශ නිසි පරිදි දැනුවත් කර ඇත.

(ii) කොන්ත්‍රාත් විචලතා පත්‍ර 16 යටතේ රු. 44,317,130/- කට අදලව ගෙවීම් සිදු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වී ඇත්තේ කොන්ත්‍රාත්තුවට අදල කටයුතු කල උපදේශන ආයතනයෙන් බවත් මේ වන විට එම සියලුම විචලතා පත්‍රවලට අදල නිසි අනුමැතිය ලබා ගෙන ඇත.

තවද ප්‍රමාණතා පත්‍රයේ (BOQ) අයිතමයන්ගෙන් පරිබාහිරව සිදු කල සම්පූර්ණ වැඩ ප්‍රමාණය කොන්ත්‍රාත් වටිනාකමින් 22% උවද ප්‍රමාණතා පත්‍රයේ සඳහන් සමහර අයිතම ඉදිකිරීම් සිදු කරනු ලැබූ අවස්ථාවේ ඇති වූ අවශ්‍යතා මත වෙනස් කරමින් එම පිරිවැය රාමුව තුලම ඉදි කිරීම් කටයුතු සිදුකරනු ලැබීය.

ඒ අනුව ප්‍රමාණතා පත්‍රයේ (BOQ) සමහර අයිතම සඳහා වෙන් කර ඇති මුදල් ඉතිරිව තිබූ අතර එය යොදාගෙන විචල්‍යතා (Variance) යටතේ සිදුකරනු ලැබූ වෙනස්කම් වලට අදල වටිනාකම හා අමතර වැඩ (Extra Works) යන දෙකෙහිම වටිනාකම 22% ක් ලෙස සඳහන් වුවද, ප්‍රමාණතා පත්‍රයට අදලව සකස් කරන ලද ලේඛනයේ , අමතර වැඩ ලෙස(Additions) රු.59,596,148.70 ඇති අතර එම වටිනාකමින් රු.47,616,537.75 ප්‍රමාණතා පත්‍රයේ ඉතිරිය තුලින් (Omissions) ආවරණය කර ගෙන ඇත.ඒ අනුව ඇත්ත වශයෙන්ම ප්‍රමාණතා පත්‍රයේ සඳහන් නොවන අයිතම වශයෙන් සිදු කර ඇති ඉදිකිරීම් වල වටිනාකම රු.11,979,610.99 ක් වන අතර එය ව්‍යාපෘති වටිනාකමින් 6.03% බවත් ඒ අනුව ව්‍යාපෘතියේ අවස්ථානුකූල මුදල් වෙන් කිරීම යටතේ ඇති (Contingences) 10% ප්‍රතිශතය ඉක්මවා නොමැති බව දන්වා සිටිමි.

(III) ඉහසුමේ සඳහන් කරුණු නිවැරදි අතර මෙම ඉදිකිරීමට අදල ඉදිකිරීම් අඩුපාඩු (Defects) නියමිත කාල සීමාව තුල සිදු නොවීමට මූලිකම හේතුව වූයේ උපදේශන සමාගම විසින් නිසි ලෙස එම කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය නොකිරීම බව අපගේ විශ්වාසයයි.කෙසේ වෙතත් මෙම තත්ත්වය වළක්වා ගෙන එම අඩුපාඩු ඉක්මනින් නිම කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුවේ විශේෂ රැස්වීමක් කැඳවා පහත සඳහන් තීරණ ගෙන ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

1. දැනට හඳුනා ගෙන ඇති අඩුපාඩු වලට අදළව ඇස්තමේන්තුනක් අදළ උපදේශන ආයතනයෙන් සකස් කර එය විශ්වවිද්‍යාලයට ඉදිරිපත් කිරීම.

2. එම ඇස්තමේන්තුවට නිස් අනුමැතිය විශ්වවිද්‍යාලයෙන් ලද පසු අදළ ඉදිකිරීම් අඩුපාඩු නිවැරදි කිරීම.

3. එම නිවැරදි කිරීම් නිසි පරිදි විශ්වවිද්‍යාලය විසින් පරීක්ෂා කර සෑහීමකට පත්වේ නම් පමණක් අදල කොන්ත්‍රාත් ගිණුමේ රඳවා ගැනීම් නිදහස් කිරීමට ඉහත ආකාරයට,

4. විශ්වවිද්‍යාලයේ මෙම තීරණය මේ වන විට අදළ කොන්ත්‍රාත් සමාගමට හා උපදේශන සමාගමට විශ්වවිද්‍යාලය මගින් ලිඛිතව දන්වා ඇත.

(ආ) මෙම ව්‍යාපෘතියට අදාළව ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනාවට අදාළව ඇස්තමේන්තුවේ උපදේශන සේවා ලබා ගැනීම සඳහා රු.12,955,393.34 මුදලක් වෙන් කර ඇති අතර එම ඇස්තමේන්තුව කැබිනට් මණ්ඩලය මගින් අනුමත කර ඇති බව 2012.04.25 දිනැති අධ්‍යක්ෂ යටිතල පහසුකම් සංවර්ධන උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම විශ්වවිද්‍යාලයට දන්වා ඇත. මෙම උපදේශන සමාගමට ගෙවීම් සිදු කොට ඇත්තේ ඉහත අනුමත ඇස්තමේන්තුවෙනි. තවද උපදේශන සමාගමට ගෙවා ඇත්තේ වෙන්කර ඇති ඉහත මුදලින් 35%ප්‍රමාණයක් පමණි. මෙම විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය තම ප්‍රධාන රාජකාරි වන අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල නියැලෙන අතරතුර ස්වේච්ඡාවෙන් විශ්වවිද්‍යාලයේ මතු දියුණුව වෙනුවෙන් කිසියම් උපදේශන සේවාවන් සපයනවා හැරෙන්නට පූර්ණකාලීනව විශ්වවිද්‍යාලයේ කිසියම් ඉදිකිරීම් ව්‍යාපෘතියක් සම්බන්ධව අඛණ්ඩව උපදෙස් ලබා දෙමින් කටයුතු කිරීමක් මේ වන තෙක් සිදු වී නොමැත.

තවද,වාස්තු විද්‍යා ගොඩනැගිලි ඉදිකිරීම් අදියර කටයුතු සම්බන්ධව උපදේශන සේවා ලබා ගෙන ඇත්තේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් වන අතර පෞද්ගලික ආයතනයකින් නොවන බවද සඳහන් කිරීමට කැමැත්තෙමි.

(ඇ) ඉහත ව්‍යාපෘතියට අදාලව බිල්පත් ගෙවීම එම ව්‍යාපෘතියේ උපදේශන සමාගම වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව හරහා සිදුකිරීමේදී ප්‍රමාදයක් සිදු වී ඇති බව දන්වා සිටිමි.කෙසේ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 5.4.4() ට අනුව ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරුට ගෙවීම් සිදු කිරීමේදී එය 90% සම්පූර්ණ වන විට සියලුම අත්තිකාරම් ආවරණය කර ගෙන ඇති බව දන්වමි.

තවද ලබා දී ඇති එම අත්තිකාරම් මුදල රු.16,995,388.78 ක් නොව රු.15,174,454.27 ක් බවත් එම වටිනාකම් දෙක අතර වෙනස වන රු.1,820,934.51 මුදල එකතු කල වටිනාකම මත වන බදු මුදල බවත් අත්තිකාරම් මුදල ආවරණය කර ගැනීමේදී බදු මුදල් ආවරණය කරගනු නොලබන බවත් දන්වා සිටිමි.

තවද අත්තිකාරම් බැදුම්කරය එම මුළු මුදලම ආවරණය කර ගත් 2015.08.06 වන දින ඉක්මවා යන දිනයක් වන 2015.09.25 දක්වා ලබා ගෙන තිබූ බවද වැඩි දුරටත් දන්වා සිටිමි.

(ඈ) වාස්තු විද්‍යා ගොඩනැගිලි ඉදිකිරීම් අදියර(III) ව්‍යාපෘතියට අදළ ගොඩනැගිල්ල භෞතික වශයෙන් මහල් පහකින් යුක්තව ඉදිකර ඇති අතර ඊට අදල සියලුම අනුමැතීන් ලබා ගෙන ඇත්තේද ඒ ආකාරයටමය.

කෙසේ නමුත්, එම ඉදිකිරීමට අදල තාක්ෂණ කමිටු රැස්වීම් වාර්තා 02 හි අයිතම අංක 01 (03) යටතේ එය සිව් මහල් ගොඩනැගිල්ලක් ලෙස දක්වා ඇත්තේ මුද්‍රණ දෝෂයකිනි.

තවද එම තාක්ෂණ කමිටු 02 වාර්තාව එම ගොඩනැගිල්ල නිමවා ඇති බවට ලබා දී ඇති වාර්තාවක් නොවන බවත් එය ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා අදල තාක්ෂණ කමිටුවේ නිගමන හා නිර්දේශ ඇතුලත් වාර්තාව බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

| | | | |
|---|---|---|---|
| | | | ඒ අනුව ඉහත කී මොරටුව විශ්වවිද්‍යාලය හා කෝඩිජෙන් ඉන්ටනැෂනල් සමාගම සමග ඇති ගිවිසුම සම්බන්ධයෙන් ඒ සඳහා මූලික වී කටයුතු කරන ලද මොරටුව විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිනිය විසින් උපකුලපතිවරයාට දැන්වීමෙන් පසු මෙම ගිවිසුමට එළඹී ඇත.<br><br>(ආ) කෝඩිජෙන් ඉන්ටනැෂනල් සමාගමේ සභාපති මෙන්ම ප්‍රධාන විධායක නිළධාරියාව ඔහුගේ ප්‍රවීණතාව සහ ඔහු විසින් මොරටුව විශ්වවිද්‍යාල පාලනය සම්බන්ධයෙන් හා ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වටිනා දයකත්ව සලකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන සභාව මගින් සලකා බැලීමෙන් පසු මොරටුව විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. කෙසේ වුවද ඉහත කී කෝඩිජෙන් ඉන්ටනැෂනල් සමාගමේ සභාපති මෙන්ම ප්‍රධාන විධායක නිළධාරියා හට පාලක සභාවේ අනුගාමී රැස්වීම් 3 කට නොවැලැක්විය හැකි හේතූන් මත සහභාගී විය නොහැකි වූ බැවින් විශ්වවිද්‍යාල පනතේ 44(5) වගන්තිය යටතේ ඔහුගේ එකී තනතුර අවලංගු කරන ලදී. කෙසේ වුවද මෙම තත්ත්වය එළඹෙන ලද ගිවිසුමට කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවද දන්වා සිටිමු. |
| (ඇ) | 12 | නව ආපනශාලා සංකීර්ණය සඳහා අවශ්‍ය පුටු හා මේස රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියාවලියෙන් බැහැරව කුලී පදනම මත ලබා ගැනීම. | 2017 පෙබරවාරි 01 දින මොරටුව විශ්වවිද්‍යාලයේ පැවති 32 වැනි පාලක සභා සැසිවාරයේදී ගන්නා ලද තීරණය අනුව අදල අයට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම සඳහා අවසරය දී ඇති අතර මූලාධිකාරීව එයේ පැවැත්වීමට අනවශ්‍ය බව දන්වා ඇත. |

## 7. පද්ධති හා පාලනයන්

විගණන වාර්තාවේ දක්වා ඇති අදළ ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානයට යොමු කර ඇති අතර ඒ සම්බන්ධ පද්ධති හා පාලන වැඩිදියුණු කිරීම සඳහා අදළ පියවර ගනිමින් සිටියි.

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා
උපකුලපති

**21.9** **ව්‍යවස්ථාපිත මණ්ඩලවල මූල්‍ය කාර්ය සාධනය - 2017**

**1** ව්‍යවසායේ නම සහ ලිපිනය - මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව

**2** මෙහෙවර - පහත දේ තුළින් දකුණු ආසියාවේ තාක්ෂණික සහ අදාළ ශික්ෂණවල ප්‍රමුඛ දැනුම් ව්‍යවසාය වීම:

- ගෝලීය අභියෝගවලට මුහුණ දීම සඳහා විමසුම් මනස පෝෂණය කරන සහ දැනුම සහ කුසලතා සංවර්ධනය කරන තාක්ෂණික සහ ආශ්‍රිත ශික්ෂණවල ප්‍රතිසංස්කරණාත්මක අධ්‍යාපනය සැපයීමෙන්;
- දැනුම පිළිබඳ සීමා මායිම් ව්‍යාප්ත කිරීමට සහ ජාතික තාක්ෂණික හැකියා ඉහළ නැංවීමට ජාතිකව වැදගත් සහ ඉහළ බලපෑම් සහිත පර්යේෂණ කරගෙන යාමෙන්;
- අන්තර්ජාතිකව ස්ථානගත වූ ශ්‍රී ලාංකික විශ්වවිද්‍යාලයක් ලෙස රජයට, කර්මාන්තයට සහ සමාජයට විශේෂඥ සේවා සැපයීමෙන්; සහ
- ශ්‍රී ලංකාවේ තිරසාර, විද්‍යාත්මක, තාක්ෂණික, සමාජයීය සහ ආර්ථික සංවර්ධනයට දායක වීමෙන්.

**3** ප්‍රධාන ක්‍රියාකාරකම් - ඉංජිනේරු විද්‍යාව, වාස්තු විද්‍යාව, තොරතුරු තාක්ෂණය පිළිබඳ ඉගැන්වීම්, පර්යේෂණ, උපදේශන සහ වෙනත් වෘත්තීය ක්‍රියාකාරකම්, වාස්තුවිද්‍යා, තොරතුරු.

**4** කාර්යසාධන නැඹුරුව

| අනු. අංකය | විස්තරය | ඒකකය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| | **ආදායම සහ වියදම** | | | | | | |
| 1 | රජයේ ප්‍රදාන - පුනරාවර්තන | රුපි'000 | 1,048,903 | 1,280,000 | 1,579,000 | 1,724,000 | 1,950,496 |
| 2 | ස්ව ආදායම- පුනරාවර්තන | රුපි'000 | 34,424 | 31,944 | 25,995 | 50,735 | 54,786 |
| 3 | වෙනත් පුනරාවර්තන වියදම් (මහපොළ සහ ශිෂ්‍යාධාර ආදිය) | රුපි'000 | 11,150 | 11,915 | 45,538 | 84,937 | 91,077 |
| 4 | මුළු ආදායම- පුනරාවර්තන (1+2+3) | රුපි'000 | **1,094,477** | **1,323,859** | **1,650,533** | **1,859,672** | **2,096,359** |
| 5 | මුළු සේවා නියුක්ති පිරිවැය | රුපි'000 | 873,416 | 1,107,032 | 1,328,679 | 1,466,230 | 1,581,907 |
| 6 | වෙනත් පුනරාවර්තන වියදම් (ක්ෂය හැර) | රුපි'000 | 376,413 | 426,263 | 506,352 | 613,618 | 670,014 |
| 7 | අතිරික්තය / හිඟය {4-(5+6)} | රුපි'000 | **(155,352)** | **(209,436)** | **(184,498)** | **(220,176)** | **(155,562)** |
| 8 | රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය ( 2016 වසරේ මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල් ඇතුළුව) | රුපි'000 | 304,690 | 714,000 | 640,000 | 1,353,500 | 745,000 |
| 9 | වෙනත් ප්‍රදාන – ප්‍රාග්ධන වියදම | රුපි'000 | 7,181 | 10,766 | 3,548 | 119,913 | 668,647 |
| 10 | උත්පාදිත අරමුදල – ප්‍රාග්ධන වියදම | රුපි'000 | 23,517 | 15,588 | 14,678 | 34,812 | 8,901 |
| 11 | ප්‍රාග්ධන වියදම - රජයේ ප්‍රදාන | රුපි'000 | 304,690 | 718,573 | 663,466 | 1,363,959 | 780,993 |
| 12 | පිරියැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම්වලින් ලැබීම් | රුපි'000 | 425,648 | 370,228 | 382,955 | 587,443 | 590,905 |
| 13 | පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම් මත වියදම | රුපි'000 | 342,850 | 346,728 | 341,515 | 482,398 | 508,563 |
| | **වත්කම් සහ වගකීම්** | | | | | | |
| 14 | ආයෝජන | රුපි'000 | 331,258 | 341,242 | 349,288 | 359,219 | 481,461 |
| 15 | ජංගම නොවන වත්කම් | රුපි'000 | 2,394,147 | 2,885,034 | 3,259,853 | 4,232,292 | 10,935,243 |
| 16 | ජංගම වත්කම් | රුපි'000 | 262,614 | 230,425 | 243,835 | 341,867 | 292,326 |
| 17 | ජංගම වගකීම් | රුපි'000 | 419,863 | 497,703 | 577,163 | 673,730 | 776,908 |
| 18 | ජංගම නොවන වගකීම් | රුපි'000 | 652,129 | 759,682 | 774,262 | 878,162 | 891,762 |
| 19 | පරිත්‍යාග/විදේශ ආධාර (සමුච්චිත) | රුපි'000 | 1,066,968 | 1,077,734 | 1,081,282 | 1,201,196 | 712,239 |
| 20 | සමුච්චිත අරමුදල | රුපි'000 | 759,122 | 1,034,572 | 1,420,270 | 2,180,290 | 9,328,120 |
| 21 | සේවක සංඛ්‍යාව -අධ්‍යයන | (සංඛ්‍යා) | 508 | 535 | 496 | 422 | 439 |
| 22 | මුළු සේවක සංඛ්‍යාව | (සංඛ්‍යා) | 1,274 | 1,178 | 1,089 | 1,100 | 1,099 |
| 23 | ශිෂ්‍ය සංඛ්‍යාව | (සංඛ්‍යා) | 6,328 | 6,841 | 7,601 | 7,922 | 7,902 |
| | **ප්‍රමුඛ කාර්ය සාධන දර්ශක** | | | | | | |
| i | මුළු ආදායමට ස්ව ආදායම | % | 3.15 | 2.41 | 1.57 | 2.73 | 2.61 |
| ii | සේවකයකුට මුළු සේවා නියුක්ති පිරිවැය | රුපි'000 | 765 | 940 | 1,220 | 1,333 | 1,439 |
| iii | ශිෂ්‍යයෙකුට මුළු සේවා නියුක්ති පිරිවැය | රුපි'000 | 125 | 162 | 175 | 185 | 200 |
| iv | ශිෂ්‍යයකුට/වර්ෂයකට පුනරාවර්තන ප්‍රදාන | රුපි'000 | 157 | 187 | 208 | 218 | 247 |
| v | උපාධි අපේක්ෂයකුට මුළු පිරිවැය | රුපි'000 | 692 | 734 | 750 | 769 | 859 |
| vi | සේවා නියුක්ති හැකියාව (ප්‍රතිඵල ලැබී මාස 3ක් ඇතුළත) | % | සංඛ්‍යාලේඛන නිලධාරි | | | | |
| vii | සේවකයකුට ශිෂ්‍යයන් | (සංඛ්‍යා) | 5:01 | 6:01 | 07:01 | 07:01 | 07:01 |
| viii | අධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයකුට ශිෂ්‍යයන් (සත්‍ය) | (සංඛ්‍යා) | 12:01 | 12:01 | 15:01 | 19:01 | 18:01 |
| ix | වාහනයකට ශිෂ්‍යයන් | (සංඛ්‍යා) | 198:01 | 180:01 | 185:01 | 180:01 | 202:01 |



සාමාන්‍ය පාලන අංශය,මොරටුව විශ්වවිද්‍යාලය.